යෝජිත
ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව

(පළමු කෙටුම් පත)

Reference No: SLSSC/D1/20260708

සම්පාදනය:

ධර්මය, විනය සහ මූලික ප්‍රජාතාන්ත්‍රික මූලධර්ම සහ නීතියේ ආධිපත්‍ය මත පදනම්ව **ශාස්ත්‍රපති වටගොඩ මග්ගවිහාරී ස්ථවිරයන්** විසින් සම්පාදිත ය.

සැලකිය යුතු කරුණක්:

මෙය ශ්‍රී ලංකාව තුළ එක්සත් සංඝ සංස්ථාවක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා යෝජිත උත්තරීතර ව්‍යවස්ථා කෙටුම්පතකි.

ධර්මවිනයධර ස්ථවිරයන් වහන්සේලාගේ, ගිහි විද්වතුන්ගේ, නීති විශාරදයන්ගේ සහ බෞද්ධ ගිහි දායකයන්ගේ අදහස්, විවේචන සහ යෝජනා අනුව මෙම කෙටුම්පත තවදුරටත් සංශෝධනය කර පරිපූර්ණ කළ යුතු ය.

අරමුණ:

මෙම කෙටුම්පතේ අරමුණ වන්නේ කිසිදු නිකායකට හෝ පාර්ශ්වයකට අගතියක් හෝ විශේෂ වරප්‍රසාදයක් ඇති කිරීම නොව, ධර්මවිනයට අනුකූලව ශ්‍රී ලංකාව තුළ සංඝ සාමග්‍රිය, සංඝ සංස්ථාවේ විනයානුකූල පාලනය සහ ධර්මවිනයේ උත්තරීතර භාවය සහ බුද්ධ ශාසනයේ චිරස්ථිතිය ප්‍රවර්ධනය කිරීම ය.

මෙම කෙටුම්පතෙහි සියලු විධිවිධාන එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ මූලික දෘෂ්ටියෙන් අර්ථකථනය කළ යුතු ය.

පටුන

ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව....................1

පළමු පරිච්ඡේදය: බුද්ධ ශාසනය, සංඝ සංස්ථාව, භික්ෂුව සහ සංඝයාගේ ශාසන භාරකාරීත්වය....................3

දෙවෙනි පරිච්ඡේදය: මූලික විනය අයිතිවාසිකම්....................9

තුන්වෙනි පරිච්ඡේදය: භික්ෂූත්වය....................13

සිව්වෙනි පරිච්ඡේදය: භාෂාව, බෞද්ධ කොඩිය, ධර්ම චක්‍රය සහ ශාසන දිනය....................16

පස්වෙනි පරිච්ඡේදය: ශාසනික කටයුතු මෙහෙයවීමේ මූලධර්ම සහ භික්ෂූන්ගේ මූලික යුතුකම්....................18

හයවෙනි පරිච්ඡේදය: උත්තරීතර සංඝ ව්‍යවස්ථා මූලධර්ම....................22

හත්වෙනි පරිච්ඡේදය: ශ්‍රී ලංකා උත්තරීතර සංඝ සභාව....................25

අටවෙනි පරිච්ඡේදය: උත්තරීතර සංඝ සභාවේ කමිටු සහ කාරක සභා....................34

නවවෙනි පරිච්ඡේදය: උත්තරීතර සංඝ සභාවේ සභාවාර....................42

දසවෙනි පරිච්ඡේදය: සංඝභාර නිත්‍යාරක සභාව....................44

එකළොස්වෙනි පරිච්ඡේදය: සංඝාධිකරණ සහ සංඝාධිකරණ බලය....................65

දොළොස්වෙනි පරිච්ඡේදය: සංඝාධිකරණයේ ස්වාධීනත්වය....................73

දහතුන්වෙනි පරිච්ඡේදය: සාමණේරවරු....................80

දාහතරවෙනි පරිච්ඡේදය: සිල්මාතාවරු....................84

පසළොස්වෙනි පරිච්ඡේදය: සාංඝික දේපළ සහ විහාරස්ථාන....................88

දහසයවෙනි පරිච්ඡේදය: රජය සමඟ සම්බන්ධීකරණය....................89

දාහත්වෙනි පරිච්ඡේදය: ගිහි බෞද්ධයා, බෞද්ධකම සහ ගිහි බෞද්ධයාගේ යුතුකම්....90

දහඅටවෙනි පරිච්ඡේදය: ශාසන සංරක්ෂණ දායක සභාව සහ ශාසන සංවර්ධන අරමුදල94

දහනවවෙනි පරිච්ඡේදය: ව්‍යවස්ථා සංශෝධන....................96

විසිවෙනි පරිච්ඡේදය: විවිධ විධිවිධාන....................97

විසිඑක්වෙනි පරිච්ඡේදය: ව්‍යවස්ථාව බලාත්මක වීම....................98

පළමු උපලේඛනය....................99

දෙවෙනි උපලේඛනය....................100

තුන්වෙනි උපලේඛනය....................101

ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව

ශ්‍රී ලංකාවේ සංඝ සංස්ථාව නියෝජනය කරන භික්ෂූන් වහන්සේලා වන අපි, ශ්‍රී සුගත තථාගත සම්‍යක් සම්බුද්ධ ගෞතම සර්වඥයන් වහන්සේ විසින් පිහිටුවා වදාළ සංඝ සංස්ථාවේ සාමග්‍රිය ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීම පිණිස ද, ත්‍රිවිධ සද්ධර්මයේ චිරස්ථිතිය පිණිස ද, චතුර්විධ විනයට අනුග්‍රහ කිරීම පිණිස ද, එතුළින් ශ්‍රී ලංකාව තුළ මෙන් ම දේශ දේශාන්තරවල ද ශ්‍රී සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය අපේක්ෂා කරමින්, බොහෝ ජනයාට ස්වර්ග මෝක්ෂ සම්පත් ළඟා කර දීමේ කරුණාධ්‍යාශය මුල් කර ගෙන, තථාගතයන් වහන්සේ විසින් ධාර්මික කතිකා සහ සම්මුති පිහිටුවීම සඳහා ලබා දී ඇති අවසරය මත පිහිටා, ශ්‍රී ලංකාව තුළ ඇති භික්ෂු නිකාය සහ පාර්ශ්ව එක්සත් කරමින් ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව නම් වූ මෙම ශාසන කතිකාවත මෙසේ සම්මත කොට පනවම්හ.

පළමු පරිච්ඡේදය: බුද්ධ ශාසනය, සංඝ සංස්ථාව, භික්ෂුව සහ සංඝයාගේ ශාසන භාරකාරීත්වය

බුද්ධ ශාසනය

ශ්‍රී සුගත තථාගත සම්‍යක් සම්බුද්ධ ගෞතම සර්වඥයන් වහන්සේ විසින් සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි සමතිංශත් පාරමී ධර්මයන් පූරණය කොට, මීට වර්ෂ දෙදහස් හයසිය දාහතරකට පෙර වෙසක් පුන් පසළොස්වක පොහෝ දින දඹදිව බුද්ධගයා ශුද්ධ භූමියෙහි ඇසතු බෝරුක මුල වැඩහිඳිමින් අවබෝධ කළා වූ ද, අනතුරුව පන්සාලිස් වසක් මුළුල්ලෙහි දෙව් මිනිසුන් කෙරෙහි මහත් වූ කරුණාවෙන් ගම් දනව් සිසාර වැඩම කරමින් දේශනා කොට වදාළා වූ ද, චතුරාර්‍ය්‍ය සත්‍ය ප්‍රතිසංයුක්ත නවාඞ්ග ශාස්තෲ ශාසනය හෙවත් පිටක තුනක සංගෘහිත වූ ධර්මවිනය "බුද්ධ ශාසනය" නම් වේ.

සබ්බපාපස්ස අකරණං – කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං – එතං බුද්ධාන සාසනං.

ශාරිපුත්‍ර, මහා මෞද්ගල්‍යාන, ආනන්ද, මහා කච්චායන ආදි තථාගතයන් වහන්සේගේ සම්මුඛ ශ්‍රාවකයන් වහන්සේලා විසින් දේශිත ශ්‍රාවක භාෂිත ධර්මය ද, මොග්ගලීපුත්ත තිස්ස මහ තෙරුන් වහන්සේ වැනි ශ්‍රාවකයන් විසින් සම්පාදිතව පසුව ධර්ම සංගායනාවලින් අනුමත වූ ත්‍රිපිටකයට අයත් ධර්මය ද, තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයන් විසින් සම්පාදිත වූ ද, ධර්ම සංගායනාවලින් අනුමත වූ අර්ථකථා සහ ටීකා ද, බුද්ධ ශාසනයට ඇතුළත් වේ.

තව ද තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක භාවයට පැමිණි භික්ෂු, භික්ෂුණී, සික්ඛමානා, සාමණේර සහ සාමණේරී යන පංච සහධාර්මිකයන්ගෙන් සමන්විත පැවිදි සමූහය ද, එම පැවිදි සමූහයට අයත් විහාරස්ථාන සහ අනෙකුත් ශාසනික ආයතන ද, බුද්ධ ශාසනයට අයත් වන්නේ ය.

“සන්තස්ස ආසනං සාසනං.”

තවදුරටත්, අටුවා-ටීකා සහිත ත්‍රිපිටක දේශනාව සංඛ්‍යාත පර්‍ය්‍යාප්ති ධර්මය ද, ශීලයෙහි පරිපූරකාරී බව, ඉන්ද්‍රිය සංවරය, භෝජනයේ මාත්‍රාඥතාව, ජාගරියානුයෝගය, සත්තිස් බෝධිපාක්ෂික ධර්ම, තෙළෙස් ධුතාඞ්ග, චුද්දස මහා වත් සහ අසීති වත් ආදී ප්‍රතිපත්ති ධර්මය ද, නව ලෝකෝත්තර ධර්ම සහ පටිසම්භිදා ඥාණාදිය වූ ප්‍රතිවේධ ධර්මය ද, බුද්ධ ශාසනය ම වේ.

“පරියත්තිසාසනං, පටිපත්තිසාසනං, පටිවෙධසාසනං.”

සංඝ සංස්ථාව

තථාගතයන් වහන්සේ විසින් බුද්ධත්වයෙන් අනතුරුව, මීට වර්ෂ දෙදහස් හයසිය දාහතරකට පෙර ඇසළ පුන් පසළොස්වක පොහෝ දිනයේ දී බරණැස ඉසිපතන මිගදායෙහි අඤ්ඤා

	කොණ්ඩඤ්ඤ තවුසාට ඒහි භික්ඛු පැවිදි උපසම්පදාව ලබා දීමෙන් ආරම්භ වූ, පසුව ඒහි භික්ඛු උපසම්පදාව, සරණගමන උපසම්පදාව, ඕවාද පටිග්ගහණ උපසම්පදාව, පඤ්හබ්‍යාකරණ උපසම්පදාව, අට්ඨගරුධම්ම පටිග්ගහණ උපසම්පදාව, දූතේන උපසම්පදාව, ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව සහ අට්ඨවාචික උපසම්පදාව යන උපසම්පදා ක්‍රම මගින් අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලබා ගත් තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක සහ ශ්‍රාවිකා භාවයට පැමිණි අනගාරික පැවිද්දන්ගේ සමූහය "සංඝ සංස්ථාව" නම් වේ.
භික්ෂුව	වර්තමානයේ වලංගු උපසම්පදා ක්‍රමය ලෙස ඤත්තිචතුර්ථ උපසම්පදාව පමණක් පිළිගනු ලබන බැවින්, පඤ්චවිධ සම්පත්තීන්ගෙන් යුක්ත ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාවෙන් අධිශීල සංඛ්‍යාත උපසම්පදාවට ප්‍රාප්ත වූ අනගාරික පුරුෂ පැවිද්දෙක් "භික්ෂුව" යන්නෙන් අදහස් වේ.
සංඝයාගේ ශාසන භාරකාරීත්වය	මීට වර්ෂ දෙදහස් පන්සිය හැට නවයකට පෙර වෙසක් පුන් පසළොස්වක පොහෝ දින කුසිණාරා නුවර උපවත්ත සාලවනෝද්‍යානයෙහි දී පරිනිර්වාණයට පත් වීමට ප්‍රථම තථාගතයන් වහන්සේ විසින්, **"ආකඞ්ඛමානො, ආනන්ද, සඞ්ඝො මමච්චයෙන ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි සමූහනතු"** යන බුද්ධ අවවාදයෙන් සකල ශාසනයේ භාරකාරීත්වය සංඝයා වෙත පැවරූ බව පුරාණ ආචාර්‍යවරු සැලකූහ. ඒ අනුව, තථාගතයන් වහන්සේගේ අනුශාසනා සංඛ්‍යාත ත්‍රිපිටක බුද්ධ වචනය එහි අටුවාටීකාදිය සහිතව රක්ෂා කොට පවත්වා ගැනීමේ ද, ධර්ම විනයේ සහ සංඝ සංස්ථාවේ චිරස්ථිතිය පිණිස හේතු වන ධාර්මික කතිකා පැනවීමේ ද, විනය ශික්ෂාපද රක්ෂා කිරීමේ ද, අවශ්‍ය අවස්ථාවල දී සංඝයාගේ අනුමැතියෙන් ඛුද්දානුඛුද්දක ශික්ෂාපද සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමූහනය කිරීමේ ද ශාසනය කෙරෙහි පැහැදුණු රජවරුන්, රාජාමාත්‍යයන් සහ අනෙකුත් සැදැහැවත්හු විසින් ත්‍රිවිධ රත්නයට පූජා කරන ලද දේපළ ආරක්ෂා කිරීමේ ද මූලික වගකීම තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක පුත්‍ර භාවයට පැමිණි සංඝයා වෙත ම පැවරෙන්නේ ය.
භික්ෂූන්ගේ ශාසනාධිපත්‍යය	සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු බුද්ධ ශාසනයේ ශාසනාධිපත්‍යය උපසම්පන්න භික්ෂූන් වහන්සේලා කෙරෙහි පිහිටා ඇත්තේ ය. එම ශාසනාධිපත්‍යය භික්ෂූන් වහන්සේලාට අහිමි කළ නොහැකි අතර, භික්ෂූන් වහන්සේලා විසින් ද අත්හළ නොහැක්කේ ය. ශාසනාධිපත්‍යයට සංඝ සංස්ථාවේ පාලන බලතල, භික්ෂූන් වහන්සේලාගේ මූලික විනය අයිතිවාසිකම් සහ ශාසන කටයුතු සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඇතුළත් වන්නේ ය.

භික්ෂූන්ගේ ශාසනාධිපත්‍යය ක්‍රියාත්මක කිරීම	උපසම්පන්න භික්ෂූන් වහන්සේලාගේ ශාසනාධිපත්‍යය මතු දැක්වෙන ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේ ය. (1). උපසම්පන්න භික්ෂූන් වහන්සේලා තමන් සතු ශාසනික ඡන්ද බලය සහ විධායක බලය විනය කර්මවල දී සමඟි සංඝයා ලෙස සාමූහිකව ක්‍රියාත්මක කරන්නේ ය. (2). තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරුව පවත්වන ලද ප්‍රථම ධර්මවිනය සංගායනාවේ අනුගමනය කරන ලද මූලධර්මයන්ට අනුකූලව ධර්මවිනය සංගායනා කොට ධර්මවිනය කවරක් ද යන්න තීරණය කිරීමේ සහ නිර්වචනය කිරීමේ, ඛුද්දානුඛුද්දක ශික්ෂාපද සමූහනය කිරීමේ සහ සමස්ත සංඝයාට බලපැවැත්වෙන ධාර්මික කතිකා පිහිටුවීමේ ව්‍යවස්ථාදායක බලය, උපසම්පන්න භික්ෂූන් වහන්සේලාගේ එකඟතාවයෙන් ඒ සඳහා තෝරා පත් කරගනු ලබන සංඝ සමූහයක් විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය.
ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුව භික්ෂූන්ගේ ශාසනාධිපත්‍යය ක්‍රියාත්මක කිරීමේ අනෙකුත් ක්‍රම	ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුව, ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය තුළ එක්සත් සංඝ සංස්ථාවට අයත් උපසම්පන්න භික්ෂූන් වහන්සේලාගේ ශාසනාධිපත්‍යය පහත සඳහන් ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේ ය. (1). ව්‍යවස්ථාදායක බලය ධර්මවිනය කවරක් ද යන්න තීරණය කිරීමේ සහ නිර්වචනය කිරීමේ, ඛුද්දානුඛුද්දක ශික්ෂාපද සමූහනය කිරීමේ සහ සමස්ත සංඝයාට බලපැවැත්වෙන ධාර්මික කතිකා පිහිටුවීමේ භික්ෂූන්ගේ ව්‍යවස්ථාදායක බලය, එක්සත් සංඝ සංස්ථාවේ නිකාය සහ පාර්ශ්ව විසින් මෙම ව්‍යවස්ථාවට අනුව තෝරා පත් කරගනු ලබන උපසම්පන්න භික්ෂූන් වහන්සේලාගෙන් සමන්විත උත්තරීතර මහා සංඝ සභාව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය. මෙම ව්‍යවස්ථාවෙන් නියම කරනු ලබන අවස්ථාවල දී එම බලය සංඝ මතවිචාරණයක් මඟින් උපසම්පන්න භික්ෂූන් වහන්සේලා විසින් සෘජුව ම ක්‍රියාත්මක කළ යුත්තේ ය. (2). විධායක බලය සංඝ සංස්ථාවේ පරිපාලනය, ආරක්ෂාව, සංවර්ධනය සහ අභිවෘද්ධිය සඳහා අවශ්‍ය භික්ෂූන්ගේ විධායක බලය, උත්තරීතර සංඝ සභාව විසින් මෙම ව්‍යවස්ථාවට අනුව පිහිටුවනු ලබන සංඝභාර නිත්ථාරක සභාව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය. (3). අධිකරණ බලය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තියෙන් රජයට පවරා ඇති බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීමේ වගකීමට අනුකූලව, උත්තරීතර සංඝ ව්‍යවස්ථාව බලාත්මක වීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105(4) වන වගන්තිය ප්‍රකාරව පිහිටුවනු ලබන සංඝාධිකරණ විසින් සහ ඒ ඒ නිකාය හා පාර්ශ්වවල කාරක සභා විසින් දැනටමත් පිහිටුවා ඇති හෝ ඉදිරියේ දී පිහිටුවනු ලබන සංඝාධිකරණ විසින් භික්ෂූන්ගේ අධිකරණ බලය ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(4). මූලික විනය අයිතිවාසිකම්

උත්තරීතර සංඝ ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලබන භික්ෂූන්ගේ මූලික විනය අයිතිවාසිකම් සහ ධර්මවිනයෙන් පිළිගනු ලබන අනෙකුත් මූලික විනය අයිතිවාසිකම් සියලු ශාසන අධිකාරි ආයතන විසින් ගරු කරනු ලැබිය යුත්තේ ය; ආරක්ෂා කරනු ලැබිය යුත්තේ ය; වර්ධනය කරනු ලැබිය යුත්තේ ය.

එම අයිතිවාසිකම් ධර්මවිනයෙන් නියම කර ඇති අවස්ථාවල දී සහ එහි දක්වා ඇති ආකාරයට හා ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුත්තේ ය.

(5). ශාසනික කටයුතුවල දී ඡන්ද බලය

මෙම ව්‍යවස්ථාව බලාත්මක වීමට පෙර උපසම්පදාවට පත් වූ භික්ෂූන් වහන්සේලා සහ මෙම ව්‍යවස්ථාව බලාත්මක වීමෙන් පසු උපසම්පදාවට පත් වූ භික්ෂූන් වහන්සේලා අතුරින් නිස්සයමුත්තක උපාධිය සමර්ථ වූ භික්ෂූන් වහන්සේලා, මෙම ව්‍යවස්ථාවෙන් නියම කරනු ලබන ආකාරයට, ශාසන කටයුතු පිළිබඳ සංඝ මතවිචාරණවල දී තම ඡන්ද බලය සෘජුව ම ක්‍රියාත්මක කළ යුත්තේ ය.

භික්ෂූන්ගේ ශාසනාධිපත්‍යයේ සීමා	තථාගතයන් වහන්සේ විසින් අවසානාත්මකව නිශ්චය කොට වදාළ කරුණු සම්බන්ධයෙන් උපසම්පන්න භික්ෂූන් වහන්සේලාට ශාසනාධිපත්‍යයක් නොමැත. එබැවින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් උපසම්පන්න භික්ෂූන් වහන්සේලා විසින් සෘජුව හෝ වක්‍රව හෝ, සියලු සංඝයා වශයෙන් හෝ, මෙම ව්‍යවස්ථාවෙන් පිහිටුවනු ලබන කිසිදු ශාසන අධිකාරි ආයතනයක් මඟින් හෝ ශාසනාධිපත්‍යය ක්‍රියාත්මක කළ නොහැක්කේ ය. (1). තථාගතයන් වහන්සේ විසින් දේශිත ධර්මය "ධර්ම සංඥාවෙන්" සමූහනය කිරීම හෝ තථාගතයන්

	වහන්සේ විසින් දේශිත ධර්මයට පටහැනි දෙයක් "අධර්ම සංඥාවෙන්" ධර්මය ලෙස සම්මත කිරීම. (2). පාරාජිකා ශික්ෂාපද සමූහනය කිරීම, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම. (3). පාරාජිකා, සංඝාදිසේස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදේසනීය, දුක්කට සහ දුබ්භාසිත ශික්ෂාපද අලුතින් පැණවීම. (4). අවේභඩ්ගිය සාංඝික දේපළක සාංඝික බව, විනයෙන් අවසර දී ඇති විධිවිධාන අනුව සාංඝික නොවන දේපළක් සමඟ හුවමාරු කිරීමක දී හැර වෙනත් කිසිදු ආකාරයකින් ඉවත් කිරීම.
ශ්‍රී ලංකාවේ එක්සත් සංඝ සංස්ථාව	ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව පිළිගෙන, එහි විධිවිධාන අනුව එක් සංස්ථාවක් ලෙස ක්‍රියා කිරීමට එකඟ වූ සියලු නිකාය සහ පාර්ශ්වයන්ට අයත් උපසම්පන්න භික්ෂූන්ගේ සමූහය ශ්‍රී ලංකාවේ එක්සත් සංඝ සංස්ථාව වන්නේය.
ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව බලාත්මක වන ප්‍රදේශය	ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 5 වන වගන්තියේ සඳහන් "ජනරජයට අයත් දේශය" තුළ බලාත්මක වන්නේය.
ශාසන සාමාජිකයෝ	ශ්‍රී ලංකාව තුළ බුද්ධ ශාසනයේ සාමාජිකයෝ උපසම්පන්න භික්ෂූන් වහන්සේලා (භික්ෂූහු), සාමණේරවරු, සිල්මාතාවරු සහ ස්ත්‍රී පුරුෂ ගිහි බෞද්ධයෝ වෙති. බුද්ධ ශාසනයේ චතුර්විධ පිරිසට ගිහි බෞද්ධයෝ ද අයත් වුව ද, මෙම ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් පැවිදි ශාසනික සංවිධානය හා එහි පරිපාලනය සම්බන්ධ වන බැවින්, මෙම ව්‍යවස්ථාවේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති සෑම අවස්ථාවක ම "ශාසන සාමාජිකයෝ" යන පදයෙන් අදහස් කරනු ලබන්නේ උපසම්පන්න භික්ෂූන් වහන්සේලා, සාමණේරවරු සහ සිල්මාතාවරු පමණි.
ශාසන අධිකාරි ආයතන	උත්තරීතර සංඝ ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලබන (1). උත්තරීතර සංඝ සභාව, (2). සංඝභාර නිත්ථාරක සභාව (3). උත්තීතර සංඝාධිකරණය (4). කාරක සංඝාධිකරණය සහ (5). මූලික සංඝාධිකරණ ද, උත්තරීතර සංඝ ව්‍යවස්ථාව සම්මත කිරීමට පෙර සිට පැවත එන (1). නිකාය සහ පාර්ශ්ව කාරක සංඝ සභා සහ (2). නිකාය සහ පාර්ශ්ව අධිකරණ ද,

එක්ව "ශ්‍රී ලංකාවේ ශාසන අධිකාරි ආයතන" ලෙස හඳුන්වනු ලැබේ.

දෙවෙනි පරිච්ඡේදය: මූලික විනය අයිතිවාසිකම්

පාරාජිකා නොවී ශාසනයෙන් නෙරපනු නොලැබීමේ අයිතිය	භික්ෂුවකගේ හෝ භික්ෂුණියකගේ උපසම්පදාව අහිමි වන්නේ සූවිසි පාරාජිකාවන්ගෙන් එකකට පත් වීමෙන් හෝ ස්වකැමැත්තෙන් උපසම්පදා ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යානය කිරීමෙන් පමණි. එසේ නොවන තාක් කිසිදු භික්ෂුවක හෝ භික්ෂුණියකගේ භික්ෂුභාවය හෝ භික්ෂුණීභාවය සංඝයා විසින් හෝ සංඝයාගේ කිසිදු අධිකාරියක් විසින් අහෝසි කළ නොහැකි අතර, ඔහු හෝ ඇය ශාසනය තුළ භික්ෂුවක හෝ භික්ෂුණියක ලෙස පෙනී සිටීම වැළැක්විය නොහැක. බලහත්කාරයෙන් සිවුරු ගලවා හැරීමකින් ද උපසම්පදාව අහිමි නොවේ.
ස්වකැමැත්තෙන් උපසම්පදාව අතහැරීමේ නිදහස	භික්ෂුවකට විනයානුකූල ක්‍රමවේදයන් අනුගමනය කරමින් ස්වකැමැත්තෙන් උපසම්පදාව අතහැර සාමණේර භූමියට හෝ ගිහි ජීවිතයට නැවත පැමිණීමට නිදහස ඇත. එසේ උපසම්පදාව ප්‍රතික්ෂේප කළ පසු, සංඝයාට හෝ සංඝයාගේ කිසිදු අධිකාරියකට එම උපසම්පදාව පවත්වාගෙන යාමට නොහැක.
සාධාරණ හා අපක්ෂපාතී විනිශ්චයකට ඇති අයිතිය	භික්ෂුවකට කිසියම් විනය දඬුවමකට හෝ නිග්‍රහ විනය කර්මයකට යටත් කිරීමට පෙර සාධාරණ, අපක්ෂපාතී හා විනයානුකූල විනිශ්චයකට භාජනය වීමේ අයිතිය ඇත. පකාසනීය කර්මය සහ අවන්දනීය කර්‍මය හැර අනෙකුත් සියලු නිග්‍රහ විනය කර්මයන් චූදිත භික්ෂුව සම්මුඛයේ සිදු කළ යුතු අතර, එවන් විනය කර්මයක් සිදු කිරීමට පෙර චෝදනාවන් පිළිබඳ නිසි විභාගයක් සිදු කර භික්ෂුවට වරද ආරෝපණය කළ යුතු ම ය.
විනය කර්‍ම සම්බන්ධයෙන් ඇති අයිතිවාසිකම්	සෑම භික්ෂුවකට ම විනය කර්‍ම පිළිබඳව පහත අයිතිවාසිකම් ඇත. (1). තම අභිමතය පරිදි ඡන්දය ප්‍රකාශ කිරීමේ හෝ වැළකී සිටීමේ අයිතිය සීමස්ථක භික්ෂුවකට තම සීමාව තුළ සංඝයා විසින් සිදු කරනු ලබන සංඝ කර්මයක් සම්බන්ධයෙන් තම අභිමතය පරිදි එකඟතාවය හෙවත් ඡන්දය ප්‍රකාශ කිරීමට හෝ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීමට අයිතිය ඇත. කිසිදු භික්ෂුවකගේ ඡන්දය බලහත්කාරයෙන් ලබා ගැනීමට හෝ බලහත්කාරයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට සැලැස්වීමට කිසිවෙකුට හෝ කිසිදු අධිකාරියකට නොහැක. (2). පටික්කෝසනය කිරීමේ අයිතිය සංඝ කර්මයක් හෝ විනය කර්මයක් සිදු කරනු ලබන අවස්ථාවක එම කර්මයට සහභාගි වන භික්ෂුවකට තම අකැමැත්ත වාචසිකව ප්‍රකාශ කරමින් පටික්කෝසනය

කිරීමේ අයිතිය ඇත. විනයානුකූලව පටික්කෝසනයක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, එම සංඝ කර්මය විනයානුකූලව ඉදිරියට ගෙන යා නොහැකි අතර, පටික්කෝසනයක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක එය ගණනකට නොගෙන විනය කර්‍මය සිදු කරනු ලැබුව ද විනය කර්‍මය අසිද්ධියට පත්වේ.

විනය කර්මයක් සම්බන්ධයෙන් විනයානුකූලව පටික්කෝසනය කිරීම, භික්ෂුවකට විනය ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා හේතුවක් නොවන්නේ ය. එම පටික්කෝසනය කිරීම පමණක් පදනම් කර ගෙන කිසිදු ශාසන අධිකාරි ආයතනයක් හෝ සංඝයා විසින් විනය ක්‍රියාමාර්ගයක් නොගත යුතුය.

සාංඝික සම්පත් පිළිබඳ අයිතිවාසිකම්

සෑම භික්ෂුවකට ම සාංඝික සම්පත් පිළිබඳව පහත විනය අයිතිවාසිකම් ඇත.

(1). ශාසනික වැඩිහිටිකම පවත්වා ගැනීමේ අයිතිය

භික්ෂුවකගේ ශාසනික වැඩිහිටිකම තීරණය වන්නේ උපසම්පදා වූ දිනය හා මොහොත අනුව ය. විනයානුකූල ක්‍රමයකින් උපසම්පදාව අහිමි නොවන තාක් එම වැඩිහිටිකම පවතින අතර, සංඝයා විසින් හෝ සංඝයාගේ කිසිදු අධිකාරියක් විසින් එය අහෝසි කිරීමට, අත්හිටුවීමට හෝ පහත හෙළීමට නොහැක.

උපසම්පදාවෙන් වැඩිහිටි භික්ෂුවක් කිසිදු කරුණක් මත උපසම්පදාවෙන් බාල භික්ෂුවකට නොවැඳිය යුතු අතර, බාල භික්ෂූන් පිරිසක් සංඝයා නියෝජනය කරමින් සිටින අවස්ථාවක දී පවා සංඝගරුත්වය මත වැඩිහිටි භික්ෂුව බාල භික්ෂු පිරිසට සංඝ නාමයෙන් වුව ද වැඳීමක් නොකළ යුතුය.

(2). සාංඝික සේනාසන වැඩිහිටිකම අනුව ලැබීමේ අයිතිය

සාංඝික සේනාසන භික්ෂූන්ට වෙන් කළ යුත්තේ ශාසනික වැඩිහිටිකම අනුව ය. පාරිවාසික, මූලායපටිකස්සනාරහ, මානත්තාරහ, මානත්තචාරික හා අබ්භානාරහ යන විනයානුකූල අවස්ථාවන් හැර, භික්ෂුවකට තම වැඩිහිටිකම අනුව හිමිවන සාංඝික සේනාසනයකට ප්‍රවේශ වීමට හෝ එහි වාසය කිරීමට ඇති අයිතිය කිසිදු ශාසන අධිකාරි ආයතනයක් විසින් හෝ සංඝයා විසින් ද වැළැක්විය නොහැක.

“න ත්වෙවාහං, සාරිපුත්ත, කෙනචි පරියායෙන වුඩ්ඪතරස්ස භික්ඛුනො සෙනාසනං පටිබාහිතබ්බන්ති වදාමි. යො පටිබාහෙය්‍යා, ආපත්ති දුක්කටස්ස.”

එසේ වුව ද සංඝයා විසින් අනුට්ඨාපනීය සම්මුතිය ලබා දී ඇති බහුශ්‍රැත, විනයධර, ගණවාචක, භාණ්ඩාගාරික

වැනි සංඝයාට බහුපකාර ඇති භික්ෂූන්ට වැඩිහිටිකම ගැන සැලකීමක් නොකොට ඔවුන්ගෙන් සංඝයාට වන සේවය සලකා සංඝයා විසින් ලබා දෙන ලද සේනාසනයෙහි වාසය කිරීමේ අයිතිය ඇත.

වස්සාන සමය සඳහා භික්ෂුවකට ලබා දුන් සෙනසුනක් වැඩිහිටි පිළිවෙල අනුව හිස් කළ නොහැක.

එසේ වුව ද භික්ෂූන් වහන්සේලා විසින් අද කාලයේ නිකායවල සහ පාර්ශ්වවල පවතින සම්ප්‍රදායන්ට ගරු කරමින් සංඝ සාමග්‍රියට හානි නොවන අයුරින් කටයුතු කිරීමට වග බලා ගත යුතුය.

(3). සාංඝික විහාරයක වාසය කිරීමේ අයිතිය

විනයානුකූලව උපසම්පදාව ලැබූ භික්ෂුවකට ඕනෑම සාංඝික විහාරයක වාසය කිරීමේ අයිතිය ඇත. මෙම අයිතිය විනයානුකූල සීමාවන් හැර වෙනත් කිසිදු හේතුවක් මත සීමා කිරීමට, අත්හිටුවීමට හෝ අහිමි කිරීමට නොහැක.

"න, භික්ඛවෙ, සබ්බො සඞ්ඝාරාමො ආවරණං කාතබ්බො. යො කරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස" යන බුද්ධාවවාදයට අනුව, දස නාසනාවලට අයත් නොවන වරදක් කළ සාමණේරයෙකු වුව ද සාංඝික ආරාමයක වාසය කිරීම සම්පූර්ණයෙන් වාරණය කළ නොහැක.

කෙසේ වුව ද, මෙම වගන්තියෙන් භික්ෂූන් වහන්සේලා නිකායවල සහ පාර්ශ්වවල දැනට පවතින විනයානුකූල සම්ප්‍රදායන්ට ගරු කරමින්, සංඝ සාමග්‍රියට හානි නොවන අයුරින් කටයුතු කළ යුතු යුතුකමෙන් නිදහස් නොවෙති.

(4). විනයට පටහැනි ලෙස සාංඝික විහාරයකින් බැහැර නොකරනු ලැබීමේ අයිතිය

සූවිසි පාරාජිකාවන්ගෙන් එකකට පත් නොවූ භික්ෂුවක් සාංඝික සේනාසනයකින් බැහැර කරනු නොලැබිය යුතුය.

එසේ වුව ද, භණ්ඩනකාරී හෝ කලහකාරී භික්ෂූන් තවත් භික්ෂූන්ගේ සහයෝගය ලබා සංඝභේදය පවා ඇති කළ හැකි බැවින්, සංඝ සාමග්‍රිය ආරක්ෂා කිරීමේ අරමුණින් එවැනි භික්ෂූන් සාංඝික විහාරයකින් බැහැර කිරීමට සංඝයාට බලය ඇත.

(5). සාංඝික පරිෂ්කාරවලින් හිමි පංගුව ලැබීමේ අයිතිය

වේභඞ්ගිය සාංඝික පරිෂ්කාර විනයානුකූලව හා සාධාරණ ලෙස සංඝයා අතර බෙදා දිය යුතුය. උක්ෂේපණීය කර්මයකට භාජනය වූ භික්ෂුවකට වුව ද,

	විනයෙන් හිමිවන පරිෂ්කාර පංගුව සංඝයා විසින් හෝ සංඝයාගේ කිසිදු අධිකාරියක් විසින් වැළැක්විය, අත්හිටුවිය හෝ අහිමි කළ නොහැක.
ශාරීරික වදහිංසා සහ කෲර දඬුවම්වලින් නිදහස	කිසිදු භික්ෂුවක් ඔහු විසින් සිදු කර ඇති යම් වරදක් හෝ වෙනත් කරුණක් හේතුවෙන්, පහර දීම, ශාරීරික වදහිංසා පැමිණවීම, දියේ ගිල්වීම, රත් වූ ගලක් මත හාන්සි කිරීමට සැලැස්වීම හෝ ඒ හා සමාන කෲර, අමානුෂික හෝ අවමන්සහගත දඬුවම්වලට සංඝයා විසින් හෝ සංඝයාගේ කිසිදු අධිකාරියක් විසින් ලක් නොකළ යුතුය.
ආහාර ගැනීම තාවකාලිකව හෝ වාරණය කරනු නොලැබීමේ අයිතිය	ස්ථවිර, මජ්ඣිම සහ නවක යන සියලු භික්ෂූන්ට ඨිත මධ්‍යාහනය අවසන් වීමට පෙර කාලයේ දී ආහාර ගැනීමේ අයිතිය ඇත. “**න, භික්ඛවෙ, මුඛද්වාරිකො ආහාරො ආවරණං කාතබ්බො**” යන බුද්ධාවවාදයට අනුව භික්ෂුවක් හෝ සාමණේරයෙක් විසින් සිදු කර ඇති යම් වරදක් හෝ වෙනත් කරුණක් හේතුවෙන් එම අයිතිය සංඝයා විසින් හෝ සංඝයාගේ කිසිදු අධිකාරියක් විසින් තාවකාලිකව වුව ද සීමා කිරීමට හෝ අහෝසි කිරීමට නොහැක.

තුන්වෙනි පරිච්ඡේදය:
භික්ෂුත්වය

උපසම්පදා භික්ෂුවකගේ භික්ෂුත්වය	වර්තමානයේ වලංගු උපසම්පදා ක්‍රමය ලෙස ඤත්තිචතුර්ථ උපසම්පදාව පමණක් පිළිගනු ලබන බැවින්, පඤ්චවිධ සම්පත්තීන්ගෙන් සමන්විත ඤත්තිචතුර්ථ විනයකර්මයකින් උපසම්පදාව ලැබූ යම් පුද්ගලයෙකුගේ භික්ෂුභාවය මෙහි දී "භික්ෂුත්වය" ලෙස හඳුන්වනු ලැබේ. අඞ්ගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ මහාසුපින සූත්‍රයේ සඳහන් පරිදි, තථාගතයන් වහන්සේ සම්බුද්ධත්වයට පත්වීමට පෙර දින රාත්‍රියේ දුටු සිව්වන මහා සුපිනයෙන් ප්‍රකාශ වන මූලධර්මයට අනුව, භික්ෂුවකගේ භික්ෂුත්වය ඔහුගේ පුරවැසිභාවය, ජාතිය, වර්ගය, කුලය, භාෂාව හෝ උපසම්පදාව ලැබූ නිකාය හෝ පාර්ශ්වය අනුව විවිධත්වයකට පත් නොවන අතර සියලු උපසම්පන්න භික්ෂූන්ගේ භික්ෂුත්වය සර්වසම වේ. භික්ෂුවකගේ භික්ෂුත්වය, විනයේ දක්වා ඇති පරිදි සූවිසි පාරාජිකාවන්ගෙන් එකකට පත්වීම හෝ පත්ව තිබීමෙන් හෝ ස්වකැමැත්තෙන් උපසම්පදා ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යානය කිරීමෙන් මිස වෙනත් කිසිදු ආකාරයකින් අවසන් වූයේ යැයි හෝ අහෝසි වූයේ යැයි නොසැලකිය යුතුය. සංඝයා විසින් හෝ ශාසන අධිකාරි ආයතනයක් විසින් හෝ රාජ්‍යමය හෝ රාජ්‍ය නොවන යම් අධිකාරියක් විසින් භික්ෂුවකගේ භික්ෂුත්වය අහෝසි කරන ලද්දේ යැයි ප්‍රකාශ කළ ද, එම භික්ෂුව සූවිසි පාරාජිකාවන්ගෙන් එකකට පත්ව නොමැති නම් හෝ ස්වකැමැත්තෙන් උපසම්පදා ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යානය කර නොමැති නම්, ඔහුගේ උපසම්පදාව සහ භික්ෂුත්වය ඔහු කෙරෙහි විද්‍යමාන වන බව දත යුතුය.
භික්ෂුත්වය පිළිබඳ විනය මූලධර්ම	ත්‍රිපිටකය, අර්ථකථා සහ ටීකා ආදියේ දක්වා ඇති භික්ෂුත්වය ලැබීමේ ක්‍රමවේද, භික්ෂුත්වය අවසන් වීමේ ක්‍රමවේද සහ පාරාජිකාපත්තියට පත් වූ අයෙකු සිවුරු හරවා යැවීමේ ක්‍රියාමාර්ග ආදිය සංග්‍රහ කරමින් "භික්ෂුත්වය පිළිබඳ විනය මූලධර්ම" නමින් කතිකාවතක් උත්තරීතර සංඝ සභාව විසින් සම්මත කළ යුතුය.
ලියාපදිංචිය	යම් නිකායක් හෝ පාර්ශ්වයක් යටතේ කුලපුත්‍රයෙකු උපසම්පදාව ලැබූ විට, බෞද්ධ විහාර දේවාලගම් පනතේ 41 වන වගන්තිය යටතේ දක්වා ඇති "උපසම්පදා භික්ෂූන් පිළිබඳ ප්‍රකාශය" නම් ලේඛනයේ පිටපත් තුනක් සම්පූර්ණ කර ඒවා බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා වෙත යොමු කළ යුතුය. බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා විසින් එම ලේඛනවලින් එක් පිටපත බැගින් අදාළ නිකායේ හෝ පාර්ශ්වයේ මහානායක

ස්ථවිරයන් වහන්සේ වෙත සහ ශාසන ලේඛන හා ග්‍රන්ථ මණ්ඩලයේ ලේඛකාධිකාරී ස්ථවිරයන් වෙත යොමු කළ යුතුය.

බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා, අදාළ නිකායේ හෝ පාර්ශ්වයේ මහානායක ස්ථවිරයන් සහ ශාසන ලේඛන හා ග්‍රන්ථ මණ්ඩලයේ ලේඛකාධිකාරී ස්ථවිරයන් විසින් බෞද්ධ විහාර දේවාලගම් පනතේ 41 වන වගන්තියේ විධිවිධාන අනුව එම ලේඛන භාර ගැනීම, පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම සිදු කළ යුතුය.

ලියාපදිංචිය අහෝසි වීම

කාරක සංඝාධිකරණය විසින් පාරාජිකාපත්තියට පත් වූයේ යැයි තීරණය කරන ලද සහ භික්ෂුව විසින් තමන් පාරාජිකාපත්තියට පත් වූයේ යැයි ප්‍රතිඥා දෙන ලද භික්ෂුවකගේ නම අදාළ ලේඛනවලින් ඉවත් කරන ලෙස කාරක සංඝාධිකරණය විසින් බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාට, අදාළ නිකායේ හෝ පාර්ශ්වයේ මහානායක ස්ථවිරයන්ට සහ ශාසන ලේඛන හා ග්‍රන්ථ මණ්ඩලයේ ලේඛකාධිකාරී ස්ථවිරයන්ට ලිඛිතව දැනුම් දිය යුතුය.

එම දැනුම්දීම ලැබුණු පසු බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා, අදාළ නිකායේ හෝ පාර්ශ්වයේ මහානායක ස්ථවිරයන් සහ ශාසන ලේඛන හා ග්‍රන්ථ මණ්ඩලයේ ලේඛකාධිකාරී ස්ථවිරයන් විසින් හැකි ඉක්මනින් එම භික්ෂුවගේ නම අදාළ නාම ලේඛනවලින් ඉවත් කළ යුතු අතර, එම පුද්ගලයාට නැවත කිසිදු නිකායක හෝ පාර්ශ්වයක උපසම්පදාව නොලැබිය හැකි බවට වාර්තාවක් සටහන් කළ යුතුය.

භික්ෂුවක් ස්වකැමැත්තෙන් උපසම්පදා ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යානය කළ විට, ඒ බව ඔහු විසින් තමන් උපසම්පදාව ලැබූ නිකායේ හෝ පාර්ශ්වයේ මහානායක ස්ථවිරයන්ට ලිඛිතව දැනුම් දිය යුතුය. එම දැනුම්දීම ලැබුණු පසු මහානායක ස්ථවිරයන් විසින් ඒ පිළිබඳව බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාට සහ ශාසන ලේඛන හා ග්‍රන්ථ මණ්ඩලයේ ලේඛකාධිකාරී ස්ථවිරයන්ට දැනුම් දිය යුතුය.

අනතුරුව බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා, අදාළ නිකායේ හෝ පාර්ශ්වයේ මහානායක ස්ථවිරයන් සහ ශාසන ලේඛන හා ග්‍රන්ථ මණ්ඩලයේ ලේඛකාධිකාරී ස්ථවිරයන් විසින් හැකි ඉක්මනින් අදාළ පුද්ගලයාගේ නම අදාළ නාම ලේඛනවලින් ඉවත් කළ යුතුය.

භික්ෂු නාම ලේඛනයෙන් නම ඉවත් කිරීමේ විනයානුකූල සීමාව

සූවිසි පාරාජිකාවන්ගෙන් එකකට පත් නොවූ භික්ෂුවකගේ නම, ඔහු ශාසනානුලෝමික නොවූ ක්‍රියාවල නිරත වීම හේතුවෙන් භික්ෂු නාම ලේඛනයෙන් ඉවත් කළ ද, අනතුරුව ඔහු විසින් ගිහි වස්ත්‍ර ඇන්ද ද, විනයානුකූලව ඔහුගේ භික්ෂුත්වය නොනැසී පවතියි. එබැවින් එවැනි භික්ෂුවක් ගිහියෙකු ලෙස වාසය කළ ද, විනයානුකූලව ඔහු තවදුරටත් භික්ෂුවකි. එවැනි තත්ත්වයක් යටතේ ශ්‍රී ලංකාව පුරා ග්‍රාමසීමාවල බද්ධසීමා සම්මත කිරීම ඇතුළු සංඝයා විසින් සිදු කරනු ලබන විනය කර්මවල විනයානුකූල වලංගුභාවය පිළිබඳ බරපතළ සැක මතු විය හැකි අතර, එම සැක පහසුවෙන් දුරු කළ නොහැක. එවැනි තත්ත්වයක් සමස්ත ශ්‍රී ලංකා

සංඝයාගේ විනය කටයුතුවල විනයානුකූල ස්ථාවරභාවයට බරපතළ බලපෑමක් ඇති කළ හැකි බැවින්, භික්ෂු නාම ලේඛනයෙන් නම ඉවත් කළ යුත්තේ සුවිසි පාරාජිකාවන්ගෙන් එකකට පත් වූ පුද්ගලයෙකුගේ පමණි.

ලියාපදිංචිය අහෝසි වූ පසු භික්ෂුවක් ලෙස පෙනී සිටීම

මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව භික්ෂු ලියාපදිංචිය අහෝසි වූ පුද්ගලයෙකුට, තථාගතයන් වහන්සේගේ නියමයට අනුව භික්ෂුවක් වශයෙන් ඔහු භුක්ති විඳින ලද සාංඝික දේපළ හෝ වරප්‍රසාද තවදුරටත් භාවිත කිරීමට හෝ පරිභෝජනය කිරීමට අයිතියක් නොලැබේ.

යම් හෙයකින් ලියාපදිංචිය අහෝසි වූ පුද්ගලයෙකු තවදුරටත් භික්ෂුවක් ලෙස පෙනී සිටින බවට විනය කාරක කමිටුව වෙත පැමිණිලි ලැබේ නම්, විනය කාරක කමිටුව විසින් ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා, ව්‍යවස්ථාවේ සහ අදාළ නීතිමය විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය.

මෙම විධිවිධාන, උපසම්පදාව අත්හැර සාමණේරභූමියට පත් වූ අයෙකුට හෝ විනයානුකූල අයුරින් නැවත සාමණේරභාවය හෝ උපසම්පදාව ලැබූ අයෙකුට අදාළ නොවේ.

ජාත්‍යන්තර භික්ෂූහු

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි නොවූ නමුත් වෙනත් රටක ථේරවාද භික්ෂු සම්ප්‍රදායක විනයානුකූල ලෙස උපසම්පදාව ලැබූ භික්ෂූහු මෙහි දී "ජාත්‍යන්තර භික්ෂූහු" ලෙස හඳුන්වනු ලබන අතර, ඔවුන්ට ද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි භික්ෂූන් භුක්ති විඳින විනයානුකූල අයිතිවාසිකම් ශ්‍රී ලංකාව තුළ දී භුක්ති විඳීමට හිමිකම් ඇත.

පරිපාලනමය හෝ නීතිමය සීමාවන් යටතේ අවශ්‍ය වෙනස්කම් හැර, භික්ෂුවක් තමන්ගේ පුරවැසිභාවය, ජාතිය, වර්ගය, කුලය, භාෂාව හෝ උපසම්පදාව ලැබූ නිකාය හෝ පාර්ශ්වය පදනම් කරගෙන ශ්‍රී ලංකාව තුළ කිසිදු ආකාරයක වෙනස් කොට සැලකීමට හෝ අසාධාරණ භේදයකට ලක් නොකළ යුතුය.

ජාත්‍යන්තර භික්ෂූන්ට ශ්‍රී ලංකාවේ සිවිල් නීතිය, ධර්මවිනය සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට යටත්ව ශ්‍රී ලංකාව තුළ නිදහසේ ධර්මවිනය හැදෑරීමටත්, ශාසනික ප්‍රතිපත්ති පිරීමටත්, වාසය කිරීමටත් අයිතිය ඇත.

ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලා සහ බෞද්ධ ජනතාව විසින් ජාත්‍යන්තර භික්ෂූන්ට මෙරට වාසය කරමින් ධර්මවිනය හැදෑරීමටත් ශාසනික ප්‍රතිපත්ති පිරීමටත් අවශ්‍ය සහාය සැපයීම බුද්ධශාසනයේ චිරස්ථිතිය සහ වර්ධනය සඳහා හේතු වේ.

සිව්වෙනි පරිච්ඡේදය:
භාෂාව, බෞද්ධ කොඩිය, ධර්ම චක්‍රය සහ ශාසන දිනය

ශාසනික භාෂාව

ථේරවාද සම්ප්‍රදාය තුළ ආරක්ෂා වී ඇති ත්‍රිපිටකය, අර්ථකථා සහ ටීකා සියල්ල පාලි භාෂාවෙන් රචනා වී ඇත. එසේ ම ථේරවාද සම්ප්‍රදාය තුළ භික්ෂූන් වහන්සේලාගේ අපලෝකන කර්මය හැර ඤත්ති කර්ම, ඤත්තිදුතිය කර්ම සහ ඤත්තිචතුත්ථ කර්මය යන විනයකර්ම සිදු කළ යුත්තේ සහ සිදු කරනු ලබන්නේ පාලි භාෂාවෙනි. එබැවින් ශ්‍රී ලංකාව තුළ ථේරවාද භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධාන ශාසනික භාෂාව පාලි භාෂාව වේ.

තථාගතයන් වහන්සේ “**න, භික්ඛවෙ, බුද්ධවචනං ඡන්දසො ආරොපෙතබ්බං. යො ආරොපෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි, භික්ඛවෙ, සකාය නිරුත්තියා බුද්ධවචනං පරියාපුණිතුං**” යැයි බුද්ධවචනය සංස්කෘත ශ්ලෝකවලට නඟා රක්ෂා කිරීම වාරණය කර, “ස්වකීය භාෂාවෙන්”[1] බුද්ධවචනය හැදෑරීමට අනුදැන වදාළහ. එහෙත්, බුද්ධවචනය වෙනත් භාෂාවකට පරිවර්තනය කිරීම, වෙනත් භාෂාවකින් ඉගැන්වීම හෝ දේශනා කිරීම තථාගතයන් වහන්සේ කිසිදු තැනක වාරණය කර නොමැත. එබැවින් ථේරවාද බුද්ධ ධර්මය කවර භාෂාවකින් වුව ද ලිවීමට, පරිවර්තනය කිරීමට, ඉගැන්වීමට සහ දේශනා කිරීමට ධර්මවිනයෙන් හෝ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවෙන් කිසිදු බාධාවක් නැත්තේ ය.

ශාසනික විභාග සඳහා භාවිතා වන භාෂා

නිස්සයමුත්තක, පරිසුපට්ඨාපක, ත්‍රිපිටකාචාර්‍ය, ත්‍රිපිටක විශාරද වැනි විභාග සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් ලිවිය හැකි ය. ප්‍රාචීන භාෂෝපකාර සමිතිය විසින් පවත්වනු ලබන රාජකීය පණ්ඩිත විභාගය සිංහල භාෂාවෙන් පවත්වා ගෙන එනු ලැබේ.

ජාත්‍යන්තර භාෂා ඉගෙනීම

ථේරවාද බුදු දහම ලෝකය පුරා ප්‍රචාරය වන තරමට ලෝක සත්ත්වයාට යහපත සැලසේ. තථාගතයන් වහන්සේ විසින් ද තමන් වහන්සේගේ මුල් ශ්‍රාවකයන් හැට නමට, දෙදෙනෙකු එක මඟ නොගොස් හැකි තරම් ධර්මය ප්‍රචාරය කරන ලෙස අවවාද කළහ.

එබැවින් ථේරවාද ධර්මය ලොව පුරා ප්‍රචාරය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලා උපරිම උත්සාහය ගත යුතු ය. ඒ සඳහා ඉංග්‍රීසි, ස්පාඤ්ඤ, ප්‍රංශ, ජර්මන්, චීන, හින්දි, උර්දු වැනි ලොව ප්‍රචලිත භාෂා

---

[1] ථේරවාද පාලි අටුවාවලට අනුව “සක නිරුත්ති” යනු තථාගතයන් වහන්සේගේ ස්වකීය භාෂාව වන මාගධී (පාලි) භාෂාවයි. එහෙත්, සමහර බෞද්ධ සම්ප්‍රදායවල “සක නිරුත්ති” යන්නෙන් අදහස් කරනුයේ ඒ ඒ ප්‍රදේශවල ජනතාවගේ ස්වකීය භාෂාවයි. කෙසේ වෙතත්, බුද්ධවචනය සංස්කෘත ශ්ලෝකවලට නඟා රක්ෂා කිරීම විනයෙන් වාරණය කර ඇති නමුත්, බුද්ධවචනය වෙනත් භාෂාවකට පරිවර්තනය කිරීම, වෙනත් භාෂාවකින් ඉගැන්වීම හෝ දේශනා කිරීම කිසිදු තැනක වාරණය කර නොමැත.

	ඉගෙනීමටත්, එම භාෂාවලින් ධර්මය ලිවීමට, ඉගැන්වීමට සහ දේශනා කිරීමටත් භික්ෂූන් වහන්සේලා උනන්දු විය යුතු ය.
බෞද්ධ කොඩිය	ශ්‍රී ලංකාව තුළ බුද්ධ ශාසනය නියෝජනය කරන කොඩිය ලෙස සැලකිය යුත්තේ නීල, පීත, ලෝහිත, ඕදාත, මඤ්ජෙට්ඨ සහ පභස්සර යන වර්ණ හයෙන් යුක්ත බෞද්ධ කොඩිය යි. එය දෙවන උපලේඛනයේ නිරූපිත ය.
ධර්ම චක්‍රය	ශ්‍රී ලංකාව තුළ බුද්ධ ශාසනය නියෝජනය කරන ලාංඡනය විය යුත්තේ අර විසි හතරක් (24) සහිත ධර්ම චක්‍රය යි. එහි අර විසි හතර මඟින් ආර්ය සත්‍යයන්ගේ අංග නිරූපණය කෙරේ. එය තුන්වන උපලේඛනයේ නිරූපිතය. ආර්ය සත්‍යයන්ගේ අංග මෙසේ ය: දුඃඛාර්ය සත්‍යයේ අංග වන්නේ ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, අප්පිය සම්පයෝග, පිය විප්පයෝග, ඉච්ඡාලාභ දුක්ඛය සහ පඤ්චුපාදානක්ඛන්ධය යන අංග දොළස (12) යි. සමුදයාර්ය සත්‍යයේ අංග වන්නේ කාම තණ්හා, භව තණ්හා සහ විභව තණ්හා යන අංග තුන (3) යි. නිරෝධාර්ය සත්‍යයේ අංග වන්නේ ස්කන්ධයන්ගේ අනුත්පාද නිරෝධ සංඛ්‍යාත නිර්වාණ ධාතුව නම් එක ම අංගය (1) යි. මාර්ගාර්ය සත්‍යයේ අංග වන්නේ සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති සහ සම්මාසමාධි යන අංග අට (8) යි.
ශාසන දිනය	ශ්‍රී ලංකාවේ එක්සත් සංඝ සංස්ථාවේ ශාසන දිනය සෑම වර්ෂයක ම වෙසක් පුර පසළොස්වක පොහෝ දිනය වන්නේ ය.

පස්වෙනි පරිච්ඡේදය:
ශාසනික කටයුතු මෙහෙයවීමේ මූලධර්ම සහ භික්ෂූන්ගේ මූලික යුතුකම්

ශාසනික කටයුතු මෙහෙයවීමේ මූලධර්ම

මෙහි සඳහන් ශාසනික කටයුතු මෙහෙයවීමේ මූලධර්ම, සංඝ සංස්ථාව කෙරෙහි බලපවත්වන කතිකා සම්මත කිරීමේ දී, ඒවා ක්‍රියාත්මක කිරීමේ දී සහ බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය පිණිස විධිවිධාන සැලසීමේ දී, උත්තරීතර සංඝ සභාව, සංඝභාර නිත්ථාරක සභාව, සංඝාධිකරණ, නිකාය සහ පාර්ශ්වයන්ගේ කාරක සභා සහ අධිකරණ ඇතුළු සියලු ශාසන අධිකාරි ආයතන විසින් ගරු කොට අනුගමනය කළ යුතු ය.

(1). ශ්‍රී ලංකාව තුළ බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය පිණිස සියලු ශාසන අධිකාරි ආයතන කැපවී ක්‍රියා කළ යුතු අතර, ඒ සඳහා පහත සඳහන් අරමුණු ප්‍රවර්ධනය කළ යුතු ය.

(i). සියලු භික්ෂූන් වහන්සේලාගේ මූලික විනය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ ඒවා සම්පූර්ණයෙන් භුක්ති විඳීම සඳහා අවශ්‍ය පරිසරය සැලසීම.

(ii). ධර්මවිනය ඥානයෙන් සහ ප්‍රතිපත්තියෙන් පිරිපුන් සංඝ සංස්ථාවක් සහ සිල්මාතා සංස්ථාවක් බිහි කිරීම.

(iii). සංඝයා වහන්සේලා සහ සිල්මාතාවරුන් අතර ධර්මවිනය පිළිබඳ නොදැනුවත්කම තුරන් කිරීම සහ ධර්මවිනය අධ්‍යාපනයේ දී සියලු දෙනාට සර්ව සාධාරණ සහ සමාන අවස්ථා සහතික කිරීම.

(iv). සියලු භික්ෂූන් වහන්සේලාට තමන්ටත්, තම විහාරස්ථානවල වාසය කරන සබ්‍රහ්මචාරීන් වහන්සේලාටත් සහ සියලු සිල්මාතාවරුන්ටත් ප්‍රමාණවත් පරිදි සිව්පසය ලැබීමට සුදුසු පරිසරයක් සකස් කිරීම.

(v). ශ්‍රී ලංකාව තුළ පවතින සාංඝික දේපළ සහ බුද්ධ ශාසනයට පූජා කරන ලද දේපළ ආරක්ෂා කර ගනිමින් ශාසනාන්තර්ධානය දක්වා ඒවා පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලසීම.

(vi). ගිහි බෞද්ධයන්ගේ ධර්මවිනය ඥානය සහ බෞද්ධ ගිහි ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීම.

(vii). ශ්‍රී ලංකාව තුළ බෞද්ධ සංස්කෘතියේ චිරස්ථිතිය සහ අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම.

(viii). විහාරස්ථානය සංඝ සංස්ථාවේ මූලික පරිපාලන ඒකකය වශයෙන් පිළිගෙන එහි ස්ථාවරත්වය සහ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.

(2). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්මවල ප්‍රධාන අරමුණක් වන ධර්මිෂ්ඨ සමාජයක් බිහි කිරීමේ රාජ්‍ය අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සියලු ශාසන අධිකාරි ආයතන ශාසනානුලෝමී ලෙස ශ්‍රී ලංකා රජය සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු ය.

(3). ධම්මපදට්ඨකථාවේ මාර වස්තුවෙහි දැක්වෙන තථාගතයන් වහන්සේගේ ආදර්ශයට අනුගත වෙමින්, ශ්‍රී ලංකාවේ දේශපාලන බලය අත්පත් කර ගැනීම හෝ බලයේ සිටින රජයක් හෝ පුද්ගලයෙකු බලයෙන් පහ කිරීම අරමුණු කරගත් දේශපාලන ක්‍රියාකාරකම්වලට කිසිදු ශාසන අධිකාරි ආයතනයක් මැදිහත් නොවිය යුතු ය.

(4). බුදු සසුනේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය පිණිස කටයුතු කරන සෑම අවස්ථාවක දී ම, ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිට ජාතීන් අතර සංහිඳියාවට හෝ සහජීවනයට හානි නොවන අයුරින් කටයුතු කිරීම සියලු ශාසන අධිකාරි ආයතනවල යුතුකම වන්නේ ය.

(5). "**සුඛා සඞ්ඝස්ස සාමග්ගී**" යන බුද්ධ දේශනාව සිහි කරමින්, සියලු ශාසන අධිකාරි ආයතන ධර්මවිනයානුකූලව සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුව කටයුතු කරන සෑම අවස්ථාවක දී ම, නිකාය සහ පාර්ශ්ව අතර සාමග්‍රිය, සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය ගෞරවය වර්ධනය වන අයුරින් කටයුතු කිරීමට උපරිම උත්සාහය ගත යුතු ය.

(6). අනෙකුත් රටවල ථේරවාද ශාසන අධිකාරි ආයතන සමඟ යහපත් සම්බන්ධතා පවත්වාගෙන යමින් සහ අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය කර ගනිමින්, දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද ථේරවාද බුදු සසුනේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය පිණිස කටයුතු කිරීම ශ්‍රී ලංකාවේ සියලු ශාසන අධිකාරි ආයතනවල යුතුකම වන්නේ ය.

භික්ෂූන්ගේ මූලික යුතුකම්

ශ්‍රී ලංකාවේ සංඝ සංස්ථාව නියෝජනය කරන සියලු භික්ෂූන් වහන්සේලාගේ සහ ශ්‍රී ලංකාවේ සියලු සිල්මාතාවරුන්ගේ මූලික යුතුකම් පහත පරිදි වන්නේ ය.

(i). බුද්ධ, ධම්ම සහ සංඝ යන ත්‍රිවිධ රත්නය තමන්ගේ උතුම්ම සරණ ලෙස පිළිගෙන, ඒ පිළිබඳ අත්‍යන්ත ගෞරවයෙන් යුතුව තමන්ගේ සියලු ශාසනික කටයුතු සිදු කිරීම.

(ii). ධර්මවිනයට, උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට සහ උත්තරීතර සංඝ සභාව විසින් ස්ථාපිත කරනු ලබන කතිකාවන්ට ගරු කරමින් ඒවා අනුගමනය කිරීම.

(iii). "**අනුජානාමි, භික්ඛවෙ, රාජූනං අනුවත්තිතුං**" යන බුද්ධාවවාදයට අනුව, රජවරුන් විසින් පනවනු ලබන ධාර්මික නීතිවලට අනුගත විය යුතුය. ඒ අනුව, ශ්‍රී ලංකාවේ වාසය කරන විට ශ්‍රී ලංකාවේ නීතියට ද, වෙනත් රටක වාසය කරන විට එම රටේ නීතියට ද ගරු කරමින් කටයුතු කිරීම.

(iv). තථාගතයන් වහන්සේගේ අපේක්ෂාව අනුව, නොපැහැදුනුවන් පහැදෙන ආකාරයෙන් සහ පැහැදුනුවන්ගේ පැහැදීම වර්ධනය වන ආකාරයෙන් තමන්ගේ කායික, වාචසික සහ මානසික ක්‍රියාවන් පවත්වාගෙන යාමට උත්සාහවත් වීම.

(v). අනෙකුත් භික්ෂූන් වහන්සේලාගේ මූලික විනය අයිතිවාසිකම්වලට ගරු කිරීම.

(vi). "**මහණෙනි, මාගේ ශාසනයෙහි අන්තිම ශ්‍රාවකයෝ නොවව්!**" යන බුද්ධාවවාදය සිහි කරමින්, පර්‍යාප්ති ශාසනයෙහි සහ ප්‍රතිපත්ති ශාසනයෙහි නියැලෙමින් ප්‍රතිවේධ ශාසනය අධිගමනය සඳහා උත්සාහවත් වීම සහ තමන්ගේ සබ්‍රහ්මචාරීන් වහන්සේලා, ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ සිල්මාතාවරුන් ද ඒ සඳහා යොමු කිරීම.

(vii). බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය පිණිස තමන්ට හැකි සෑම ආකාරයකින් ම දායක වීම.

(viii). බුද්ධ ශාසනය චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය පිණිස කරන කටයුතු සෑම විට ම කරුණාධ්‍යාශය මුල් කර ගෙන සිදු කිරීම.

(ix). බුදු සසුනේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය පිණිස කටයුතු කරන සෑම අවස්ථාවක දී ම, ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිට ජාතීන් අතර සංහිඳියාවට හානි නොවන අයුරින් කටයුතු කිරීම.

(x). සියලු සාංඝික දේපළ සුරක්ෂිත කොට ආරක්ෂා කිරීම සහ සාංඝික දේපළ අයථා ලෙස ප්‍රයෝජනයට ගැනීම සහ නාස්ති කිරීම වැළැක්වීම සඳහා ක්‍රියා කිරීම.

(xi). ධර්මවිනයට සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුව තම ශාසනික කටයුතු සිදු කරන සෑම අවස්ථාවක දී ම, සංඝයා අතර අසමගිය ඇති කරන ක්‍රියාකාරකම්වලින් වැළකී, "**සුඛා සඞ්ඝස්ස සාමග්ගී – සමග්ගානං තපො සුඛො**" යන බුද්ධාවවාදය නිති සිහි තබා ගනිමින්, සංඝ සාමග්‍රිය,

	සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය ගෞරවය ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම.

හයවෙනි පරිච්ඡේදය:
උත්තරීතර සංඝ ව්‍යවස්ථා මූලධර්ම

ධර්මවිනයේ උත්තරීතරභාවය	**"යො වො, ආනන්ද, මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්ථා"** යන තථාගතයන් වහන්සේගේ අවවාදයට අනුව, තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව ථේරවාද සම්ප්‍රදායේ සංගායනා හයෙන් අනුමත කරන ලද "ධර්මය" සහ "විනය" සියලු ශාසනික කටයුතුවල දී උත්තරීතර වන්නේ ය. උත්තරීතර සංඝ ව්‍යවස්ථාව ඇතුළු සියලුම ශාසනික කතිකාවත් සහ තීරණ ධර්මවිනය මත පදනම්ව, එයට පටහැනි නොවන පරිදි සම්මත කරනු ලැබිය යුතුය.
සංඝයාගේ ස්වාධීනත්වය	සංඝයා විසින් තමන්ගේ පාලනය සහ නියාමනය පිණිස ද බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය පිණිස ද කතිකාවත් සම්මත කිරීමේ දී, තීන්දු තීරණ ගැනීමේ දී සහ ශාසනික කටයුතු පවත්වාගෙන යාමේ දී ධර්මවිනයට, උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට සහ ශ්‍රී ලංකාවේ පවතින නීතියට පටහැනි නොවන අයුරින් කටයුතු කළ යුතුය. එසේ කටයුතු කිරීමේ දී සංඝයා වෙනත් කිසිදු අධිකාරියක නියෝගයට යටත් නොවී, ධර්මවිනයට අනුව ස්වාධීනව තම කාර්යභාරය ඉටු කළ යුතුය.
නීතියේ ආධිපත්‍යය	ධර්මවිනය සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාව ශාසනයේ උත්තරීතර නීතිය වේ. කිසිදු ශාසන අධිකාරි ආයතනයකට, නිකායකට, පාර්ශ්වයකට හෝ ශාසන සාමාජිකයෙකුට ධර්මවිනයට හෝ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කිරීමට, තීරණ ගැනීමට හෝ බලය ක්‍රියාත්මක කිරීමට බලයක් නොමැත. ශාසනික කටයුතුවල දී සියලුම ශාසන අධිකාරි ආයතන සහ ශාසන සාමාජිකයෝ ධර්මවිනයට හා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට යටත්ව කටයුතු කළ යුතු අතර, පුද්ගලයන්ගේ අභිමතය නොව ධර්මවිනයේ සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවේ ආධිපත්‍යය පිළිගත යුතුය. කිසිදු ශාසන අධිකාරි ආයතනයක් හෝ ශාසන සාමාජිකයෙක් ධර්මවිනයට හෝ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට ඉහළින් නොසිටිය යුතුය.
ස්වභාවික යුක්ති මූලධර්මය	ශාසන අධිකාරි ආයතන විසින් ගනු ලබන සියලුම පරිපාලන සහ අධිකරණමය තීරණ ධර්මවිනයට, උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට සහ ස්වභාවික යුක්ති මූලධර්මයට අනුකූල විය යුතුය. කිසිදු ශාසන සාමාජිකයෙකුට බලපාන තීරණයක්, ඔහුට හෝ ඇයට සාධාරණ ලෙස කරුණු දැක්වීමට අවස්ථාව ලබා නොදී හෝ අපක්ෂපාතී විනිශ්චයකින් තොරව නොගත යුතුය.

සංඝ සාමග්‍රිය

සංඝ සාමග්‍රිය බුද්ධ ශාසනයේ චිරස්ථිතියට, ස්ථාවරත්වයට, දියුණුවට සහ පැතිරීමට අත්‍යවශ්‍ය සාධකයකි. සංඝ සාමග්‍රියට හානි විය හැකි අවස්ථාවල දී ඇතැම් විනය කර්ම පවා නොකළ යුතු බව තථාගතයන් වහන්සේ කෝසම්බක්ඛන්ධකයේ දී දේශනා කළහ. එබැවින් උත්තරීතර සංඝ ව්‍යවස්ථාව අනුව කටයුතු කරන සෑම අවස්ථාවක ම, ධර්මවිනයට අනුකූලව සංඝ සාමග්‍රිය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම සියලු ශාසන අධිකාරි ආයතනවල සහ ශාසන සාමාජිකයන්ගේ මූලික වගකීම වන්නේ ය.

සංඝ සම්මුතිය

ශාසනික කටයුතුවල දී හැකි සෑම අවස්ථාවක ම සාකච්ඡාව, සම්මුතිය සහ අන්‍යෝන්‍ය අවබෝධය මත තීරණ ගැනීමට ප්‍රමුඛත්වය දිය යුතුය. බහුතර තීරණ ගැනීම අවශ්‍ය වන අවස්ථාවල දී පවා, සංඝ සාමග්‍රිය ආරක්ෂා වන අයුරින් කටයුතු කළ යුතුය.

බලය බෙදීම

බලය එක් ආයතනයක් හෝ පුද්ගලයෙකු අත සංකේන්ද්‍රණය වීම වැළැක්වීම පිණිස, උත්තරීතර සංඝ ව්‍යවස්ථාව මඟින් ශාසනික බලතල ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල ලෙස වෙන් කරනු ලැබේ. එම බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ශාසන අධිකාරි ආයතන පිහිටුවනු ලැබේ.

ශාසන අධිකාරි ආයතනය	ප්‍රධාන කාර්යභාරය
උත්තරීතර සංඝ සභාව	ව්‍යවස්ථාදායකය
සංඝභාර නිත්ථාරක සභාව	විධායකය
සංඝාධිකරණ	අධිකරණය

එම ආයතන එකිනෙකට ස්වාධීනව, අන්‍යෝන්‍ය ගෞරවයෙන් සහ මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව තම බලතල ක්‍රියාත්මක කළ යුතු අතර, කිසිදු ආයතනයක් වෙනත් ආයතනයකට පැවරී ඇති බලතල අත්පත් කර නොගත යුතුය.

විනිවිද භාවය

සියලුම ශාසන අධිකාරි ආයතන තම බලතල සහ කාර්යයන් ධර්මවිනයට හා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුකූලව විවෘතභාවයෙන්, සාධාරණභාවයෙන් සහ විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාත්මක කළ යුතුය. තථාගතයන් වහන්සේගේ ක්‍රියාකලාපය ආදර්ශයට ගනිමින්, ශාසනික කටයුතුවල දී ගනු ලබන තීරණ හැකි සෑම අවස්ථාවක ම හේතු සහිතව ගනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු අදාළ පාර්ශ්වයන් වෙත ලබා දිය යුතුය.

වගවීම

සියලුම ශාසන අධිකාරි ආයතන සහ ඒවායේ නිලධාරීන් විසින් තමන්ට පවරා ඇති බලතල ධර්මවිනයට හා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුකූලව පමණක් ක්‍රියාත්මක කළ යුතු අතර,

	තමන් විසින් ගනු ලබන තීරණ සහ ක්‍රියාවන් සම්බන්ධයෙන් වගකිව යුතුය. බලය අයුතු ලෙස භාවිත කිරීම, බලය ඉක්මවා කටයුතු කිරීම හෝ තම වගකීම් පැහැර හැරීම මෙම ව්‍යවස්ථාවට අනුව විමර්ශනයට හා අවශ්‍ය ක්‍රියාමාර්ගවලට යටත් වන්නේ ය.
නීතිය ඉදිරියේ සමානත්වය	උපසම්පදා ජ්‍යෙෂ්ඨත්වය ඇතුළු ධර්මවිනයෙන් සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවෙන් පිළිගත් වෙනස්කම් හැර, සියලුම ශාසන සාමාජිකයෝ ධර්මවිනය හා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව ඉදිරියේ සමාන වෙති. කිසිවෙකුගේ නිකාය, පාර්ශ්වය, ජාතිය, වර්ගය, කුලය, භාෂාව හෝ වෙනත් කිසිදු හේතුවක් මත විශේෂ අසාධාරණ වරප්‍රසාදයක් ලබා නොදිය යුතු අතර, අසාධාරණ අගතියකට ද ලක් නොකළ යුතුය.
මූලධර්මවල අර්ථකථනය	මෙම පරිච්ඡේදයේ සඳහන් මූලධර්ම, උත්තරීතර සංඝ ව්‍යවස්ථාවේ සියලුම විධිවිධාන අර්ථකථනය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ දී මූලික මඟපෙන්වීම් ලෙස සැලකිය යුතුය. ව්‍යවස්ථාවේ විධිවිධානයක් පිළිබඳ සැකයක් හෝ අර්ථකථන ගැටලුවක් ඇති වන අවස්ථාවක, එම විධිවිධානය මෙම මූලධර්මවලට හා ධර්මවිනයට අනුකූල වන අයුරින් අර්ථකථනය කළ යුතුය.

හත්වෙනි පරිච්ඡේදය: ශ්‍රී ලංකා උත්තරීතර සංඝ සභාව

ශ්‍රී ලංකා උත්තරීතර සංඝ සභාව පිහිටුවීම	ශ්‍රී ලංකාව තුළ පවතින ශාසන අර්බුදය විනයානුකූලව සහ ස්ථිර ලෙස විසඳීමට ඇති එක ම ක්‍රමය වන්නේ සියලු පාර්ශ්වයන් නියෝජනය වන පරිදි උත්තරීතර සංඝ සභාවක් පිහිටුවීම ය. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය පිණිස ශ්‍රී ලංකාව තුළ පවතින සියලු හෝ බහුතරයක් ථේරවාද භික්ෂු නිකාය සහ පාර්ශ්ව නියෝජනය වන පරිදි උත්තරීතර සංඝ සභාවක් පිහිටුවිය යුතුය. එය "ශ්‍රී ලංකා උත්තරීතර සංඝ සභාව" ("උත්තරීතර සංඝ සභාව") නමින් හැඳින්විය යුතුය.
උත්තරීතර සංඝ සභාවේ කර්තව්‍යයන්	උත්තරීතර සංඝ සභාවේ ප්‍රධාන කර්තව්‍යයන් පහත පරිදි ය. (1). සුත්ත, සුත්තානුලෝම, ආචරියවාද සහ අත්තනොමති යන චතුර්විධ විනයට සහ මහාපරිනිර්වාණ සූත්‍රයේ සඳහන් මහාපදේශයන්ට අනුව ධර්මය සහ විනය නිර්වචනය කිරීම. (2). ධාර්මික සංඝ කතිකාවත් සම්මත කිරීම. (3). තථාගතයන් වහන්සේ විසින් ලබා දුන් අවසරය අනුව අවශ්‍ය නම් උත්තරීතර සංඝ ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුගමනය කරමින් ඛුද්දානුඛුද්දක ශික්ෂාපද සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමූහනය කිරීම. (4). සංඝභාර නිත්ථාරක සභාවේ කටයුතු අධීක්ෂණය කිරීම. (5). සංඝාධිකරණවල කටයුතු අධීක්ෂණය කිරීම. (6). ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව, උත්තරීතර සංඝාධිකරණයේ සහ කාරක සංඝාධිකරණයේ විනිශ්චයකාර ස්ථවිරයන් පත් කිරීම සහ ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම. (7). උත්තරීතර සංඝ ව්‍යවස්ථාවෙන් උත්තරීතර සංඝ සභාව වෙත පවරා ඇති අනෙකුත් කර්තව්‍යයන් ඉටු කිරීම.
උත්තරීතර සංඝ සභාවේ බලතල	මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන මඟින් විශේෂයෙන් සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීම අවශ්‍ය වන්නේ නම්, ධර්මයට, විනයට සහ මෙම ව්‍යවස්ථාවට පටහැනි නොවන පරිදි, මෙම ව්‍යවස්ථාවේ නියමිත තීරණ ගැනීමේ ක්‍රියාපටිපාටිය අනුව එවැනි තීරණ ගැනීමට උත්තරීතර සංඝ සභාවට බලය ඇත.

උත්තරීතස සංඝ සභාවේ සාමාජික ගණන	මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙන් පැවැත්වූ ප්‍රථම ධර්ම සංගායනාව ඇතුළු ධර්ම සංගායනාවල සම්ප්‍රදාය අනුගමනය කරමින් සහ සකල සංඝයාගේ පුළුල් නියෝජනයක් තහවුරු කිරීමේ අරමුණින්, උත්තරීතර සංඝ සභාවේ සාමාජික සංඛ්‍යාව පන්සියයකට නොඅඩු විය යුතුය. ඒ අනුව මෙම ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලබන උත්තරීතර සංඝ සභාවේ සමස්ත සාමාජික සංඛ්‍යාව 602 ක් වේ.
උත්තරීතර සංඝ සභාවේ සංයුතිය	උත්තරීතර සංඝ සභාව කොටස් තුනකින් සමන්විත ය. (1). මහා නායක මණ්ඩලය (ධර්ම-විනය සහ ව්‍යවස්ථා ආරක්ෂක මණ්ඩලය): පාර්ශ්ව 31 හි මහා නායක ස්ථවිරයන් වහන්සේලා 31 (2). ස්ථවිර සභාව: එක් පාර්ශ්වයකින් සාමාජිකයන් දෙදෙනෙකු බැගින් නියෝජනය කරන සභාව. සාමාජිකයන් ගණන 62 (3). මහා සංඝ සභාව: එක් එක් පාර්ශ්වයක අනුනායක ස්ථවිරවරුන් ඇතුළුව සියලු භික්ෂූන් වහන්සේලාගේ ප්‍රතිශතය අනුව තොරාගත් සාමාජිකයන් නියෝජනය කරන සභාව. සාමාජිකයන් ගණන 509
උත්තරීතර සංඝ සභාවේ ධුර කාලය	වරක් පිහිටුවනු ලබන උත්තරීතර සංඝ සභාවක ධුර කාලය චන්ද්‍ර මාස ගණනය අනුව වර්ෂ පහකුත් මාස එකොළහකුත් වන්නේ ය. එම ධුර කාලය අවසන් වීමෙන් අනතුරුව මසක් ඇතුළත නව උත්තරීතර සංඝ සභාවක් පිහිටුවිය යුතුය. කෙසේ වුව ද, උත්තරීතර සංඝ සභාවේ ධුර කාලය අවසන් වීම හේතුවෙන් උත්තරීතර මහා නායක මණ්ඩලය, ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලය, ලේඛකාධිකාරී මණ්ඩලය සහ මහා සංඝ සභාවේ අනුනායක මණ්ඩලය විසිර ගිය බවක් නොසැලකිය යුතු අතර, එම මණ්ඩලවල පැවැත්ම සහ බලතල අඛණ්ඩව පවතින්නේ ය. ඉහත සඳහන් මණ්ඩලවල සාමාජිකයන් හැර, උත්තරීතර සංඝ සභාවේ අනෙකුත් සියලු සාමාජික ස්ථවිරයවරුන්ගේ ධුර කාලය උත්තරීතර සංඝ සභාවේ ධුර කාලය සමඟ අවසන් වන්නේ ය. එම සාමාජිකයන් හෝ වෙනත් සුදුසු සාමාජිකයන් ඒ ඒ නිකාය සහ පාර්ශ්වයන්ගේ කාරක සංඝ සභා විසින් මෙම ව්‍යවස්ථාවට අනුව නැවත නම් කර පත් කළ යුතුය. උත්තරීතර සංඝ සභාවේ ධුර කාලය අවසන් වීමත් සමඟ එහි පයඥප්ති කමිටු, කාරක සභා සහ අධීක්ෂණ කාරක සභා සියල්ල විසිර යන්නේ ය. නව උත්තරීතර සංඝ සභාව පිහිටුවීමෙන් අනතුරුව එම කමිටු සහ කාරක සභා නැවත පිහිටුවිය යුතුය.

උත්තරීතර සංඝ සභාව පිහිටුවීම	උත්තරීතර සංඝ සභාවේ ධුර කාලය අවසන් වීමෙන් අනතුරුව මසක් ඇතුළත නව උත්තරීතර සංඝ සභාව පිහිටුවිය යුතුය. කෙසේ වුව ද, සෑම අවස්ථාවක දී ම බක් මස පුර පසළොස්වක පොහෝ දිනට පෙර නව උත්තරීතර සංඝ සභාව පිහිටුවීම සහතික කළ යුතුය. නව උත්තරීතර සංඝ සභාව, මෙම ව්‍යවස්ථාවට අනුව ඒ ඒ නිකාය සහ පාර්ශ්වයන් විසින් නම් කරනු ලබන සාමාජික ස්ථවිරයන්ගෙන් සමන්විත වන අතර, උත්තරීතර මහා නායක මණ්ඩලය විසින් එය විධිමත් ලෙස පිහිටුවනු ලැබේ.
මහා නායක මණ්ඩලය	තථාගතයන් වහන්සේගේ ශාසනයෙහි ගුණයෙන් හා තපසින් වෘද්ධ මහා ස්ථවිරයන් වහන්සේලා සංඝ පරිණායකයන් වශයෙන් සැලකෙන අතර, භික්ෂූන් වහන්සේලාට අවවාද හා අනුශාසනා ලබා දෙමින් ධර්මයෙහි සහ විනයෙහි සංඝයා පිහිටුවීමේ සහ හික්මවීමේ සහ භික්ෂූන් වහන්සේලා අතර සමඟිය වර්ධනය වීමට උපදෙස් ලබා දීමේ වගකීම ඔවුන් වෙත පැවරේ. සංඝ සාමග්‍රිය, ධර්මය, විනය සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාව රක්ෂා කිරීමේ වගකීම සහිතව සියලු නිකාය සහ පාර්ශ්වයන්වල මහා නායක ස්ථවිරයන් වහන්සේලාගෙන් සමන්විත “මහා නායක මණ්ඩලය” උත්තරීතර සංඝ සභාව තුළ පිහිටුවිය යුතුය.
සංඝ සාමග්‍රිය ආරක්ෂා කිරීමේ වගකීම	ශාසන ඉතිහාසය පුරා ශාසනයේ අර්බුදකාරී අවස්ථාවන්හිදී මහා සංඝයා කටයුතු කර ඇත්තේ ඒ ඒ යුගවල විසූ ගුණවෘද්ධ, තපෝවෘද්ධ මහා ස්ථවිරයන් වහන්සේලාගේ මඟපෙන්වීම යටතේ ය. ඒ අනුව සංඝ සාමග්‍රිය ආරක්ෂා කිරීමේ ප්‍රමුඛ වගකීම මහා නායක මණ්ඩලය වෙත පැවරේ.
ධර්මය, විනය සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාව රක්ෂා කිරීමේ වගකීම	මේ ආකාරයෙන් මහා නායක මණ්ඩලය ධර්මය, විනය සහ ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව ආරක්ෂා කරන අනුශාසක හා නිරීක්ෂණ මණ්ඩලයක් ලෙස ක්‍රියා කරයි. මහා නායක මණ්ඩලය විසින් උත්තරීතර සංඝ සභාවට ධර්මය, විනය සහ ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම සඳහා අනුශාසනා සහ මඟපෙන්වීම් ලබා දිය යුතුය. එමෙන්ම උත්තරීතර සංඝ සභාව විසින් ගනු ලබන තීරණ ධර්මයට, විනයට සහ ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුකූල ද යන්න නිරීක්ෂණය කිරීම ද මහා නායක මණ්ඩලයේ කාර්යභාරයකි. යම් හෙයකින් උත්තරීතර සංඝ සභාව විසින් ගනු ලැබූ තීරණයක් ධර්මයට, විනයට හෝ ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට පටහැනි විය හැකි යැයි මහා නායක ස්ථවිරයන් වහන්සේ නමකට පෙනී යන්නේ නම්, එම කරුණ මහා නායක මණ්ඩලය වෙත හෝ තමන්ගේ නිකායේ අවශේෂ මහා නායක හිමිවරුන්

	වෙත ඉදිරිපත් කළ හැක. එම කරුණ සලකා බැලීමෙන් අනතුරුව, මහා නායක මණ්ඩලයේ බහුතරයේ හෝ අදාළ නිකායේ මහා නායක හිමවරුන්ගේ බහුතරයේ හෝ අවම වශයෙන් නිකාය තුනක් නියෝජනය කරන මහා නායකවරු තුන් දෙනෙකුගේ අනුමැතිය ලැබේ නම්, අදාළ තීරණය නැවත සලකා බැලීම සඳහා උත්තරීතර සංඝ සභාව වෙත යොමු කළ යුතුය.
උත්තරීතර මහා නායක මණ්ඩලය	මහානායක මණ්ඩලය විසින්, එක් එක් නිකාය නියෝජනය වන පරිදි, සෑම නිකායකින් ම මහානායක ස්ථවිරවරයෙකු බැගින් ඇතුළත් වන උත්තරීතර මහානායක මණ්ඩලයක් වසර තුනක කාලයක් සඳහා පත් කළ යුතුය. තම තම නිකාය නියෝජනය කරමින් උත්තරීතර මහානායක මණ්ඩලයට මහානායක ස්ථවිරවරයෙකු තෝරා පත් කර ගැනීමේ ක්‍රියාපටිපාටිය අදාළ නිකායෙහි පාර්ශ්වයන්ගේ කාරක සභාවල එකඟතාවයෙන් සම්මත කර ගත යුතුය. උත්තරීතර මහානායක මණ්ඩලය තම තීරණ ඒකච්ඡන්දයෙන් හෝ, එය නොහැකි වූ විට, බහුතර ඡන්දයෙන් ගත යුතුය.
උත්තරීතර මහා නායක මණ්ඩලයේ කර්තව්‍යය	උත්තරීතර සංඝාධිකරණයේ මූලසුන හොබවන “අග්‍ර සඞ්ගාමාවචර මහාස්ථවිර” තනතුර සඳහා, උත්තරීතර සංඝාධිකරණයේ විනිශ්චය මහාස්ථවිරවරුන් අතුරින් නියමිත සුදුසුකම් සපුරන ලද මහාස්ථවිරවරයෙකු තෝරා පත් කිරීම. උත්තරීතර සංඝාධිකරණයේ විනිශ්චය මහාස්ථවිර තනතුරු සඳහා, කාරක සංඝාධිකරණයේ, මූලික සංඝාධිකරණවල හෝ නිකාය සහ පාර්ශ්ව සංඝාධිකරණවල විනිශ්චයකාර ස්ථවිරවරුන් අතුරින් නියමිත සුදුසුකම් සපුරන ලද මහාස්ථවිරවරුන් තෝරා පත් කිරීම. සංඝභාර නිත්ථාරක සභාවේ මූලසුන හොබවන “ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහාස්ථවිර” තනතුර සඳහා, උත්තරීතර සංඝ සභාවේ මහා සභාවේ අනුනායක මණ්ඩලය නියෝජනය කරන මහාස්ථවිරවරුන් අතුරින් උත්තරීතර මහා නායක මණ්ඩලය සුදුසු යැයි සලකනු ලබන මහාස්ථවිරවරයෙකු තෝරා පත් කිරීම. උත්තරීතර සංඝ සභාවේ සභාවාර මෙහෙයවන “සභානායක මහාස්ථවිර” තනතුර සඳහා, උත්තරීතර සංඝ සභාවේ මහා සභාවේ අනුනායක මණ්ඩලය නියෝජනය කරන මහාස්ථවිරවරුන් අතුරින් උත්තරීතර මහා නායක මණ්ඩලය සුදුසු යැයි සලකනු ලබන මහාස්ථවිරවරයෙකු ව්‍යවස්ථානුකූලව තෝරා පත් කිරීම. උත්තරීතර සංඝ සභාව විසින් ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට හෝ ශ්‍රී ලංකා රජයට යම් අදහසක්, යෝජනාවක් හෝ නිර්දේශයක් ලිඛිතව ඉදිරිපත් කරනු ලබන්නේ නම්, එය එවකට

	උත්තරීතර මහානායක මණ්ඩලයේ මහානායක ස්ථවිරයන් වහන්සේ තුන් නමගේ ම ඒකමතික අනුමැතිය සහ අත්සන් සහිත විය යුතු ය.
ස්ථවිර සභාව	ශාසනය තුළ දීර්ඝ කාලයක් ගුණධර්මයන්හි සහ තපෝගුණයන්හි වර්ධනය වෙමින් සංඝ කටයුතු පිළිබඳ පුළුල් අත්දැකීම් ලබා ඇති මහා ස්ථවිරවරුන් වහන්සේලාට සංඝයාගේ ශුභසිද්ධිය උදෙසා ප්‍රඥා ගෝචර, ප්‍රයෝගික තීරණ ගැනීමේ හැකියාවක් පවතී. එබැවින් සංඝයාට බලපාන වැදගත් තීන්දු තීරණ ගැනීමේ කාර්යය සඳහා, එක් එක් නිකාය සහ පාර්ශ්වය නියෝජනය කරමින් මහා ස්ථවිරවරු දෙදෙනෙකු බැගින් ඇතුළත් වන "ස්ථවිර සභාව" නම් සභාවක් උත්තරීතර සංඝ සභාව තුළ පිහිටුවිය යුතුය.
ස්ථවිර සභාවේ සංයුතිය	ස්ථවිර සභාව එක් එක් පාර්ශ්වය නියෝජනය කරන සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. (1). පළමු අසුන – අදාළ පාර්ශ්වයේ ලේඛකාධිකාරී ස්ථවිරයන් වහන්සේ. (2). දෙවැනි අසුන – අදාළ පාර්ශ්වයේ කාරක සභාව විසින් නම් කරනු ලබන ධර්මධර, විනයධර වස් විස්සක් හෝ ඊට වැඩි වස් ගණනක් ඇති මහා ස්ථවිරයන් වහන්සේ නමක්. දෙවැනි අසුන සඳහා පත් කරනු ලබන ස්ථවිරයන් වහන්සේගේ ධුර කාලය උත්තරීතර සංඝ සභාවේ ධුර කාලයට සමාන වේ. එම ධුර කාලය අවසන් වූ පසු, අදාළ කාරක සභාව කැමති නම් එම මහා ස්ථවිරයන් වහන්සේ ම හෝ වෙනත් මහා ස්ථවිරයන් වහන්සේ නමක් එම ධුරය සඳහා පත් කළ හැකිය.
ස්ථවිර සභාව පිහිටුවීමේ අරමුණ	මෙම සභාව පිහිටුවීමේ අරමුණ වන්නේ සියලු පාර්ශ්වයන්ට සමාන නියෝජනයක් ලබා දීමයි. එමගින් භික්ෂු සංඛ්‍යාව අඩු පාර්ශ්වයන්ට ද තම අදහස් හා මතවාද ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසෙන අතර, භික්ෂු සංඛ්‍යාව වැඩි පාර්ශ්වයන් විසින් අනෙකුත් පාර්ශ්වයන්ගේ අදහස් නොසලකා කතිකා සම්මත කිරීම වැළැක්වේ. ඒ සඳහා ස්ථවිර සභාවේ සෑම පාර්ශ්වයකටම සමාන නියෝජනයක් හිමි වන පරිදි එහි සංයුතිය සකස් කර ඇත.
ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලය	ස්ථවිර සභාව විසින්, එක් එක් නිකාය නියෝජනය වන පරිදි, සෑම නිකායකින් ම ලේඛකාධිකාරී ස්ථවිරවරයෙකු බැගින් ඇතුළත් වන ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලයක් වසර තුනක කාලයක් සඳහා පත් කළ යුතුය.

	තම තම නිකාය නියෝජනය කරමින් ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලයට ලේඛකාධිකාරී ස්ථවිරවරයෙකු තෝරා පත් කර ගැනීමේ ක්‍රියාපටිපාටිය අදාළ නිකායන්ගේ සහ පාර්ශ්වයන්ගේ කාරක සභාවල එකඟතාවයෙන් සම්මත කර ගත යුතුය. ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලය තම තීරණ ඒකච්ඡන්දයෙන් හෝ, එය නොහැකි වූ විට, බහුතර ඡන්දයෙන් ගත යුතුය.
ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලයේ කර්තව්‍යය	ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලය විසින් ශාසන සන්නිවේදන මණ්ඩලයේ කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතු ය. ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෝ ශාසන අරමුදල් මණ්ඩලයේ ද සාමාජිකයෝ වෙති. එබැවින් ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහා ස්ථවිරයන් වහන්සේ සහ ශාසන අරමුදල් මණ්ඩලයේ සෙසු සාමාජිකයන් වන අනුනායක මහා ස්ථවිරයන් වහන්සේලා සමඟ එක්ව, වාර්ෂික ශාසන සංවර්ධන වැඩසටහන සකස් කිරීම, ශාසන සංවර්ධන අරමුදලෙන් ලැබෙන අරමුදල් විනයානුකූලව කළමනාකරණය කිරීම, ඒවා අදාළ ශාසනික ආයතන, ව්‍යාපෘති සහ කාර්යයන් සඳහා වෙන් කිරීම සහ ඒවායේ නිසි භාවිතය අධීක්ෂණය කිරීමේ වගකීම ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලයට පැවරේ.
මහා සංඝ සභාව	මුළු මහත් සංඝයාට ම බලපාන තීන්දු තීරණ ගැනීමේ දී ධර්ම විනයේ මනා පරිචයක් ඇති ස්ථවිරවරුන් විශාල වශයෙන් දායක කර ගැනීම අතිශයින් ම වැදගත් ය. ඒ නිසා උත්තරීතර සංඝ සභාවේ “මහා සංඝ” සභාව සියලු නිකාය සහ පාර්ශ්ව නියෝජනය කරමින් ධර්මය, විනය උගත් භික්ෂූන් වහන්සේලා ගෙන් සමන්විත විය යුතුය. මෙම සභාව පිහිටුවීමේ අරමුණ වන්නේ සමස්ත භික්ෂු සංඝයාගේ අනුපාතික නියෝජනය සහතික කරමින්, පාර්ශ්වයන්ගේ භික්ෂූන්ගේ සංඛ්‍යාත්මක ශක්තියට අනුකූලව ඔවුන්ගේ අදහස් හා යෝජනා සමස්ථ සංඝයාගේ පාලනයට සහ නියාමනයට දායක කර ගැනීමයි.
මහා සංඝ සභාවේ සංයුතිය	මහා සංඝ සභාවේ සාමාජිකත්වය එක් එක් නිකායන්ට සහ පාර්ශ්වයන්ට හිමි වනුයේ එම නිකායේ හෝ පාර්ශ්වයේ සිටින භික්ෂූන් වහන්සේලාගේ සංඛ්‍යාවට අනුපාතිකව ය. ඒ අනුව වැඩි භික්ෂු සංඛ්‍යාවක් ඇති නිකායන්ට සහ පාර්ශ්වයන්ට වැඩි ආසන සංඛ්‍යාවක් හිමි වේ. මෙම ක්‍රමවේදය මඟින් සමස්ත භික්ෂු සංඝයාගේ අනුපාතික නියෝජනය මහා සංඝ සභාව තුළ තහවුරු කෙරේ.

මහා සංඝ සභාවේ සාමාජිකත්වය ලැබීමට සුදුසුකම්	මහා සංඝ සභාවට පත් කරනු ලබන භික්ෂූන් වහන්සේලා අවම වශයෙන් වස් දසයක් සම්පූර්ණ කර ඇති, ධර්මය හා විනය පිළිබඳ මනා පරිචයක් ඇති ස්ථවිරයන් වහන්සේලා විය යුතුය. එක් එක් නිකායකින් හෝ පාර්ශ්වයකින් මහා සංඝ සභාවට පත් වන ස්ථවිරයන් වහන්සේලාගේ නම් නිකායේ හෝ පාර්ශ්වයේ කාරක සංඝ සභාව විසින් අනුමත කරන ලදුව උත්තරීතර සංඝ සභාවට දැනුවත් කළ යුතුය.
මහා සංඝ සභාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම	එක් එක් නිකායට සහ පාර්ශ්වයට හිමි ආසන සඳහා භික්ෂූන් වහන්සේලා තෝරා පත් කර ගැනීමේ ක්‍රමවේදයක් නිකාය සහ පාර්ශ්ව සමඟ සාකච්ඡා කොට සකස් කළ යුතුය.
අනුනායක මණ්ඩලය	සියලු නිකාය හා පාර්ශ්වයන්හි අනුනායක ධුරයට පත් වන මහා ස්ථවිරවරු උත්තරීතර සංඝ සභාවේ මහා සංඝ සභාවේ සාමාජිකත්වය ලබති. මහා සංඝ සභාව තුළ, එහි සාමාජික අනුනායක ස්ථවිරවරුන්ගෙන් සමන්විත මණ්ඩලයක් පිහිටුවනු ලබන අතර එය “අනුනායක මණ්ඩලය” නම් වේ. ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක ධුරයට පත් කළ යුත්තේ අනුනායක මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් එක් අයෙකි.
උත්තරීතර සංඝ සභාවේ සභානායක මහා ස්ථවිරයෝ	උත්තරීතර සංඝ සභාවේ සියලු සභාවාර මෙහෙයවීම සඳහා සභානායක ස්ථවිරවරයෙකු පත් කර ගත යුතුය. ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක සභාවේ හෝ උත්තරීතර සංඝ සභාවේ පර්යාප්ති කමිටුවේ, අධීක්ෂණ කාරක සභාවේ හෝ තේරීම් කාරක සභාවේ සාමාජිකයෙකු නොවන, අනුනායක මණ්ඩලය නියෝජනය කරන මහා ස්ථවිරවරයෙකු උත්තරීතර සංඝ සභාවේ සභානායක ලෙස උත්තරීතර මහානායක මණ්ඩලය විසින් පත් කළ යුතුය. උත්තරීතර සංඝ සභාවේ ධුර කාලය අවසන් වීමත් සමඟ සභානායකවරයාගේ ධුරය ද අහෝසි වේ. නව උත්තරීතර සංඝ සභාවක් පිහිටුවන විට, ඒ සඳහා නව සභානායක ස්ථවිරවරයෙකු නැවත පත් කළ යුතුය. එක් වරක් සභානායක ධුරය හෙබවූ අනුනායක ස්ථවිරවරයෙකු නැවත වරක් එම ධුරය සඳහා සුදුසුකම් නොලබයි. කෙසේ වෙතත්, ධුරය දරමින් සිටි සභානායක ස්ථවිරවරයාගේ ධුරය අකාලයේ පුරප්පාඩු වූ අවස්ථාවක, ඉතිරි ධුර කාලය සඳහා අනුප්‍රාප්තික සභානායකවරයෙකු ලෙස පත් කරනු ලබන අනුනායක ස්ථවිරවරයාගේ එම සේවා කාලය, මෙම වගන්තියේ අර්ථයෙන් සම්පූර්ණ ධුර කාලයක් ලෙස නොසැලකේ

උත්තරීතර සංඝ සභාවේ ක්‍රියාපටිපාටීන්	උත්තරීතර සංඝ සභාවේ රැස්වීම් කැඳවීම, සභාවාර පැවැත්වීම, ක්‍රියාපටිපාටීන් සකස් කිරීම සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවේ වෙනත් ආකාරයකින් විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය නියමයන් උත්තරීතර සංඝ සභාව විසින් ම කතිකා මඟින් සම්මත කර ගත යුතුය.
උත්තරීතර සංඝ සභාවේ තීරණ ගැනීම	ව්‍යවස්ථාවේ වෙනත් ආකාරයකට ප්‍රතිපාදන සලසා නොමැති අවස්ථාවලදී, උත්තරීතර සංඝ සභාවේ තීරණ ගැනීම තථාගතයන් වහන්සේ විසින් දේශිත "යෙභුය්‍යසිකා" අධිකරණ සමථයේ මූලධර්මයට අනුකූලව, "සමගාමී බහුතරය" (Concurrent Majority) යන ක්‍රමවේදය අනුව සිදු කළ යුතුය. මෙහි "සමගාමී බහුතරය" යන්නෙන් අදහස් කරනුයේ මහා සංඝ සභාවේ ද, ස්ථවිර සභාවේ ද, සියම්, අමරපුර සහ රාමඤ්ඤ යන එක් එක් නිකාය නියෝජනය කරන සාමාජිකයන්ගේ ද අවශ්‍ය බහුතර අනුමැතිය එකවර ලැබීම ය. උත්තරීතර සංඝ ව්‍යවස්ථාවේ වෙනත් ආකාරයකට තීරණ ගැනීම සඳහා විධිවිධාන සලසා නොමැති කාරණාවක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා මහා සංඝ සභාවේ රැස්වීමට පැමිණ සිටින හා ඡන්දය ප්‍රකාශ කරන සාමාජිකයන්ගේ සරළ බහුතර අනුමැතිය ද, ස්ථවිර සභාවේ රැස්වීමට පැමිණ සිටින හා ඡන්දය ප්‍රකාශ කරන සාමාජිකයන්ගේ සරළ බහුතර අනුමැතිය ද, සියම්, අමරපුර සහ රාමඤ්ඤ යන එක් එක් නිකාය නියෝජනය කරන සාමාජිකයන්ගේ වෙන වෙන ම සරළ බහුතර අනුමැතිය ද ලැබිය යුතුය.
ධර්මය සහ විනය නිර්වචනය කිරීම	ධර්මය හා විනය නිර්වචනය කිරීම සම්බන්ධයෙන් උත්තරීතර සංඝ සභාව විසින් සමගාමී බහුතරයකින් ගනු ලබන තීරණ අවසානාත්මක ලෙස සැලකිය යුතුය. එවැනි තීරණ සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැක්කේ උත්තරීතර සංඝ සභාව විසින් පමණි.
සංඝ කතිකාවත් සම්මත කිරීම	ශ්‍රී ලංකාවේ සමස්ත මහා සංඝයාට බලපැවැත්වෙන කතිකාවතක් සම්මත කිරීම සඳහා මහා සංඝ සභාවේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට (2/3) නොඅඩු බහුතරයක අනුමැතිය ද, ස්ථවිර සභාවේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට (2/3) නොඅඩු බහුතරයක අනුමැතිය ද, සියම්, අමරපුර සහ රාමඤ්ඤ යන එක් එක් නිකාය නියෝජනය කරන සාමාජිකයන්ගේ වෙන වෙන ම සරළ බහුතර අනුමැතිය ද ලැබිය යුතුය.
බුද්ධානුබුද්දක ශික්ෂාපද සම්පූර්ණයෙන්	**"ආකඞ්ඛමානො, ආනන්ද, සඞ්ඝො මමච්චයෙන බුද්දානුබුද්දකානි සික්ඛාපදානි සමූහනතු"** යන බුද්ධ ප්‍රඥප්තියට අනුව විනයේ පණවා ඇති බුද්දානුබුද්දක ශික්ෂාපද සමූහයන

හෝ අර්ධ වශයෙන් සමූහනය	කිරීමේ බලය සංඝයාට හිමි වේ. සම්බුද්ධ පරිනිර්වාණයෙන් මාස තුනකට පසුව රජගහ නුවර පවත්වන ලද ප්‍රථම ධර්ම සංගායනාවේ දී බුද්දානුබුද්දක ශික්ෂාපද වෙනස් නොකිරීමට සංගීතිකාරක මහා රහතන් වහන්සේලා ඤත්ති දුතිය කර්මයකින් තීරණය කළහ. තථාගතයන් වහන්සේ විසින් සංඝයාට දෙන ලද අවසරයක් නිසා බුද්දානුබුද්දක ශික්ෂාපද සම්පූරණයෙන් හෝ අර්ධ වශයෙන් සමූහනය කිරීමේ බලය සෑම කල්හි ම සංඝයා සතු වේ. එබැවින් උත්තරීතර සංඝ සභාවට ද ශ්‍රී ලංකාවට බලපාන පරිද්දෙන් බුද්දානුබුද්දක ශික්ෂාපද සම්පූරණයෙන් හෝ අර්ධ වශයෙන් සමූහයන කිරීමේ බලය ඇත. බුද්දානුබුද්දක ශික්ෂාපද සංශෝධනයක් හෝ සමූහනයක් සම්මත කිරීම සඳහා මහා සංඝ සභාවේ සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට (3/4) නොඅඩු බහුතරයක අනුමැතිය ද, ස්ථවිර සභාවේ සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට (3/4) නොඅඩු බහුතරයක අනුමැතිය ද, සියම්, අමරපුර සහ රාමඤ්ඤ යන එක් එක් නිකාය නියෝජනය කරන සාමාජිකයන්ගේ වෙන වෙන ම හතරෙන් තුනකට (3/4) නොඅඩු බහුතර අනුමැතිය ද, මහා නායක මණ්ඩලයේ හතරෙන් තුනකට (3/4) නොඅඩු බහුතර අනුමැතිය ද, අවසානයේ සියලු පාර්ශ්වයන්ගේ කාරක සභාවන් අතුරින් හතරෙන් තුනකට (3/4) නොඅඩු බහුතර අනුමැතිය ද ලැබිය යුතුය.
සංඝභාර නිත්ථාරක සභාව අධීක්ෂණ බලතල	උත්තරීතර සංඝ සභාව විසින් සංඝභාර නිත්ථාරක සභාවේ සහ එහි අනුබද්ධ ආයතනවල කටයුතු අධීක්ෂණය කරනු ලැබේ. එම කටයුතු සම්බන්ධයෙන් උත්තරීතර සංඝ සභාව සෑහීමකට පත් නොවන්නේ නම්, උත්තරීතර සංඝ සභාවේ අධීක්ෂණ කාරක සභාවක් මඟින් සංඝභාර නිත්ථාරක සභාවෙන් හෝ අදාළ ආයතනයෙන් වාර්තා, පැහැදිලි කිරීම් සහ අනෙකුත් අවශ්‍ය තොරතුරු කැඳවීමටත්, අදාළ සභා, මණ්ඩල සහ කමිටුවල ලේඛකාධිකාරී ස්ථවිරයන් වහන්සේලා හෝ වෙනත් නිලධාරීන් ඉදිරියට කැඳවා කරුණු විමසීමටත්, අදාළ ලේඛන, ගිණුම් සහ වාර්තා පරීක්ෂා කිරීමටත්, ඒ පිළිබඳ තම නිරීක්ෂණ සහ නිර්දේශ උත්තරීතර සංඝ සභාව වෙත ඉදිරිපත් කිරීමටත් හැකි වන්නේ ය. එම වාර්තා සහ නිර්දේශ සැලකිල්ලට ගනිමින් අවශ්‍ය උපදෙස්, නිර්දේශ හෝ නියෝග නිකුත් කිරීම උත්තරීතර සංඝ සභාව විසින් කරනු ලැබේ. විශේෂ අවස්ථාවල දී හෝ උත්තරීතර සංඝ සභාව අවශ්‍ය යැයි සලකන අවස්ථාවල දී, උත්තරීතර සංඝ සභාවේ අධීක්ෂණ කාරක සභා හරහා සංඝභාර නිත්ථාරක සභාවේ ප්‍රධාන නිලධාරීන්ගෙන් ද කරුණු විමසීමට උත්තරීතර සංඝ සභාවට හැකි වන්නේ ය.

අටවෙනි පරිච්ඡේදය: උත්තරීතර සංඝ සභාවේ කමිටු සහ කාරක සභා

උත්තරීතර සංඝ සභාවේ අධීක්ෂණ කාරක සභාව, තේරීම් කාරක සභාව සහ පර්‍යාප්ති කමිටුව

උත්තරීතර සංඝ සභාව වෙත උත්තරීතර සංඝ ව්‍යවස්ථාවෙන් පැවරී ඇති කටයුතු කාර්‍යක්ෂමව ඉටු කිරීමට උත්තරීතර සංඝ සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත කාරක සභා සහ කමිටු පත් කළ හැක.

(1). පර්‍යාප්ති කමිටුව

(2). තේරීම් කාරක සභාව

(3). අධීක්ෂණ කාරක සභාව

පර්‍යාප්ති කමිටුව

උත්තරීතර සංඝ සභාවේ මහා සංඝ සභාවේ සාමාජික ස්ථවිරයන් වහන්සේලා අතුරින් පරිසුපට්ඨාපක උපාධිය, ත්‍රිපිටකාචාර්‍ය උපාධිය, ත්‍රිපිටක විශාරද උපාධිය, රාජකීය පණ්ඩිත උපාධිය හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රදානය කරන ලද ආචාර්‍යෝපාධියක් සමර්ථ ස්ථවිරයන් වහන්සේලාගෙන් සමන්විත පර්‍යාප්ති කමිටුවක් උත්තරීතර මහා නායක මණ්ඩලය විසින් පිහිටුවිය යුතුය. එම කමිටුව එක් එක් නිකාය නියෝජනය වන පරිදි නිකායකට ස්ථවිරයන් වහන්සේලා නව නම බැගින්, මුළු සාමාජික ස්ථවිරයන් වහන්සේලා විසි හත් නමකින් සමන්විත වන්නේ ය.

පර්‍යාප්ති කමිටුව පිහිටුවීමෙන් අනතුරුව, එහි සාමාජික ස්ථවිරයන් වහන්සේලා විසින් තම බහුතර කැමැත්තෙන් පර්‍යාප්ති කමිටුවේ සභාපති ස්ථවිරයන් වහන්සේ නමක්, උපසභාපති ස්ථවිරයන් වහන්සේ නමක් සහ ලේඛකාධිකාරී ස්ථවිරයන් වහන්සේ නමක් පත් කර ගත යුතුය. කෙසේ වුව ද, මෙම නිලධාරී තනතුරු නිකාය තුන ම නියෝජනය වන ආකාරයෙන් පිරවිය යුතු වන්නේ ය.

පර්‍යාප්ති කමිටුවේ ගණපූරණය සාමාජික ස්ථවිරයන් වහන්සේලා පසළොස් නමක් වන්නේ ය.

පර්‍යාප්ති කමිටුවේ තීරණ බහුතර කැමැත්තෙන් ගනු ලබන අතර, ඡන්ද සංඛ්‍යාව සම වූ අවස්ථාවක දී සභාපති ස්ථවිරයන් වහන්සේගේ ඡන්දය තීරක ඡන්දය වන්නේ ය.

ධර්මවිනය සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාව පිළිබඳ පර්යේෂණ සහ අර්ථකථන

උත්තරීතර මහා නායක මණ්ඩලය විසින් හෝ, මහා නායක මණ්ඩලයේ බහුතර කැමැත්තෙන් හෝ, මහා නායක මණ්ඩලයේ කවර හෝ මහා නායක ස්ථවිරයන් වහන්සේ නමක් විසින් හෝ, උත්තරීතර සංඝ සභාවේ සභානායක ස්ථවිරයන් විසින් හෝ, ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලය විසින් හෝ, ස්ථවිර සභාවේ බහුතර කැමැත්තෙන් හෝ, අනුනායක මණ්ඩලයේ බහුතර කැමැත්තෙන් හෝ, මහා සංඝ සභාවේ බහුතර කැමැත්තෙන් හෝ, ධර්මවිනය සම්බන්ධ කරුණක්,

උත්තරීතර සංඝ ව්‍යවස්ථාව පිළිබඳ කරුණක්, ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් හෝ වෙනත් කරුණක් පිළිබඳව පර්යේෂණය කොට තම අර්ථකථනය සහ මතය ඉදිරිපත් කරන ලෙස පර්‍යාප්ති කමිටුව වෙත යොමු කළ හැකි වන්නේ ය.

පර්‍යාප්ති කමිටුව විසින් ඉදිරිපත් කරනු ලබන ධර්මවිනය හෝ ව්‍යවස්ථා අර්ථකථනය උත්තරීතර සංඝ සභාවේ බහුතර කැමැත්තෙන් අනුමත වූ කල්හි එය උත්තරීතර සංඝ සභාවේ අර්ථකථනය ලෙස සම්මත වන්නේ ය.

උත්තරීතර සංඝාධිකරණයට හෝ කාරක සංඝාධිකරණයට යම් ධර්මවිනය කරුණක් පිළිබඳව පර්‍යාප්ති කමිටුවේ අර්ථකථනය හෝ මතය විමසීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා පර්‍යාප්ති කමිටුව වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

උත්තරීතර සංඝාධිකරණයට පර්‍යාප්ති කමිටුවේ අර්ථකථනය විමසීමට අවශ්‍ය වන්නේ නම්, අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් වහන්සේ විසින් හෝ උත්තරීතර සංඝාධිකරණයේ විනිශ්වයකාර ස්ථවිරයන් දෙදෙනෙකුගේ අත්සනින් හෝ, විමසීමට අදහස් කරන කරුණ පැහැදිලිව සඳහන් කොට පර්‍යාප්ති කමිටුවේ ලේඛකාධිකාරී ස්ථවිරයන් වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

කාරක සංඝාධිකරණයට පර්‍යාප්ති කමිටුවේ අර්ථකථනය විමසීමට අවශ්‍ය වන්නේ නම්, කාරක සංඝාධිකරණයේ සභාපති ස්ථවිරයන් විසින් හෝ විනිශ්වයකාර ස්ථවිරයන් දෙදෙනෙකුගේ අත්සනින් හෝ, විමසීමට අදහස් කරන කරුණ පැහැදිලිව සඳහන් කොට පර්‍යාප්ති කමිටුවේ ලේඛකාධිකාරී ස්ථවිරයන් වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

ධර්මවිනය විකෘති කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණ බලය

යම් භික්ෂුවක්, සාමණේරයෙක්, සිල්මාතාවක් හෝ ගිහි පුද්ගලයෙකු විසින් ධර්මවිනය දේශනා කිරීමේ දී, ඉගැන්වීමේ දී හෝ රචනා කිරීමේ දී ධර්මවිනය විකෘති කරනු ලබන්නේ යැයි යම් පුද්ගලයෙකුට හැඟී යන්නේ නම්, ඒ පිළිබඳ සාක්ෂි සහිත පැමිණිල්ලක් පර්‍යාප්ති කමිටුව වෙත ඉදිරිපත් කළ හැකි වන්නේ ය.

එම පැමිණිල්ල පිළිබඳව පර්‍යාප්ති කමිටුව විසින් මූලික විමර්ශනයක් සිදු කළ යුතු අතර, එය තවදුරටත් විභාගයට ගැනීම අවශ්‍ය කරුණක් බව පර්‍යාප්ති කමිටුවට පෙනී යන්නේ නම්, චූදිත භික්ෂුව, සිල්මාතාව හෝ ගිහි පුද්ගලයා කමිටුව ඉදිරියට කැඳවා කරුණු විමසිය යුතු වන්නේ ය.

අපක්ෂපාතී විභාගයකින් අනතුරුව පර්‍යාප්ති කමිටුව විසින් තම ධර්මවිනය අර්ථකථනය සහ මතය චූදිත පාර්ශ්වයට ලිඛිතව දැනුම් දිය යුතු වන්නේ ය.

අදාළ පුද්ගලයා නොදැනුවත්කම නිසා හෝ වැරදි අවබෝධයක් නිසා හෝ ධර්මවිනය විකෘති කරනු ලබන්නේ යැයි පර්‍යාප්ති කමිටුවට හැඟී යන්නේ නම්, එම දේශනා, ඉගැන්වීම් හෝ රචනා

ඉදිරියට සිදු නොකරන ලෙස ඔහුට හෝ ඇයට අවවාද කළ යුතු වන්නේ ය.

චූදිත භික්ෂුව, සාමණේරයා, සිල්මාතාව හෝ ගිහි පුද්ගලයා පයඃප්ති කමිටුවේ අර්ථකථනය සමඟ එකඟ නොවන්නේ නම්, ඒ පිළිබඳ තම විරෝධය හෝ විකල්ප මතය උත්තරීතර සංඝ සභාවේ සභානායක ස්ථවිරයන් වෙත ලිඛිතව ඉදිරිපත් කළ හැකි වන්නේ ය.

එවැනි අවස්ථාවක දී, අදාළ කරුණ සම්බන්ධයෙන් උත්තරීතර සංඝ සභාව විසින් දැනටමත් අර්ථකථනයක් හෝ තීරණයක් ලබා දී ඇත් නම්, සභානායක ස්ථවිරයන් විසින් එය අදාළ පාර්ශ්වයන් වෙත දැනුම් දිය යුතුය. එසේ නොමැති නම්, අදාළ කරුණ සම්බන්ධයෙන් උත්තරීතර සංඝ සභාවේ අර්ථකථනයක් හෝ තීරණයක් ලබා ගැනීම අවශ්‍ය යැයි සභානායක ස්ථවිරයන් සලකන්නේ නම්, එම කරුණ උත්තරීතර සංඝ සභාවේ සාමාජිකයන් වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. අනතුරුව, එළඹෙන පළමු උත්තරීතර සංඝ සභා වාරයේ දී මෙම ව්‍යවස්ථාවේ නියමිත ක්‍රියාපටිපාටිය අනුව එම කරුණ සලකා බලා අර්ථකථනයක් හෝ තීරණයක් ගත යුතු අතර, සභානායක ස්ථවිරයන් විසින් එය අදාළ පාර්ශ්වයන් වෙත දැනුම් දිය යුතුය.

එවැනි අවස්ථාවක දී, අදාළ භික්ෂුව, සාමණේරයා, සිල්මාතාව හෝ ගිහි පුද්ගලයා උත්තරීතර සංඝ සභාව විසින් සම්මත කරනු ලැබූ ධර්මවිනය අර්ථකථනයට අනුකූලව ම ධර්මවිනය දේශනා කිරීම, ඉගැන්වීම සහ රචනා කිරීම කළ යුතු වන්නේ ය.

අදාළ භික්ෂුව, සාමණේරයා, සිල්මාතාව හෝ ගිහි පුද්ගලයා උත්තරීතර සංඝ සභාවේ ධර්මවිනය අර්ථකථනය සමඟ තවදුරටත් එකඟ නොවන්නේ නම්, සංඝ සාමග්‍රිය සහ ශාසනික පිළිවෙළ ආරක්ෂා කිරීම පිණිස, අදාළ කරුණ සම්බන්ධයෙන් එම අර්ථකථනයට පටහැනි මත ප්‍රසිද්ධියේ දේශනා කිරීමෙන්, ඉගැන්වීමෙන් හෝ රචනා කිරීමෙන් වැළකී සිටිය යුතු වන්නේ ය.

පයඃප්ති කමිටුව විසින් අවවාද කිරීමෙන් අනතුරුව ද අදාළ භික්ෂුව, සාමණේරයා, සිල්මාතාව හෝ ගිහි පුද්ගලයා පයඃප්ති කමිටුවේ ධර්මවිනය අර්ථකථනයට පටහැනිව ධර්මවිනය දේශනා කිරීම, ඉගැන්වීම හෝ රචනා කිරීම දිගටම සිදු කරන්නේ නම්, හෝ අදාළ කරුණ සම්බන්ධයෙන් උත්තරීතර සංඝ සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව උත්තරීතර සංඝ සභාව විසින් ලබා දෙන ලද අවසානාත්මක ධර්මවිනය අර්ථකථනයට පටහැනිව එවැනි ක්‍රියාකාරකම් දිගටම සිදු කරන්නේ නම්, ඒ පිළිබඳව පයඃප්ති කමිටුව විසින් විනය අධීක්ෂණ කමිටුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

අදාළ භික්ෂුව, සාමණේරයා, සිල්මාතාව හෝ ගිහි පුද්ගලයා විසින් පයඃප්ති කමිටුවේ ධර්මවිනය අර්ථකථනය

සම්බන්ධයෙන් උත්තරීතර සංඝ සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබේ නම්, උත්තරීතර සංඝ සභාව විසින් ඒ පිළිබඳ අවසානාත්මක අර්ථකථනයක් ලබා දෙන තෙක් එම පැමිණිල්ල සම්බන්ධයෙන් විනය අධීක්ෂණ කමිටුව විසින් තවදුරටත් ක්‍රියාමාර්ග නොගත යුතු වන්නේ ය.

විනය අධීක්ෂණ කමිටුවට එම පැමිණිල්ල මුල් කරගෙන චූදිතයා පර්‍යාප්ති කමිටුවේ අර්ථකථනයට පටහැනිව හෝ උත්තරීතර සංඝ සභාවේ අර්ථකථනයට පටහැනිව ක්‍රියා කරන බවට ප්‍රමාණවත් පදනමක් පෙනී යන්නේ නම්, එසේ කටයුතු කරන භික්ෂුව, සාමණේරයා, සිල්මාතාව හෝ ගිහි පුද්ගලයා කාරක සංඝාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

කාරක සංඝාධිකරණය විසින් චූදිතයාට සාධාරණ අවස්ථාවක් ලබා දෙමින් කරුණු සහ සාක්ෂි විභාග කළ යුතු අතර, චූදිතයා විසින් අදාළ ක්‍රියාව සිදු කළේ ද නැද්ද යන්න සහ සිදු කර ඇත්නම් සුදුසු දඬුවම කුමක් ද යන්න තීරණය කළ යුතු වන්නේ ය.

කාරක සංඝාධිකරණය විසින් උත්තරීතර සංඝ සභාවේ ධර්මවිනය පිළිබඳ තීරණයට අනුකූලව කටයුතු කළ යුතු වන අතර, එම අර්ථකථනයට පටහැනි තීරණයක් ලබා නොදිය යුතු වන්නේ ය.

චූදිතයා භික්ෂුවක් හෝ සාමණේරයෙක් වන්නේ නම්, විනයානුකූල දඬුවම් අතරින් සුදුසු දඬුවමක් පැනවිය හැකි වන්නේ ය. චූදිතයා සිල්මාතාවක් හෝ ගිහි පුද්ගලයෙකු වන්නේ නම්, විනය දඬුවම් පොත් විධිවිධාන අනුව සුදුසු ක්‍රියාමාර්ගයක් ගත හැකි වන්නේ ය.

ඉදින් අදාළ ධර්මවිනය අර්ථකථනය සම්බන්ධයෙන් චූදිත භික්ෂුව, සාමණේරයා, සිල්මාතාව හෝ ගිහි පුද්ගලයා විසින් උත්තරීතර සංඝ සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අතර, උත්තරීතර සංඝ සභාව විසින් ද ඒ පිළිබඳ අවසානාත්මක ධර්මවිනය අර්ථකථනයක් ලබා දී නොමැති අවස්ථාවක දී, අදාළ නඩුව විභාග කරන කාරක සංඝාධිකරණ විනිශ්චය මඬුල්ලේ විනිශ්චයකාර ස්ථවිරවරයෙකුට හෝ ස්ථවිරවරුන්ට පර්‍යාප්ති කමිටුවේ ධර්මවිනය අර්ථකථනය පිළිබඳ සංකාවක්, අරුචියක් හෝ වෙනත් මතයක් පවතින්නේ නම්, එම විනිශ්චයකාර ස්ථවිරවරයා හෝ ස්ථවිරවරු එම නඩුව විභාග කිරීමෙන් ඉවත් වී, වෙනත් විනිශ්චයකාර ස්ථවිරවරයෙකු හෝ ස්ථවිරවරුන් පත් කරන ලෙස කාරක සංඝාධිකරණයේ සභාපති ස්ථවිරයන් වෙත දැනුම් දිය යුතු වන්නේ ය.

ඉදින් කාරක සංඝාධිකරණයේ විනිශ්චයකාර ස්ථවිරවරු පස් නමකට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට පර්‍යාප්ති කමිටුවේ ධර්මවිනය අර්ථකථනය පිළිබඳ සංකාවක්, අරුචියක් හෝ වෙනත් මතයක් පවතින්නේ නම්, ඒ පිළිබඳ කරුණ උත්තරීතර

සංඝ සභාවේ සභානායක ස්ථවිරයන් වෙත ලිඛිතව දැනුම් දිය යුතු වන්නේ ය.

එවැනි අවස්ථාවක දී, අදාළ කරුණ සම්බන්ධයෙන් උත්තරීතර සංඝ සභාව විසින් දැනටමත් අර්ථකථනයක් හෝ තීරණයක් ලබා දී ඇත් නම්, සභානායක ස්ථවිරයන් විසින් එය කාරක සංඝාධිකරණය වෙත දැනුම් දිය යුතුය. එසේ නොමැති නම්, අදාළ කරුණ සම්බන්ධයෙන් උත්තරීතර සංඝ සභාවේ අර්ථකථනයක් හෝ තීරණයක් ලබා ගැනීම අවශ්‍ය යැයි සභානායක ස්ථවිරයන් සලකන්නේ නම්, එම කරුණ උත්තරීතර සංඝ සභාවේ සාමාජිකයන් වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. අනතුරුව, එළඹෙන පළමු උත්තරීතර සංඝ සභා වාරයේ දී මෙම ව්‍යවස්ථාවේ නියමිත ක්‍රියාපටිපාටිය අනුව එම කරුණ සලකා බලා අර්ථකථනයක් හෝ තීරණයක් ගත යුතු අතර, සභානායක ස්ථවිරයන් විසින් එය කාරක සංඝාධිකරණය වෙත දැනුම් දිය යුතුය.

මෙම කරුණ සම්බන්ධයෙන් උත්තරීතර සංඝ සභාව විසින් ලබා දෙනු ලබන ධර්මවිනය අර්ථකථනය අවසානාත්මක වන්නේ ය.

අනතුරුව කාරක සංඝාධිකරණය විසින් මහා සංඝසභාවේ තීරණයට ගරු කරමින් එයට විරුද්ධ හෝ පටහැනි නොවී අදාළ චූදිතයාට දඬුවම් දීම හෝ නොදීම තීරණය කළ යුතුය. එසේ නොකර සිටීම නොකළ යුතුය.

උත්තරීතර සංඝ සභාව විසින් අවසානාත්මක ලෙස තීරණය කරනු ලැබූ ධර්මවිනය අර්ථකථනයක් සම්බන්ධයෙන් උත්තරීතර සංඝාධිකරණයට අධිකරණ බලයක් නොමැත.

කෙසේ වුව ද, කාරක සංඝාධිකරණය විසින් නියම කරන ලද දඬුවමේ ප්‍රමාණය, සිදු කරන ලද සාක්ෂි ඇගයීම, අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය හෝ ස්වාභාවික යුක්තිය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් උත්තරීතර සංඝාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව පවතින්නේ ය.

විෂය නිර්දේශ සකස් කිරීම සහ සංශෝධනය කිරීම

පර්‍යාප්ති කමිටුව විසින් අදාළ රාජ්‍ය ආයතන, වෘත්තීය ආයතන සහ විෂය විශේෂඥයන් සමඟ සමීප සම්බන්ධීකරණයෙන් කටයුතු කරමින් ශාසනික අධ්‍යාපන ආයතන සඳහා අවශ්‍ය විෂය නිර්දේශ, උපාධි පාඨමාලා සහ පුහුණු වැඩසටහන් සකස් කළ යුතුය.

ඒ අනුව,

(i). මූලික පිරිවෙන්වල විෂය නිර්දේශ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් සකස් කළ යුතුය.

(ii). උසස් පිරිවෙන්වල විෂය නිර්දේශ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණයෙන් සකස් කළ යුතුය.

(iii). බෞද්ධ නීති විද්‍යාලයේ විෂය නිර්දේශ සහ උපාධි සහ සහතික පත්‍ර පාඨමාලා ශ්‍රී ලංකා නීති විද්‍යාලය සමඟ සම්බන්ධීකරණයෙන් සකස් කළ යුතුය.

(iv). සංඝභාර කළමනාකරණ විද්‍යාලයේ විෂය නිර්දේශ, උපාධි සහ සහතික පත්‍ර පාඨමාලා සහ පුහුණු වැඩසටහන් රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක කළමනාකරණ අධ්‍යයන අංශයක් සමඟ සම්බන්ධීකරණයෙන් සකස් කළ යුතුය.

(v). දහම් පාසල්වල විෂය නිර්දේශ අදාළ අමාත්‍යාංශවල විශේෂඥයන් සහ උපදේශකයන්ගේ අදහස් හා උපදෙස් ලබා ගනිමින් සකස් කළ යුතුය.

(vi). ත්‍රිපිටකාචාර්ය සහ ත්‍රිපිටක විශාරක උපාධි පාඨමාලාව සකස් කළ යුතුය.

පර්යාප්ති කමිටුව විසින් සකස් කරනු ලබන විෂය නිර්දේශ උත්තරීතර සංඝ සභාවේ අනුමැතියෙන් පසු අදාළ ආයතන සහ විහාරස්ථානවල ඉගැන්වීම් කටයුතු සඳහා භාවිත කළ හැක.

කෙසේ වුව ද, මූලික පිරිවෙන්, උසස් පිරිවෙන් සහ දහම් පාසල් විෂය නිර්දේශයක අර්ථයට, අන්තර්ගතයට, විෂය පථයට හෝ අනිවාර්ය අධ්‍යයන අවශ්‍යතාවන්ට බලපෑමක් නොකරන මුද්‍රණ දෝෂ, අක්ෂර වින්‍යාස දෝෂ සහ අනෙකුත් සුළු සංස්කරණාත්මක සංශෝධන පර්යාප්ති කමිටුව විසින් සිදු කළ හැකි අතර, එවැනි සංශෝධන සඳහා පර්යාප්ති-ප්‍රතිපත්ති ශාසන මණ්ඩලයේ ප්‍රධාන ස්ථවිරයන් වහන්සේගේ අනුමැතිය ප්‍රමාණවත් වන්නේ ය.

බෞද්ධ නීතිවිද්‍යාලයේ විෂය නිර්දේශයක අර්ථයට, අන්තර්ගතයට, විෂය පථයට හෝ අනිවාර්ය අධ්‍යයන අවශ්‍යතාවන්ට බලපෑමක් නොකරන මුද්‍රණ දෝෂ, අක්ෂර වින්‍යාස දෝෂ සහ අනෙකුත් සුළු සංස්කරණාත්මක සංශෝධන පර්යාප්ති කමිටුව විසින් සිදු කළ හැකි අතර, එවැනි සංශෝධන සඳහා බෞද්ධ නීති විද්‍යාලයේ ප්‍රධාන ස්ථවිරයන් වහන්සේගේ අනුමැතිය ප්‍රමාණවත් වන්නේ ය.

සංඝභාර කලමනාකරණ විද්‍යාලයේ විෂය නිර්දේශයක අර්ථයට, අන්තර්ගතයට, විෂය පථයට හෝ අනිවාර්ය අධ්‍යයන අවශ්‍යතාවන්ට බලපෑමක් නොකරන මුද්‍රණ දෝෂ, අක්ෂර වින්‍යාස දෝෂ සහ අනෙකුත් සුළු සංස්කරණාත්මක සංශෝධන පර්යාප්ති කමිටුව විසින් සිදු කළ හැකි අතර, එවැනි සංශෝධන සඳහා සංඝභාර කලමණාකරණ විද්‍යාලයේ ප්‍රධාන ස්ථවිරයන් වහන්සේගේ අනුමැතිය ප්‍රමාණවත් වන්නේ ය.

විනය දඬුවම් සහ විනය කර්‍ම පොත	ත්‍රිපිටකය, අට්ඨකථා සහ ටීකා ග්‍රන්ථවල සඳහන් විනය දණ්ඩන හා විනය කර්ම සම්බන්ධ කරුණු පදනම් කර ගනිමින්, "විනය දඬුවම් සහ විනය කර්‍ම පොත" නමින් ග්‍රන්ථයක් පර්‍යාප්ති කමිටුව විසින් සකස් කොට උත්තරීතර සංඝ සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. සංඝාධිකරණයන් විසින් විනය නඩු විභාග කොට විනය දඬුවම් හෝ විනය කර්ම පමුණුවනු ලබන්නේ නම්, ඒවා හැකි සෑම අවස්ථාවක දී ම විනය දඬුවම් සහ විනය කර්‍ම පොතේ විධිවිධානවලට අනුකූලව පමුණුවනු ලැබිය යුතුය.
තේරීම් කාරක සභාව සහ එහි සංයුතිය	උත්තරීතර සංඝ සභාවේ මහා සංඝ සභාවේ වස් විස්සක් හෝ එයට වැඩි වස් ගණනක් ඇති මහා ස්ථවිරවරු ම තේරීම් කාරක සභාවට පත් වීමට සුදුසුකම් ලබයි. තේරීම් කාරක සභාවේ සාමාජිකයන් ගණන පහළොවකි. තේරීම් කාරක සභාවේ සංයුතිය පහත පරිදි වේ. (1). සංඝභාර නිත්ථාරක සභාවේ සහ අධීක්ෂණ කාරක සභාවේ නිල නොදරන නිකාය තුන නියෝජනය කරමින් අනුනායක මණ්ඩලයේ ස්ථවිරවරු තුන් නමක්. (2). ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලය සහ අධීක්ෂණ කාරක සභාව නියෝනය නොකරන ස්ථවිර සභාවේ නිකාය තුන නියෝජනය කරමින් ලේඛකාධිකාරී ස්ථවිරවරු තුන් නමක්. (3). මහා සංඝ සභාව නියෝජනය කරමින් නිකාය තුන සමව නියෝජනය කරමින් මහා ස්ථවිරවරු නව නමක්.
තේරීම් කාරක සභාවේ කර්තව්‍යය	තේරීම් කාරක සභාව විසින් පහත කර්තව්‍යයන් ඉටු කළ යුතු වන්නේ ය. (1). මූලික සංඝාධිකරණ සඳහා විනිශ්චයකාර ස්ථවිරවරුන් තෝරා පත් කිරීම. (2). ජ්‍යෝෂ්ඨ සංඝභාර නිත්ථාරක මහා ස්ථවිරයන්ගේ යෝජනා ද සැලකිල්ලට ගනිමින් සංඝභාර නිත්ථාරක සභාවට අයත් මණ්ඩල, සභා සහ කමිටුවල ප්‍රධානීන් පත් කිරීම. (3). යම් ශාසන ආයතනයක් පිහිටුවීම අවශ්‍ය වන අවස්ථාවක දී, එම ආයතනය සඳහා සාමාජිකයන් තෝරා පත් කිරීමේ කාර්යය තේරීම් කාරක සභාව වෙත පැවරීමට උත්තරීතර සංඝ සභාවට බලය ඇත.
අධීක්ෂණ කාරක සභාව සහ එහි සංයුතිය	අධීක්ෂණ කාරක සභාව ස්ථවිර සභාවේ සහ මහා සංඝ සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේ ය.

අධීක්ෂණ කාරක සභාව සාමාජික ස්ථවිරවරුන් විසි එක් නමකින් සමන්විත වන්නේ ය.

අධීක්ෂණ කාරක සභාවේ සංයුතිය පහත පරිදි වන්නේ ය.

(1). සංඝභාර නිත්ථාරක සභාවේ හෝ තේරීම් කාරක සභාවේ නිල නොදරන, නිකාය තුන නියෝජනය කරන අනුනායක මණ්ඩලයේ ස්ථවිරවරු තුන් නමක්.

(2). ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලයේ හෝ තේරීම් කාරක සභාවේ සාමාජිකත්වය නොදරන, නිකාය තුන නියෝජනය කරන ස්ථවිර සභාවේ ලේඛකාධිකාරී ස්ථවිරවරු තුන් නමක්.

(3). මහා සංඝ සභාව නියෝජනය කරමින් නිකාය තුන සමව නියෝජනය වන පරිදි තෝරා පත් කරනු ලබන මහා ස්ථවිරවරු පසළොස් නමක්.

අධීක්ෂණ කාරක සභාවේ කර්තව්‍යය

අධීක්ෂණ කාරක සභාව විසින් පහත කර්තව්‍යයන් ඉටු කළ යුතු වන්නේ ය.

(1). සංඝභාර නිත්ථාරක සභාවේ සහ එහි අනුබද්ධ ආයතනවල කටයුතු අධීක්ෂණය කිරීම.

(2). අවශ්‍ය යැයි සලකන අවස්ථාවල දී, සංඝභාර නිත්ථාරක සභාවෙන් හෝ අදාළ ආයතනයෙන් වාර්තා, පැහැදිලි කිරීම් සහ අනෙකුත් අවශ්‍ය තොරතුරු කැඳවීම.

අදාළ සභා, මණ්ඩල සහ කමිටුවල ලේඛකාධිකාරී ස්ථවිරවරුන් හෝ වෙනත් නිලධාරීන් ඉදිරියට කැඳවා කරුණු විමසීම.

(3). උත්තරීතර සංඝ සභාවේ අවසරය ඇතිව, අවශ්‍ය යැයි සලකන අවස්ථාවල දී සංඝභාර නිත්ථාරක සභාවේ ප්‍රධාන නිලධාරීන්ගෙන් කරුණු විමසීම.

විනිශ්චයකාර ස්ථවිරවරුන් සම්බන්ධ අධිකරණ විභාග කිරීමේ බලය

උත්තරීතර සංඝාධිකරණයේ අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් ඇතුළු විනිශ්චයකාර ස්ථවිරයෙකු හෝ කාරක සංඝාධිකරණයක සභාපති ස්ථවිරයන් ඇතුළු විනිශ්චයකාර ස්ථවිරයෙකු විසින් විනය විරෝධීව හෝ මෙම ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කර ඇති බවට පැමිණිල්ලක් ලැබුණු අවස්ථාවක, අදාළ විනිශ්චයකාර ස්ථවිරවරයා අධීක්ෂණ කාරක සභාව ඉදිරියට කැඳවා විභාග කිරීමට උත්තරීතර සංඝ සභාවට බලය ඇත්තේ ය.

අධීක්ෂණ කාරක සභාව විසින් ඒ සම්බන්ධයෙන් අපක්ෂපාතී විමර්ශනයක් පවත්වා, තම නිර්දේශ සහ නිරීක්ෂණ උත්තරීතර සංඝ සභාව වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

නවවෙනි පරිච්ඡේදය:
උත්තරීතර සංඝ සභාවේ සභාවාර

උත්තරීතර සංඝ සභාවේ සභාවාර

උත්තරීතර සංඝ සභාව සාමාජිකයන් හයසිය එක් (601) දෙනෙකුගෙන් සමන්විත වන බැවින්, එහි සියලු සාමාජිකයන් නිතර රැස්වීම ප්‍රායෝගික නොවේ. එබැවින් උත්තරීතර සංඝ සභාවේ සභාවාර සහ එහි කටයුතු පහත පරිදි පැවැත්විය යුතුය.

(1). උත්තරීතර සංඝ සභාව වාර්ෂිකව අවම වශයෙන් එක් මහා සභාවාරයක් පැවැත්විය යුතු අතර, එහිදී එම වර්ෂයට අදාළ කතිකාවත්, සම්මුතීන් සහ උත්තරීතර සංඝ සභාවේ අනුමැතිය අවශ්‍ය අනෙකුත් කටයුතු සම්මත කළ යුතුය.

(2). උත්තරීතර මහානායක මණ්ඩලය, මහානායක මණ්ඩලය, අනුනායක මණ්ඩලය, ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලය, ලේඛකාධිකාරී මණ්ඩලය සහ ස්ථවිර සභාවට තම තමන්ට පැවරී ඇති කටයුතු ඉටු කිරීම සඳහා වෙන වෙනම හෝ අවශ්‍ය පරිදි ඒකාබද්ධව රැස්විය හැකිය. මහානායක මණ්ඩලය රැස්විය යුත්තේ උත්තරීතර මහානායක මණ්ඩලයේ මූලිකත්වයෙනි.

(3). පර්‍යාප්ති මණ්ඩලය, අධීක්ෂණ කාරක සභාව සහ තේරීම් කාරක සභාවට තම තමන්ට පැවරී ඇති කටයුතු සඳහා වෙන වෙනම රැස්විය හැකිය.

(4). සභානායක ස්ථවිරයන්ට අවශ්‍ය යැයි හැඟේ නම්, මහා සංඝ සභාව වෙනම රැස් කළ හැකිය.

(5). ඉහත සඳහන් මණ්ඩල, සභා සහ කාරක සභා විසින් ගනු ලබන තීරණ සඳහා උත්තරීතර සංඝ සභාවේ අනුමැතිය අවශ්‍ය වන්නේ නම්, එම යෝජනා මහා සභාවාරය පැවැත්වීමට අවම වශයෙන් මාස දෙකකට පෙර උත්තරීතර සංඝ සභාවේ සියලු පාර්ශ්වයන් වෙත ලිඛිතව යොමු කළ යුතුය. අනතුරුව ඒවා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මහා සභාවාරයේදී සම්මත කළ යුතුය.

උත්තරීතර සංඝ සභාවේ විශේෂ සභාවාර

උත්තරීතර මහානායක මණ්ඩලයට අවශ්‍ය යැයි හැඟේ නම්, සභානායක ස්ථවිරයන්ට උත්තරීතර සංඝ සභාවේ විශේෂ සභාවාරයක් කැඳවන ලෙස උපදෙස් දිය හැකිය.

මහානායක මණ්ඩලයේ මහානායක ස්ථවිරවරුන් දස දෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විශේෂ සභාවාරයක් කැඳවීම අවශ්‍ය බව ලිඛිතව උත්තරීතර මහානායක මණ්ඩලයට දැනුම්

	දුනහොත්, උත්තරීතර මහා නායක මණ්ඩලය විසින් එම ඉල්ලීමට ගරු කොට සභානායක ස්ථවිරයන්ට විශේෂ සභාවාරයක් කැඳවන ලෙස උපදෙස් දිය යුතුය.
ගණ පූරණය	(1). උත්තරීතර සංඝ සභාවේ ගණපූරණය එහි සාමාජිකයන් දෙසිය පනහ (300) කි. (2). උත්තරීතර සංඝ සභාවට අනුබද්ධ මණ්ඩල, සභා සහ කාරක සභාවල ගණපූරණය ඒ ඒ ආයතනයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකි. (3). උත්තරීතර මහානායක මණ්ඩලයේ ගණපූරණය එහි සියලු සාමාජිකයන් වේ.

දසවෙනි පරිච්ඡේදය:
සංඝභාර නිත්ථාරක සභාව

සංඝභාර නිත්ථාරක සභාව පිහිටුවීම

පර්යාප්තිය, ප්‍රතිපත්තිය, නවකර්ම, විනයකර්ම, ගිලානෝපාස්ථානය යනාදී සංඝයාගේ කුදු මහත් කටයුතු විනයානුකූලව, කාර්යක්ෂමව සහ මනා කළමනාකරණයකින් පවත්වාගෙන යාම බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය සඳහා අත්‍යාවශ්‍ය වේ. එවැනි කටයුතු සාර්ථකව ඉටු කර ගෙන යා හැක්කේ ධර්මවිනය කෙරෙහි සහ සංඝයා කෙරෙහි මහත් ගරුත්වය ඇති, ව්‍යක්ත, ප්‍රතිබල, අගතිගාමී නොවන, ශාසනමාමක සහ භික්ෂු සංඝයාගේ විශ්වාසය දිනාගත් ස්ථවිර භික්ෂූන් වහන්සේලාට ය.

ඒ අනුව, සංඝයාගේ කුදු මහත් අත්‍යාවශ්‍ය කටයුතු ධර්ම විනයානුකූලව සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථානුකූලව සම්පාදනය කිරීම සඳහා ද, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, නීති සහ ශ්‍රී ලංකාව විසින් පිළිගෙන ඇති ජාත්‍යන්තර බැඳීම්වලට පටහැනි නොවන අයුරින් ශාසනික කටයුතු කිරීම සඳහා ද, භික්ෂූන් වහන්සේලාගේ සහ සිල්මාතාවරුන්ගේ ශාසනික ජීවිතවල තත්ත්වය උසස් කිරීම සහ සම්බුද්ධ ශාසනය ශ්‍රී ලංකාව තුළ මෙන් ම ඉන් පිටත ද ව්‍යාප්ත කිරීම සඳහා ද ධර්ම විනය උගත්, කාර්යශූර ස්ථවිරවරුන්ගෙන් සමන්විත සංඝභාර නිත්ථාරක සභාවක් උත්තරීතර සංඝ සභාව විසින් පිහිටුවිය යුතු ය.

සංඝභාර නිත්ථාරක සභාවේ ධුර කාලය

සංඝභාර නිත්ථාරක සභාව වසර හතරක ධුර කාලයක් සඳහා පත් කළ යුතුය.

එක් වරක් පත් කරනු ලැබූ සංඝභාර නිත්ථාරක සභාවක් තම ධුර කාලය අවසන් වීමත් සමඟ අහෝසි වන අතර, උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුව උත්තරීතර සංඝ සභාව විසින් ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහාස්ථවිරයන් වහන්සේ ඇතුළු සංඝභාර නිත්ථාරක සභාව, එහි මණ්ඩල සහ කමිටුවල ප්‍රධානීන් ද සමඟ නැවත සම්පූර්ණයෙන් පත් කළ යුතුය.

සංඝභාර නිත්ථාරක සභාවේ අරමුණු සහ කාර්යභාරය

සංඝ අභිවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකාව තුළ භික්ෂූන් වහන්සේලාගේ සහ සිල්මාතාවරුන්ගේ සිව්පස සහ ආධ්‍යාත්මික අභිවෘද්ධිය සඳහා ධර්මවිනයානුකූලව සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථානුකූලව කටයුතු සම්පාදනය කිරීම යි. භික්ෂූන් වහන්සේලාගේ සහ සිල්මාතාවරුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍යය, විහාරස්ථාන, විනයානුකූල ජීවිත ප්‍රවර්ධනය කිරීමේ වගකීම ඇතුලු බුද්ධ ශාසනයේ චිරස්ථිතියට, ස්ථාවරත්වයට, දියුණුවට සහ ව්‍යාප්තියට හේතු වන කටයුතු ධර්මවිනයට සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුව සිදු කිරීම සංඝභාර නිත්ථාරක සභාවට පැවරේ.

සංඝභාර නිත්ථාරක සභාවේ මූල්‍ය කාර්යභාරය	සංඝභාර නිත්ථාරක සභාව විසින් "ශාසන සංවර්ධන අරමුදල" වෙතින් ලැබෙන අරමුදල් විනයානුකූලව, විනිවිදභාවයෙන් සහ කාර්යක්ෂමව භාවිත කරමින් උත්තරීතර සංඝ ව්‍යවස්ථාව යටතේ ස්ථාපනය කර ඇති සංඝ සභා, සංඝාධිකරණ, මණ්ඩල, කමිටු, ආයතන, සමූහ සහ අනෙකුත් ශාසනික ව්‍යාපෘතිවල අභිවෘද්ධිය සඳහා කටයුතු කළ යුතුය.
සංඝභාර නිත්ථාරක සභාවේ මණ්ඩල, කමිටු සහ සමූහ	සංඝභාර නිත්ථාරක සභාව පහත මණ්ඩල සහ කමිටුවලින් සමන්විත ය. (1). ශාසන අරමුදල් මණ්ඩලය (2). පර්‍යාප්ති-ප්‍රතිපත්ති ශාසන මණ්ඩලය (3). ගිලානෝපස්ථාන මණ්ඩලය (4). විහාර සංවර්ධන මණ්ඩලය (5). ශාසන ලේඛන සහ ග්‍රන්ථ මණ්ඩලය (6). ධර්මදූත හා ජාත්‍යන්තර ශාසන සම්බන්ධතා මණ්ඩලය (7). විනය විමර්ශන කමිටුව (8). විනය කාරක කමිටුව (9). විනය උපකාරක සමූහය (10). ශාසන සන්නිවේදන මණ්ඩලය (11). සාමණේර සුභසාධන හා ආරක්ෂණ මණ්ඩලය (12). සීලමාතා සුභසාධන සහ ආරක්ෂණ මණ්ඩලය ඉහතින් දක්වා ඇති මණ්ඩල, කමිටු සහ සමූහවලට අමතරව තවත් ශාසනික කටයුතු කාර්‍යක්ෂමව සිදු කර ගෙන යාමට තවත් මණ්ඩල, කමිටු හෝ සමූහ පිහිටුවීමට අවශ්‍යය යැයි උත්තරීතර සංඝ සභාවට පෙනී ගිය හොත් උත්තරීතර සංඝ සභාව විසින් අවශ්‍ය මණ්ඩල, කමිටු හෝ සමූහ පිහිටු වීමට විධිවිධාන යෙදිය යුතුය. එම කටයුතු උත්තරීතර සංඝ සභාව විසින් සමගාමී බහුතර ඡන්දයෙන් සිදු කළ යුතුය.
ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහා ස්ථවිර	ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහාස්ථවිරයන් වහන්සේ සංඝභාර නිත්ථාරක සභාවේ මුලසුන හොබවති. උත්තරීතර සංඝ සභාවේ මහා සභාවේ අනුනායක මණ්ඩලය නියෝජනය කරන මහාස්ථවිරවරුන් අතුරින් උත්තරීතර මහානායක මණ්ඩලය සුදුසු යැයි සලකනු ලබන මහාස්ථවිරවරයෙකු, උත්තරීතර මහානායක මණ්ඩලය විසින් වසර හතරක ධුර කාලයක් සඳහා ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහාස්ථවිර තනතුරට පත් කළ යුතුය.

	ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක මහාස්ථවිරවරයෙකු තම ධුර කාලය සම්පූර්ණ කිරීමෙන් පසු නැවත එම තනතුරට පත් කිරීමට සුදුසුකම් නොලබයි. ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක ධුරය සියම්, අමරපුර සහ රාමඤ්ඤ යන නිකාය තුන අතර අනුපිළිවෙළින් මාරුවෙන් මාරුවට පැවරිය යුතුය. ඒ අනුව අදාළ ධුර කාලය සඳහා ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක මහා ස්ථවිරයෙකු තෝරා ගැනීමේ දී, එම අවස්ථාවේ ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක ධුරයට හිමිකම් ලබන නිකාය නියෝජනය කරන අනුනායක මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් එක් අයෙකු පත් කළ යුතුය.
සංඝභාර නිත්‍යාරක සභාවේ සභාවාර	සංඝභාර නිත්‍යාරක සභාවේ සභාවාර ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක මහා ස්ථවිරයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රැස් වන්නේ ය. සංඝභාර නිත්‍යාරක සභාවේ සභාවාර, ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක මහා ස්ථවිරයන් වහන්සේගෙන්, ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලයේ ලේඛකාධිකාරී ස්ථවිරයන්ගෙන්, විනය උපකාරක සමූහයේ ප්‍රධාන ස්ථවිරයන් සහ ලේඛකාධිකාරී ස්ථවිරයන් හැර සංඝභාර නිත්‍යාරක සභාවට අයත් අනෙකුත් මණ්ඩල සහ කමිටුවල ප්‍රධාන ස්ථවිරවරුන් සහ ලේඛකාධිකාරීවරුන්ගෙන් සමන්විත වන්නේ ය. සංඝභාර නිත්‍යාරක සභාවේ සභාවාරයක ගණපූරණය සාමාජිකයන් පස් නමක් වන්නේ ය. සංඝභාර නිත්‍යාරක සභාවේ සභාවාරවල තීරණ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුතු වන්නේ ය. ඡන්ද සංඛ්‍යාව සම වන අවස්ථාවක දී, ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක මහා ස්ථවිරයන් වහන්සේගේ ඡන්දය තීරක ඡන්දය වන්නේ ය.
අනුප්‍රාප්තික ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක මහා ස්ථවිර	ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක මහාස්ථවිරයන් වහන්සේ ධුරයෙන් ඉවත් වීම, ධුරයෙන් ඉවත් කිරීම, උපසම්පදාව ප්‍රතික්ෂේප කිරීම, පාරාජිකා වීම, අපවත් වීම, හෝ ධුරය දැරීමට අපොහොසත් වීමක දී ඉතිරි ධුර කාලය සඳහා උත්තරීතර මහානායක මණ්ඩලය විසින් වෙනත් මහාස්ථවිරවරයෙකු අනුප්‍රාප්තික ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක තනතුරට පත් කළ යුතුය.
ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක ධුරයේ කටයුතු භාර ගැනීම	තථාගතයන් වහන්සේ හෝ ගරු කටයුතු මහාස්ථවිරයන් වහන්සේලා ඉදිරියේ භික්ෂුවක් විසින් දෙනු ලබන ප්‍රතිඥාව ශාසනික වශයෙන් ගරු කරනු ලබන අතර, එවැනි ප්‍රතිඥාවක් දෙනු ලබන භික්ෂුව එය රක්ෂා කිරීමට ශාස්තෘ ගෞරවයෙන් සහ සංඝ ගෞරවයෙන් බැඳී සිටින්නේ ය. ඒ අනුව, උත්තරීතර මහානායක මණ්ඩලය විසින් තෝරා පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්‍යාරක මහාස්ථවිරයන් වහන්සේ, උත්තරීතර මහානායක මණ්ඩලය ඉදිරියේ පළමු උපලේඛනයේ

	සඳහන් ප්‍රතිඥාව ලබා දීමෙන් අනතුරුව තම ධුරයේ කටයුතු භාර ගත යුතුය. අභිනව ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහාස්ථවිරයන් වහන්සේ විසින් උත්තරීතර මහානායක මණ්ඩලය ඉදිරියේ ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ප්‍රතිඥාව ලබා දෙන දිනයේ සිට අභිනව සංඝභාර නිත්ථාරක සභාවේ ධුර කාලය ආරම්භ වන්නේ ය. අනුප්‍රාප්තික ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහාස්ථවිරයන් වහන්සේ උත්තරීතර මහානායක මණ්ඩලය ඉදිරියේ ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ප්‍රතිඥාව ලබා දෙන මොහොතේ සිට තම ධුරයේ කටයුතු භාර ගන්නා නමුත්, එම මහාස්ථවිරයන් වහන්සේගේ ධුර කාලය අදාළ සංඝභාර නිත්ථාරක සභාවේ ඉතිරි ධුර කාලයට පමණක් සීමා වන්නේ ය.
සංඝභාර නිත්ථාරක සභාවේ මණ්ඩල සහ කමිටු ප්‍රධානීහු	සංඝභාර නිත්ථාරක සභාවේ මණ්ඩල සහ කමිටු සුදුසුකම් ලත් ස්ථවිරවරයෙකුගේ ප්‍රධානත්වය යටතේ ක්‍රියාත්මක විය යුතුය. සංඝභාර නිත්ථාරක සභාවේ මණ්ඩල සහ කමිටු ප්‍රධානීන් පත් කිරීම උත්තරීතර සංඝ සභාවේ තේරීම් කාරක සභාව විසින් සිදු කළ යුතු අතර, එහි දී ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහාස්ථවිරයන් වහන්සේගේ යෝජනා ද සලකා බැලිය යුතුය. සීලමාතා සුභ සාධන සහ ආරක්ෂණ මණ්ඩලය සහ විනය උපකාරක සමූහය හැර සංඝභාර නිත්ථාරක සභාවේ මණ්ඩල සහ කමිටුවල මුලසුන සඳහා ස්ථවිරවරුන් තෝරා පත් කර ගත යුත්තේ උත්තරීතර සංඝ සභාවේ මහා සංඝ සභාව නියෝජනය කරන, වස් දහයක් හෝ ඊට වැඩි සහ ව්‍යවස්ථාවෙන් නියම කර ඇති සුදුසුකම් සම්පූර්ණ කළ සාමාජිකයන් අතුරිනි. විනය උපකාරක සමූහය හැර සංඝභාර නිත්ථාරක සභාවේ සෙසු මණ්ඩල සහ කමිටු ප්‍රධානීන්ගේ ධුර කාලය, සංඝභාර නිත්ථාරක සභාවේ ධුර කාලයට සමගාමී වන අතර, එම සභාවේ ධුර කාලය අවසන් වීමත් සමඟ ම ඔවුන්ගේ ධුර කාලය ද අවසන් වන්නේ ය. සංඝභාර නිත්ථාරක සභාවේ එක් එක් ධුර කාලයක දී මණ්ඩල සහ කමිටු ප්‍රධානීන් පත් කිරීමේ දී සියම්, අමරපුර සහ රාමඤ්ඤ නිකාය අතර සමතුලිත නියෝජනයක් තහවුරු වන පරිදි කටයුතු කිරීමට තේරීම් කාරක සභාව වගබලා ගත යුතුය. විනය උපකාරක සමූහයේ හැර සංඝභාර නිත්ථාරක සභාවේ මණ්ඩලයක හෝ කමිටුවක ප්‍රධානියෙකු තම ධුර කාලය සම්පූර්ණ කිරීමෙන් පසු තවත් එක් ධුර කාලයක් සඳහා පමණක් සංඝභාර නිත්ථාරක සභාවේ එම මණ්ඩලයේ හෝ කමිටුවේ හෝ විනය උපකාරක සමූහය හැර වෙනත් මණ්ඩලයක හෝ කමිටුවක ප්‍රධාන ධුරයකට පත් කිරීමට සුදුසුකම් ලබයි. සංඝභාර නිත්ථාරක සභාවේ මණ්ඩලයක හෝ කමිටුවක ප්‍රධානියෙකු ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම, උපසම්පදාව ප්‍රතික්ෂේප කිරීම, පාරාජිකා වීම, අපවත් වීම හෝ ධුරය

	දැරීමට අපොහොසත් වීමක දී, ඉතිරි ධුර කාලය සඳහා උත්තරීතර සංඝ සභාවේ තේරීම් කාරක සභාව විසින් ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහාස්ථවිරයන් වහන්සේගේ යෝජනා ද සලකා බලමින් වෙනත් සුදුසු මහාස්ථවිරවරයෙකු පත් කළ යුතුය.
මණ්ඩල සහ කමිටුවල පත්කිරීම් සහ ක්‍රියාපටිපාටි	ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලය සහ විනය උපකාරක සමූහය හැර, සංඝභාර නිත්ථාරක සභාවට අයත් සෙසු මණ්ඩල සහ කමිටුවල ප්‍රධානීන් නොවන සාමාජිකයන් පත් කිරීමේ ආකාරය, ඒවායේ සංයුතිය, සෙසු නිල, ක්‍රියාපටිපාටීන් සහ බලතල සම්බන්ධ විධිවිධාන උත්තරීතර සංඝ සභාව විසින් කතිකා මඟින් සම්මත කළ යුතුය.
ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලය	සංඝභාර නිත්ථාරක සභාවේ මූල්‍ය කටයුතු විධිමත්ව පරිපාලනය කිරීම සඳහා එම සභාව යටතේ "ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලය" නමින් මණ්ඩලයක් උත්තරීතර සංඝ සභාව විසින් පිහිටුවිය යුතුය.
ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලයේ කාර්යභාරය	ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලය විසින් වාර්ෂික අයවැය සැලසුම් කිරීම, "ශාසන සංවර්ධන අරමුදලෙන්" ලැබෙන අරමුදල් කළමනාකරණය සහ අදාළ සංඝ සභා, සංඝාධිකරණ, මණ්ඩල, කමිටු, ආයතන, සමූහ සහ ශාසනික ව්‍යාපෘති වෙත වෙන් කිරීම, වියදම් අධීක්ෂණය, ගිණුම් පවත්වාගෙන යාම සහ මූල්‍ය වාර්තාකරණය යන කාර්යයන් ඉටු කළ යුතුය.
ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලයේ සංයුතිය	ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලයේ මුලසුන ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහා ස්ථවිරයන් වහන්සේ විසින් හෙබවිය යුතු වන්නේ ය. මණ්ඩලයේ සංයුතියේ දී සෑම නිකායකට ම සමාන නියෝජනයක් ලැබෙන බව සහතික කළ යුතු වන්නේ ය. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ සංඝභාර නිත්ථාරක මහා ස්ථවිරයන් වහන්සේ අයත් නිකාය හැර අනෙකුත් නිකාය දෙක නියෝජනය කරමින් අනුනායක මහා ස්ථවිරයන් වහන්සේ නම බැගින් ද, ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලයේ ලේඛකාධිකාරී මහා ස්ථවිරයන් වහන්සේලා තිදෙනා ද, උත්තරීතර සංඝ සභාවේ මහා සංඝ සභාව නියෝජනය කරමින් අනුනායක මණ්ඩලයේ සාමාජිකයන් නොවන, එක් එක් නිකාය නියෝජනය කරන මහා ස්ථවිරයන් වහන්සේ නමක් බැගින් ද, ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලයේ සාමාජිකයන් විය යුතු වන්නේ ය. ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලය සාමාජික ස්ථවිරයන් නව නමකින් සමන්විත වන්නේ ය.
සංවර්ධන සැලසුම් සහ වියදම් ඇස්තමේන්තු	ශාසන අරමුදල් පරිපාල මණ්ඩලය විසින් සෑම වර්ෂයක ම අවසානයේ දී ඊළඟ වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන සැලැස්ම සහ ඒ සඳහා අවශ්‍ය වියදම් ඇස්තමේන්තුව සකස් කොට උත්තරීතර සංඝ සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

අරමුදල් නිදහස් කිරීම සහ බෙදාහැරීම	එම සංවර්ධන සැලැස්ම සහ වියදම් ඇස්තමේන්තුව උත්තරීතර සංඝ සභාව විසින් සලකා බලා අනුමත කිරීමෙන් අනතුරුව, “ශාසනාරක්ෂක දායක සභාව” විසින් ශාසන සංවර්ධන අරමුදලෙන් අවශ්‍ය අරමුදල් ශාසන අරමුදල් පරිපාල මණ්ඩලය වෙත නිදහස් කළ යුතුය. මෙලෙස ලැබෙන අරමුදල් අදාළ සංඝ සභා, සංඝාධිකරණ, මණ්ඩල, කමිටු, ආයතන, සමූහ සහ ශාසනික ව්‍යාපෘති වෙත අවශ්‍යතා සහ ප්‍රමුඛතා අනුව සාධාරණව, විනිවිදභාවයෙන් සහ කාර්යක්ෂමව වෙන් කර දීම සහ ඒවා අදාළ ශාසනික අරමුණු සඳහා නිසි පරිදි භාවිත වන බවට වග බලා ගැනීම ශාසන අරමුදල් පරිපාල මණ්ඩලයේ වගකීම වේ.
වාර්තාකරණය, විගණනය සහ වගවීම	ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලය විසින් අරමුදල් භාවිතය පිළිබඳ වාර්ෂික මූල්‍ය වාර්තාවක් සහ සංවර්ධන ප්‍රගති වාර්තාවක් උත්තරීතර සංඝ සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, ශාසනාරක්ෂක දායක සභාව ද ඒ පිළිබඳ දැනුවත් කළ යුතුය. ශාසන අරමුදල් පරිපාල මණ්ඩලයේ සියලු ම මූල්‍ය කටයුතු සහ ගිණුම් වාර්තා ශ්‍රී ලංකා රජයේ විගණකාධිපතිවරයාගේ අධීක්ෂණය සහ විගණනය යටතේ පැවතිය යුතුය.
මූල්‍ය පරිපාලනයේ මූලධර්ම	ශාසන අරමුදල් පරිපාලන මණ්ඩලය විසින් සියලු ම මූල්‍ය කටයුතු විනයානුකූලව, අපක්ෂපාතීව සහ විනිවිදභාවයෙන් යුතුව සිදු කළ යුතු අතර, ශාසනික අරමුදල් කිසිවිටෙකත් පුද්ගලික හෝ ශාසනානුලෝමික නොවන කටයුතු සඳහා භාවිත නොකළ යුතුය
පර්‍යාප්ති-ප්‍රතිපත්ති ශාසන මණ්ඩලය	පර්‍යාප්ති-ප්‍රතිපත්ති ශාසන මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකාව තුළ භික්ෂූන් වහන්සේලාගේ සහ සිල්මාතාවරුන්ගේ පර්‍යාප්ති ශාසනය සහ ප්‍රතිපත්ති ශාසනය ශක්තිමත් කිරීම ය. තථාගතයන් වහන්සේගේ ධර්මය විකෘති වීමට ඉඩ නොතබමින් භික්ෂු අධ්‍යාපනය, භාවනා පුහුණුව සහ බෞද්ධ අධ්‍යාපන ආයතනවල ධර්ම ඉගැන්වීම සහ භාවනා පුහුණුව නිවැරදිව සිදු වන පරිදි කටයුතු සැලැස්වීම පර්‍යාප්ති-ප්‍රතිපත්ති ශාසන මණ්ඩලයට පැවරේ.
මූලික පිරිවෙන් අධ්‍යාපනය	මූලික පිරිවෙන් අධ්‍යාපනය පර්‍යාප්ති-ප්‍රතිපත්ති ශාසන මණ්ඩලය යටතට පැවරේ. මූලික පිරිවෙන් අධ්‍යාපනය තුළින් නවක භික්ෂූනගේ, සාමණේර හිමිවරුන්ගේ සහ නවක සිල්මාතාවන්ගේ ධර්ම අධ්‍යාපනය හා ආධ්‍යාත්මික දියුණුව සඳහා අවශ්‍ය මූලික දැනුම සහ පුහුණුව ලබා දිය යුතුය. විශේෂයෙන් ම සාමණේර හිමිවරුන්ට උපසම්පදාව ලැබීම සඳහා අවශ්‍ය මූලික ධර්ම-විනය දැනුම සහ පුහුණුව ද ලබා දිය යුතුය.

	තව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශ ද ලබා ගනිමින් සාමණේර හිමිවරුන්ට සහ නවක සිල්මාතාවන්ට අවශ්‍ය ලෞකික දැනුම ද මූලික පිරිවෙන් අධ්‍යාපනයට ඇතුළත් කළ යුතුය.
මූලික පිරිවෙන් විෂය නිර්දේශය	මූලික පිරිවෙන් අධ්‍යාපනය සඳහා ධර්මය සහ විනය මූලික කරගත්, නවක භික්ෂූන්ගේ, සාමණේර හිමිවරුන්ගේ සහ නවක සිල්මාතාවන්ගේ ශ්‍රමණ ආකල්ප සහ චරිත වර්ධනය වන ආකාරයේ විෂය නිර්දේශයක් සකස් කළ යුතුය. එම විෂය නිර්දේශය සකස් කිරීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින්, සෑම දරුවෙකුගේ ම බුද්ධි වර්ධනය සඳහා අත්‍යාවශ්‍ය ලෞකික විෂයයන් ද අවශ්‍ය ප්‍රමාණයෙන් ඇතුළත් කළ යුතුය. මූලික පිරිවෙන් විෂය නිර්දේශය සකස් කිරීම, එයට සංශෝධන එක් කිරීම සහ ශාසනික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කිරීම උත්තරීතර සංඝ සභාවේ පර්යාප්ති කමිටුව වෙත පැවරේ. පර්යාප්ති කමිටුව විසින් සකස් කරනු ලබන විෂය නිර්දේශ, සංශෝධන සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ උත්තරීතර සංඝ සභාවේ අනුමැතියෙන් පසු සියලු මූලික පිරිවෙන්වල ක්‍රියාත්මක කළ යුතුය.
උසස් පිරිවෙන් අධ්‍යාපනය	මූලික පිරිවෙන් අධ්‍යාපනය සාර්ථකව සම්පූර්ණ කළ නවක භික්ෂූන් වහන්සේලාට, සාමණේර හිමිවරුන්ට සහ සිල්මාතාවන්ට තම ධර්ම-විනය ඥානය, ශාස්ත්‍රීය ඥානය සහ ධර්ම-විනය සම්බන්ධ පර්යේෂණ කුසලතා වර්ධනය කර ගැනීම සඳහා උසස් පිරිවෙන් පවත්වාගෙන යා යුතුය.
උසස් පිරවෙන් පාඨමාලා	උසස් පිරිවෙන්වල පහත සඳහන් පාඨමාලා හැදෑරීම සඳහා භික්ෂූන් වහන්සේලාට සහ සිල්මාතාවන්ට අවස්ථාව සැලසිය යුතුය. (1). නිස්සයමුත්තක පාඨමාලාව (2). පරිසුපට්ඨාපක පාඨමාලාව (3). ත්‍රිපිටකාචාර්ය උපාධිය (4). ප්‍රාචීන භාෂෝපකාර සමිතිය විසින් පවත්වනු ලබන රාජකීය පණ්ඩිත උපාධිය
නිස්සයමුත්තක පාඨමාලාව	වසර හයක නිශ්‍රයමුක්තක පාඨමාලාව මඟින් භික්ෂුවකට සහ සිල්මාතාවකට ගුරුවරයෙකුගේ නිරන්තර උපකාර නොමැතිව ස්වාධීනව භික්ෂු සහ සිල්මාතා ජීවිතය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ධර්ම-විනය දැනුම, භාවනා පුහුණුව සහ ප්‍රායෝගික කුසලතා ලබා දිය යුතුය. තව ද එම පාඨමාලාව මඟින් නිශ්‍රයමුක්තක සුදුසුකම් හත වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසිය යුතුය.

පරිසුපට්ඨාපක පාඨමාලාව

වසර දෙකක පරිසුපට්ඨාපක පාඨමාලාව මඟින් භික්ෂුවකට ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද, සිල්මාතාවකට ශිෂ්‍ය සිල්මාතාවන් ද ධර්මවිනයෙහි පුහුණු කරවීමට, නිවන් මඟ පෙන්වීමට සහ ශාසනික වගකීම් දැරීමට අවශ්‍ය ධර්ම-විනය දැනුම, නායකත්ව කුසලතා සහ පරිසුපට්ඨාපක සුදුසුකම් පහ වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසිය යුතුය.

ත්‍රිපිටකාචාර්ය උපාධිය

ත්‍රිපිටකය පිළිබඳ ගැඹුරු පර්යේෂණාත්මක දැනුමක් ඇති, ධර්මවිනය සම්බන්ධ ශාස්ත්‍රීය පර්යේෂණ හා අර්ථකථන කටයුතුවලට දායක විය හැකි භික්ෂුවක් සහ සිල්මාතාවක් බිහි කිරීමේ අරමුණින්, විනය පිටකය, සූත්‍ර පිටකය සහ අභිධර්ම පිටකය ආවරණය වන පරිදි ත්‍රිපිටකාචාර්ය උපාධි පාඨමාලාව පර්යාප්ති කමිටුව විසින් සකස් කර උත්තරීතර සංඝ සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. උසස් පිරිවෙන්වල එම උපාධිය හැදෑරීමට අවස්ථාව සලසා දිය යුතුය.

ත්‍රිපිටක විශාරද පර්යේෂණ වැඩසටහන

ත්‍රිපිටකාචාර්ය උපාධියෙන් පසුව ත්‍රිපිටකය සහ ධර්මවිනය සම්බන්ධ ස්වාධීන ශාස්ත්‍රීය පර්යේෂණවල නියැලීමට කැමති භික්ෂූන් වහන්සේලා සහ සිල්මාතාවරුන් සඳහා, ත්‍රිපිටක විශාරද පර්යේෂණ වැඩසටහනක් පර්යාප්ති කමිටුව විසින් සකස් කර උත්තරීතර සංඝ සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

රාජකීය පණ්ඩිත උපාධිය

ප්‍රාචීන භාෂෝපකාර සමිතිය විසින් පවත්වාගෙන යනු ලබන රාජකීය පණ්ඩිත උපාධිය මඟින් භික්ෂූන් වහන්සේලාට සහ සිල්මාතාවන්ට ධර්ම-විනය ඥානය මෙන් ම ශාස්ත්‍රීය ඥානය ද වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසිය යුතුය.

උසස් පිරිවෙන් විෂය නිර්දේශය

උසස් පිරිවෙන් අධ්‍යාපනය සඳහා නවක භික්ෂූන් වහන්සේලාගේ සහ සිල්මාතාවන්ගේ ධර්ම-විනය ඥානය සහ ධර්ම-විනය සම්බන්ධ පර්යේෂණ කුසලතා වර්ධනය වන අයුරින් විශ්ව විද්‍යාල කොමිෂන් සභාව සමඟ සමීපව කටයුතු කරමින් විෂය නිර්දේශ සකස් කළ යුතුය.

උසස් පිරිවෙන් විෂය නිර්දේශ සකස් කිරීම, එයට සංශෝධන එක් කිරීම සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කිරීම උත්තරීතර සංඝ සභාවේ පර්යාප්ති කමිටුව වෙත පැවරේ.

පර්යාප්ති කමිටුව විසින් සකස් කරනු ලබන විෂය නිර්දේශ, සංශෝධන සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ උත්තරීතර සංඝ සභාවේ අනුමැතියෙන් පසු සියලු උසස් පිරිවෙන්වල ක්‍රියාත්මක කළ යුතුය.

විෂය නිර්දේශයක අර්ථයට, අන්තර්ගතයට, විෂය පථයට හෝ අනිවාර්ය අධ්‍යයන අවශ්‍යතාවන්ට බලපෑමක් නොකරන මුද්‍රණ දෝෂ, අක්ෂර වින්‍යාස දෝෂ සහ අනෙකුත් සුළු සංස්කරණාත්මක සංශෝධන පර්යාප්ති-ප්‍රතිපත්ති ශාසන මණ්ඩලයේ ප්‍රධාන ස්ථවිරයන් වහන්සේගේ අනුමැතියෙන් සිදු කළ හැකි ය.

මූලික සහ උසස් පිරිවෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ	භික්ෂූන් වහන්සේලාගේ, සාමණේර හිමිවරුන්ගේ සහ සිල්මාතාවරුන්ගේ ධර්ම-විනය අධ්‍යාපනය බුද්ධ ශාසනයේ අනාගතය සහ චිරස්ථිතිය කෙරෙහි සෘජුව බලපාන බැවින්, මූලික පිරිවෙන් සහ උසස් පිරිවෙන් විෂය නිර්දේශ, එම විෂය නිර්දේශවල සංශෝධන සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ උත්තරීතර සංඝ සභාව විසින් ම අනුමත කළ යුතුය. මූලික සහ උසස් පිරිවෙන් විෂය නිර්දේශයක අර්ථයට, අන්තර්ගතයට, විෂය පථයට හෝ අනිවාර්ය අධ්‍යයන අවශ්‍යතාවන්ට බලපෑමක් නොකරන මුද්‍රණ දෝෂ, අක්ෂර වින්‍යාස දෝෂ සහ අනෙකුත් සුළු සංස්කරණාත්මක සංශෝධන පර්යාප්ති-ප්‍රතිපත්ති ශාසන මණ්ඩලයේ ප්‍රධාන ස්ථවිරයන් වහන්සේගේ අනුමැතියෙන් සිදු කළ හැකි ය.
උසස් පිරිවෙන් පාඨමාලාවල අධ්‍යාපනික මට්ටම	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ නිශ්‍රයමුක්තක පාඨමාලාවේ පළමු වසර දෙක උසස් ඩිප්ලෝමා මට්ටමකින් ද, ඉතිරි වසර හතර ශාස්ත්‍රවේදී උපාධියකට සමාන මට්ටමකින් ද සකස් කළ යුතුය. පරිසුපට්ඨාපක පාඨමාලාව ශාස්ත්‍රපති උපාධියකට සමාන මට්ටමකින් සකස් කළ යුතුය. ත්‍රිපිටක විශාරද පර්යේෂණ වැඩසටහන පශ්චාත් ආචාර්ය පර්යේෂණ වැඩසටහන (Postdoctoral) කි.
ශාසනික වගකීම් සඳහා අවශ්‍ය සුදුසුකම්	විහාරාධිපති තනතුරු සඳහා පත් කරනු ලැබිය යුත්තේ නිශ්‍රයමුක්තක පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ භික්ෂූන් වහන්සේලා පමණි. ගෝල භික්ෂූන් පැවිදි කිරීම සඳහා අනුමැතිය හිමි විය යුත්තේ පරිසුපට්ඨාපක පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ භික්ෂූන් වහන්සේලාට පමණි.
දහම් පාසල්	තථාගතයන් වහන්සේගේ සිව්වනක් ශ්‍රාවක පිරිස ම ධර්මය සහ විනය මනා ලෙස ඉගෙන ගැනීම බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා අතිශය වැදගත් සාධකයකි. මාර දිව්‍ය පුත්‍රයා විසින් පිරිනිවන් පෑම සඳහා කරන ලද ආරාධනාව තථාගතයන් වහන්සේ ප්‍රතික්ෂේප කළේ ද, තමන් වහන්සේගේ සිව්වනක් ශ්‍රාවක පිරිස ධර්මයේ ව්‍යක්ත, විනීත, විශාරද සහ ප්‍රතිබල වන තෙක් වැඩ සිටීමට අපේක්ෂා කළ බැවිනි. ධර්ම ඥානයෙන් මෙන් ම බෞද්ධ ආකල්ප, සදාචාරාත්මක වටිනාකම් සහ ගුණධර්මවලින් පෝෂිත ගිහි බෞද්ධ පරපුරක් බිහි කිරීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන දහම් පාසල් අධීක්ෂණය ද පර්යාප්ති–ප්‍රතිපත්ති ශාසන මණ්ඩලය යටතට ගත යුතු ය. දහම් පාසල් සඳහා වන විෂය නිර්දේශ පර්යාප්ති කමිටුව විසින් සකස් කරනු ලැබ, උත්තරීතර සංඝ සභාවේ අනුමැතියෙන් පසුව

ක්‍රියාත්මක කළ යුතු ය. එම විෂය නිර්දේශ සකස් කිරීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ අදාළ විශේෂඥයන්ගේ සහ උපදේශකයන්ගේ අදහස් හා උපදේශ ද ලබා ගත යුතු ය.

භාවනා මධ්‍යස්ථාන

"ඉමෙ ච, සුභද්ද, භික්ඛූ සම්මා විහරෙය්‍යුං, අසුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්ස" යන බුද්ධ වචනයට අනුව බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සහ වර්ධනය සඳහා ප්‍රතිපත්ති ශාසනයේ දියුණුව අත්‍යාවශ්‍ය වේ. ගිහි සහ පැවිදි දෙපාර්ශ්වයට ම නිවැරදිව භාවනා ක්‍රම ඉගැන්වනු ලබන භාවනා මධ්‍යස්ථාන පිහිටුවීම ශාසන දියුණුව සඳහා උසස් පිටිවහලකි.

පාර්ශ්වයන් සහ නිකායන්ට අයත් විහාරස්ථාන හා ආරාමවල පවත්වාගෙන යනු ලබන භාවනා මධ්‍යස්ථානවල ප්‍රධාන භාරකාරත්වය දැරිය යුත්තේ නිශ්‍රයමුක්තක පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ භික්ෂූන් විසිනි.

භාවනා මධ්‍යස්ථානවල ඉගැන්විය යුත්තේ ථේරවාද සම්ප්‍රදායට අනුකූල භාවනා ක්‍රම පමණක් වන අතර, ථේරවාද භාවනා යන නාමයෙන් ථේරවාද සම්ප්‍රදායට පටහැනි භාවනා ක්‍රම ප්‍රචාරය කිරීම හෝ ඉගැන්වීම නොකළ යුතු ය.

බෞද්ධ නීති විද්‍යාලය

තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද විනය ගැඹුරින් අධ්‍යයනය කර ඇති භික්ෂූන් වහන්සේලා බහුල ව සිටීම බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා අතිශය වැදගත් ය. තව ද ස්වභාවික යුක්තියේ මූලධර්ම, නීති දර්ශනය සහ අනෙකුත් මූලික නීති සංකල්ප පිළිබඳ දැනුම ලබා ගැනීමෙන් විනයධර භික්ෂූන් වහන්සේලාට විනය පිළිබඳ තම අවබෝධය තවදුරටත් ගැඹුරු කරගත හැකි ය.

සංඝාධිකරණ විනිශ්චයකාර තනතුරු, විනය විමර්ශන කමිටුව, විනය කාරක මණ්ඩලය සහ විනය උපකාරක මණ්ඩලය යන ආයතනවල වගකීම් සාර්ථකව ඉටු කිරීම සඳහා විනය දැනුම මෙන් ම නීති දැනුම ද අත්‍යවශ්‍ය වේ.

විශේෂයෙන් ම විහාරස්ථාන, විහාරාධිපතිත්වය, සංඝ දේපළ සහ අනෙකුත් බෞද්ධ ආයතන සම්බන්ධයෙන් Judicial Service of Sri Lanka යටතේ ශ්‍රී ලංකාවේ අධිකරණ විසින් ලබා දී ඇති නඩු තීන්දු අධ්‍යයනය කර තිබීම සංඝාධිකරණ විනිශ්චයකාර තනතුරු දැරීමේ දී අතිශය ප්‍රයෝජනවත් වේ.

ඉහත සඳහන් අවශ්‍යතා සපුරා ගැනීමේ අරමුණින් උත්තරීතර සංඝ සභාව විසින් ශ්‍රී ලංකා නීති විද්‍යාලය සමඟ සහයෝගීව කටයුතු කරමින් විනය, නීතිය සහ නීති දර්ශනය පිළිබඳ විශේෂඥ භික්ෂූන් වහන්සේලා බිහිකිරීම සඳහා "බෞද්ධ නීති විද්‍යාලයක්" ස්ථාපනය කළ යුතු ය.

බෞද්ධ නීති විද්‍යාලයේ මූලික උපාධිය ලබා තිබීම සංඝාධිකරණ විනිශ්චයකාර තනතුරු සහ විනය විමර්ශන කමිටුවේ, විනය කාරක

මණ්ඩලයේ හා විනය උපකාරක මණ්ඩලයේ තනතුරු සඳහා පත් කිරීමේ අනිවාර්ය පූර්ව සුදුසුකමක් විය යුතු ය.

සංඝභාර කළමනාකරණ විද්‍යාලය

විනයෙන් සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවෙන් තමන් වෙත පවරා ඇති කුඩු මහත් කටයුතු කාර්යක්ෂමව සහ නිවැරදිව ඉටු කිරීමට සංඝයාගේ කටයුතු භාර ස්ථවිරවරු බැඳී සිටිති. තථාගතයන් වහන්සේ චීවරභාජක, භත්තුද්දේසක, භණ්ඩාගාරික යනාදී සම්මුතිධාරීන් සඳහා සුදුසු භික්ෂූන් වහන්සේලා නිර්දේශ කිරීමේ දී "**භාජිතාභාජිතඤ්ච ජානෙය්‍ය**", "**උද්දිට්ඨානුද්දිට්ඨඤ්ච ජානෙය්‍ය**", "**ගුත්තාගුත්තඤ්ච ජානෙය්‍ය**" යනාදී වශයෙන් දක්වා ඇත්තේ තමන් වෙත පවරා ඇති විෂය පථයෙහි කාර්යක්ෂමව හා නිවැරදිව කටයුතු කිරීමට සමර්ථභාවය යි.

සංඝයාගේ කුඩු මහත් කටයුතු නිසි පරිදි ඉටු කිරීම සඳහා ධර්ම විනය පිළිබඳ දැනුම පමණක් නොව, පරිපාලනය, නායකත්වය, කළමනාකරණය සහ සංවිධාන මෙහෙයුම් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සහ කුසලතාවක් ද තිබීම වැදගත් ය.

සංඝභාර නිත්ථාරක සභාවේ තනතුරු දරමින්, තම තමන්ගේ නිකාය හා පාර්ශ්වයන්හි කාරක සභාදියෙහි වගකීම් ඉටු කරමින්, එමෙන් ම තමන් වසන විහාරස්ථානවල පරිපාලන වගකීම් දරමින්, දබ්බමල්ලපුත්ත මහ රහතන් වහන්සේ මෙන් සංඝයාට සේවය කිරීමට කැමති භික්ෂූන් වහන්සේලාට සංඝයාගේ විනයානුකූල කටයුතු මෙහෙයවීම සහ කළමනාකරණය පිළිබඳ ප්‍රාමාණික දැනුම හා කුසලතා ලබා දීම සඳහා උත්තරීතර සංඝ සභාව විසින් "සංඝභාර කළමනාකරණ විද්‍යාලය" නමින් විශේෂිත අධ්‍යාපන ආයතනයක් ස්ථාපනය කළ යුතුය.

රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක කළමනාකරණ අධ්‍යයන අංශය සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් සංඝභාර කළමනාකරණ විද්‍යාලයේ විෂය නිර්දේශ, උපාධි සහ සහතික පත්‍ර පාඨමාලා පාඨමාලා සහ පුහුණු වැඩසටහන් සකස් කළ යුතුය. එම පාඨමාලා තුළ පරිපාලනය පිළිබඳ මූලික සිද්ධාන්ත, නායකත්වය, විනයානුකූල මූල්‍ය කළමනාකරණය, වාර්තා තබා ගැනීම, සංවිධාන මෙහෙයුම්, ගැටුම් නිරාකරණය, ව්‍යවස්ථා සහ නීතිමය ක්‍රියාපටිපාටි, මෙන් ම විනයානුකූල ආරාමීය කටයුතු පරිපාලනය ආදී විෂයයන් ඇතුළත් විය යුතුය.

විශේෂයෙන් ම සංඝභාර නිත්ථාරක සභාවේ තනතුරු දැරීම සඳහා සංඝභාර කළමනාකරණ විද්‍යාලයේ උපාධියක් හෝ උත්තරීතර සංඝ සභාව විසින් පිළිගනු ලබන සමාන සුදුසුකමක් තිබීම ප්‍රමුඛ සුදුසුකමක් ලෙස සැලකිය යුතුය.

පය්‍යාප්ති-ප්‍රතිපත්ති අධීක්ෂණය හා සංවර්ධනය

පය්‍යාප්ති-ප්‍රතිපත්ති ශාසන මණ්ඩලය විසින් ඉහත සඳහන් සියලු ආයතනවල කාර්යයන් අධීක්ෂණය කිරීම, ඒවායේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සහ ඒවා ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විධිවිධාන සැලසිය යුතුය.

එමෙන්ම විහාරාධිපතිවරුන්, පරිවේණාධිපතිවරුන් සහ ධර්මාචාර්ය සහ කර්මස්ථානාචාර්ය භික්ෂූන් සහ සිල්මාතාවන් සඳහා අවශ්‍ය පුහුණු වැඩමුළු සහ නායකත්ව වැඩසටහන් ද සංවිධානය කළ යුතුය.

පර්යාප්ති විභාග කමිටුව සහ විභාග පැවැත්වීම

ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ සිල්මාතාවරු නිවැරදි ලෙස ධර්මවිනය ඥානය ලබාගෙන ඇති ද යන්න ආචාර්යවරු විසින් පරීක්ෂා කළ යුතුය. එමඟින් භික්ෂූන් වහන්සේලා සහ සිල්මාතාවරු ධර්මය සහ විනය නිවැරදිව අර්ථකථනය කිරීමට සහ අනුගමනය කිරීමට අවශ්‍ය දැනුමෙන් සන්නද්ධ වී ඇති බවට වගකිව හැකි වේ. එබැවින් ධර්මවිනය අධ්‍යාපනය ලැබූ භික්ෂූන් වහන්සේලාගේ සහ සිල්මාතාවරුන්ගේ දැනුම ඇගයීම සඳහා විධිමත් විභාග ක්‍රමවේදයක් පැවතීම අත්‍යාවශ්‍ය වේ.

ඒ සඳහා පර්යාප්ති–ප්‍රතිපත්ති ශාසන මණ්ඩලය විසින් "පර්යාප්ති විභාග කමිටුව" නමින් කමිටුවක් පිහිටුවිය යුතුය.

මූලික පිරිවෙන් පාඨමාලා, උසස් පිරිවෙන්වල නිශ්‍රයමුක්තක පාඨමාලා, පරිසුපට්ඨාපක පාඨමාලා සහ දහම් පාසල් අවසාන විභාගය පැවැත්වීමේ බලය සහ වගකීම පර්යාප්ති–ප්‍රතිපත්ති ශාසන මණ්ඩලයේ පර්යාප්ති විභාග කමිටුව සතු විය යුතුය.

එම විභාගවල සාධාරණභාවය, විනිවිදභාවය, නිරවද්‍යතාවය සහ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය සියලු විධිවිධාන සම්පාදනය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම ද එම කමිටුවේ වගකීම වේ.

ප්‍රාචීන භාෂෝපකාර සමිතිය විසින් පවත්වනු ලබන රාජකීය පණ්ඩිත විභාගය ඇතුළු බෞද්ධ නීතිවිද්‍යාලයේ සහ සංඝභාර කළමනාකරණ විද්‍යාලයේ විභාග කටයුතු අධීක්ෂණය කිරීමේ බලය සහ වගකීම ද පර්යාප්ති–ප්‍රතිපත්ති ශාසන මණ්ඩලයේ පර්යාප්ති විභාග කමිටුව සතු වේ.

ගිලානෝපස්ථාන මණ්ඩලය

සබ්‍රහ්මචාරීන් විසින් අතහැර දමන ලද ගිලන් භික්ෂුවකට ස්වකීය හස්තයෙන් උපස්ථාන කළ තථාගතයන් වහන්සේ, ගිලන් භික්ෂූන් වහන්සේලාගේ උපස්ථාන කටයුතු භික්ෂූන් වහන්සේලා විසින් ම මූලිකත්වය ගෙන සිදු කළ යුතු බවට අනුශාසනා කළහ. "**යො, භික්ඛවෙ, මං උපට්ඨහෙය්‍ය සො ගිලානං උපට්ඨහෙය්‍ය**" යන බුද්ධාවවාදය ද සිහි කරමින්, සංඝභාර නිත්ථාරක සභාව විසින් ගිලන් භික්ෂූන් වහන්සේලා සහ ගිලන් සිල්මාතාවරුන්ට උපස්ථාන කිරීමේත්, වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේලා සහ සිල්මාතාවරුන් රැකබලා ගැනීමේත් විධිමත් ක්‍රමවේද සකස් කළ යුතුය.

එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා "ගිලානෝපස්ථාන මණ්ඩලය" නමින් මණ්ඩලයක් පිහිටුවිය යුතුය.

මෙම මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ භික්ෂූන් වහන්සේලාගේ සහ සිල්මාතාවරුන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම, රෝග නිවාරණ හා ප්‍රතිකාර සේවා

	වැඩිදියුණු කිරීම, සහ වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේලාට හා සිල්මාතාවරුන්ට සුදුසු රැකවරණ සහ උපස්ථාන පද්ධති ස්ථාපිත කිරීම ය.
ගිලානාරාම	ගිලානෝපස්ථාන මණ්ඩලය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් භික්ෂූන් වහන්සේලා සහ සිල්මාතාවරුන් සඳහා ගිලානාරාම ස්ථාපිත කිරීමට සහ පවත්වාගෙන යාමට විධිවිධාන සැලසිය යුතුය. ගිලානෝපස්ථාන මණ්ඩලය විසින් ගිලානාරාමවල සේවා සහ පරිපාලන කටයුතු තථාගත විනයට අනුකූලව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, පරිපාලන විධිවිධාන සහ නියාමන ක්‍රමවේද සකස් කළ යුතුය.
වැඩිහිටි භික්ෂු සහ සිල්මාතා සුරැකුම් මධ්‍යස්ථාන	ගිලානෝපස්ථාන මණ්ඩලය විසින් වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේලා සහ සිල්මාතාවරුන් සඳහා සුදුසු නේවාසික සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවා ඒවා පවත්වාගෙන යාමට විධිවිධාන සැලසිය යුතුය. එම මධ්‍යස්ථානවල පදිංචි වන භික්ෂූන් වහන්සේලාගේ සහ සිල්මාතාවරුන්ගේ සෞඛ්‍යය, සුරක්ෂිතභාවය, අධ්‍යාත්මික සුභසාධනය සහ දෛනික අවශ්‍යතා නිසි පරිදි සපුරාලීම සඳහා අවශ්‍ය පහසුකම් සහ සේවාවන් සලසා දිය යුතුය.
විහාර සංවර්ධන මණ්ඩලය	බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා විහාරස්ථානවල දියුණුව සහ ඒවායේ මූලික අවශ්‍යතා සම්පූර්ණ වී තිබීම අත්‍යාවශ්‍ය සාධකයකි. එබැවින් විහාරස්ථාන, භික්ෂු ආරාම සහ සිල්මාතා ආරාමවල සංවර්ධනය සඳහා විධිමත් ක්‍රමවේද සකස් කිරීම අවශ්‍ය වේ. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා උත්තරීතර සංඝ සභාව විසින් "විහාර සංවර්ධන මණ්ඩලය" නමින් මණ්ඩලයක් පිහිටුවිය යුතුය. විහාරස්ථානවල අයිතිය, පරිපාලනය සහ අභ්‍යන්තර කටයුතු පෙර සේ ම අදාළ නිකාය හෝ පාර්ශ්වයන් යටතේ පැවතිය යුතු අතර, විහාරාධිපති සහ අනෙකුත් පරිපාලන තනතුරු සඳහා භික්ෂූන් වහන්සේලා පත් කිරීමේ බලය ද ඒ ඒ නිකාය හෝ පාර්ශ්ව සතු විය යුතුය. කෙසේ වෙතත්, විහාරාධිපති තනතුරක් සඳහා පත් කරනු ලබන භික්ෂුවක්, පර්‍යාප්ති-ප්‍රතිපත්ති ශාසන මණ්ඩලය විසින් පවත්වනු ලබන නිස්සයමුත්තක වැඩසටහන හෝ ඊට සමාන සුදුසුකමක් සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය.
විහාර සංවර්ධන මණ්ඩලයේ කාර්‍යභාරය	මෙම මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ විහාරස්ථාන, භික්ෂු ආරාම සහ සිල්මාතා ආරාමවල සංවර්ධනය සඳහා අවශ්‍ය සහාය ලබා දීම සහ ඒවායේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ය.

ඒ අනුව විහාරස්ථානවල ධර්මශාලා, චෛත්‍යය, බෝධිමලු, සනීපාරක්ෂක පහසුකම්, දානශාලා, නේවාසික පහසුකම්, ජල හා විදුලි සැපයුම් ඇතුළු මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම, සම්බන්ධීකරණය සහ සහාය ලබා දිය යුතුය.

තව ද භික්ෂූන් වහන්සේලාට සහ සිල්මාතාවරුන්ට ධර්ම, විනය ඉගෙනීම සහ භාවනා කටයුතු සඳහා සුදුසු, සුරක්ෂිත, සෞඛ්‍යාරක්ෂිත සහ විනයානුකූල ආරාම පරිසරයක් පවත්වාගෙන යාමට අවශ්‍ය උපකාර ලබා දිය යුතුය.

විහාරස්ථාන සඳහා ආධාර සහ උපකාර ලබා දීමේ දී, ඒවායේ සැබෑ අවශ්‍යතාව අනුව ප්‍රමුඛත්වය ලබා දිය යුතු අතර, ඒ සඳහා අදාළ විහාරස්ථානය අයත් නිකාය, හෝ පාර්ශ්වය පිළිබඳ කිසිදු භේදයක් නොදැක්විය යුතුය.

විහාරස්ථාන ලේඛනය

විහාර සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව තුළ සියලු නිකාය සහ පාර්ශ්ව යටතේ පවතින, විහාර දේවාලගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති භික්ෂු විහාරස්ථාන, සිල්මාතා ආරාම සහ ශ්‍රී ලංකාවෙන් පිටත පවතින විදේශයන්හි පවතින ශ්‍රී ලාංකික නිකායයන්ට අයත් විහාරස්ථාන පිළිබඳ යාවත්කාලීන ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

ශාසන ලේඛන සහ ග්‍රන්ථ මණ්ඩලය

ශාසනයේ කුඩා මහත් කටයුතු, ඓතිහාසික ලේඛන, නිකාය සහ පාර්ශ්වයන්ගේ ඉතිහාසය, මෙන්ම පැරණි ධර්ම ග්‍රන්ථ මනා ලෙස සංරක්ෂණය කර ලේඛනගත කර තිබීම බුද්ධ ශාසනයේ චිරස්ථිතියට සහ පරිපාලන කටයුතුවල විධිමත්භාවයට මහත් පිටිවහලකි.

එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, සියලු භික්ෂූන් වහන්සේලා, සාමණේර හිමිවරු, සිල්මාතාවරුන් සහ විහාරස්ථාන සම්බන්ධ ලේඛන පවත්වාගෙන යාම සඳහා උත්තරීතර සංඝ සභාව විසින් "ශාසන ලේඛන සහ ග්‍රන්ථ මණ්ඩලය" පිහිටුවිය යුතුය.

ශාසන ලේඛන

මෙම මණ්ඩලය විසින් ඒ ඒ නිකාය සහ පාර්ශ්වයන්හි පැවිදි වන සහ උපසම්පදා ලබන භික්ෂූන් වහන්සේලාගේත් උපැවිදි වන භික්ෂූන් වහන්සේලාගේත්, පැවිදි වන උපැවිදි වන සිල්මාතාවරුන්ගේත් විධිමත් නාම ලේඛන පවත්වාගෙන යා යුතුය.

තව ද මෙම මණ්ඩලය විසින් සංඝාධිකරණයන් විසින් දඬුවම් පමුණුවනු ලැබූ භික්ෂූන් වහන්සේලාගේ, සාමණේර හිමිවරුන්ගේ සහ සිල්මාතාවරුන්ගේ, ශාසනයෙන් නෙරපා හරින ලද අයගේත්, පත්තනික්කුජ්ජන කර්මයට භාජනය කරන ලද ගිහි පුද්ගලයන්ගේත් නාම ලේඛන, අදාළ අධිකරණ තීන්දු ලබා දුන් දිනයන් සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ පවත්වාගෙන යා යුතුය.

ධර්ම ග්‍රන්ථ සංරක්ෂණය සහ ප්‍රකාශනය

ත්‍රිපිටකය, අටුවා, ටීකා සහ අනෙකුත් පැරණි ධර්ම ග්‍රන්ථ සංරක්ෂණය කිරීම, නැවත මුද්‍රණය කිරීම සහ ප්‍රකාශනය කිරීමේ වගකීම ද මෙම මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.

උත්තරීතර සංඝ සභාවේ පර්‍යාප්ති කමිටුව විසින් අනුමත කරනු ලබන ධර්ම ග්‍රන්ථ, පර්යේෂණ කෘති සහ අධ්‍යාපනික ප්‍රකාශන ද ශාසන ලේඛන සහ ග්‍රන්ථ මණ්ඩලය යටතේ ප්‍රකාශයට පත් කළ හැකිය.

ධර්මදූත හා ජාත්‍යන්තර ශාසන සම්බන්ධතා මණ්ඩලය

අශෝක අධිරාජයාගේ සමයෙහි මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ මූලිකත්වයෙන් දඹදිවින් පිටත රටවල් නවයකට ධර්මදූතයන් යවා ථේරවාද බුදු දහම ලොව පුරා ව්‍යාප්ත කිරීමට ගත් තීරණය බුද්ධ ශාසන ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයකි. සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ දේශනාව එක් රටකට හෝ එක් ජාතියකට සීමා වූවක් නොවන අතර, සියලු මනුෂ්‍ය වර්ගයාට ම සම්බුද්ධ දේශනාවෙන් ප්‍රයෝජනය ලබා ගත හැකි ය. එබැවින් මහා සංඝයා වහන්සේ සම්බුද්ධ ශාසනය ශ්‍රී ලංකාව තුළ විවිධ ජාතීන් අතර ද, ශ්‍රී ලංකාවෙන් පිට ජාත්‍යන්තරයේ ද ව්‍යාප්ත කිරීමට උත්සාහ කළ යුතු ය.

තව ද බුරුමය, තායිලන්තය, ලාඕසය, කාම්බෝජය, ඉන්දියාව, නේපාලය වැනි ථේරවාද බුදු දහම පවතින රටවල් සමඟ සමීප ශාසනික සම්බන්ධතා පවත්වා ගනිමින් ඒ ඒ රටවල පවතින ධර්ම අධ්‍යයන ක්‍රම, ශාසන ඉතිහාසය, ශාසන පරිපාලන ක්‍රම, පැරණි ධර්ම ග්‍රන්ථ සහ අනෙකුත් ශාසනික සම්පත් ඔවුනොවුන් අතර හුවමාරු කර ගැනීම ද ශාසන චිරස්ථිතියට මහත් පිටිවහලකි.

ඒ සඳහා උත්තරීතර සංඝ සභාව විසින් "ධර්මදූත හා ජාත්‍යන්තර ශාසන සම්බන්ධතා මණ්ඩලය" පිහිටුවිය යුතු ය.

දමිළ බෞද්ධ අධ්‍යාපන හා ධර්මදූත වැඩසටහන

විශේෂයෙන් ශ්‍රී ලංකාව තුළ ජාතීන් සහ ආගම් අතර සංහිඳියාවට බාධාවක් නොවන පරිදිත්, එම සංහිඳියාව තවදුරටත් වර්ධනය වන අයුරින් ද දෙමළ බසින් බුදු දහම ඉගෙන ගැනීමට අවස්ථාව සලසා දිය යුතු ය. ඒ සඳහා උත්තරීතර සංඝ සභාව විසින් "දමිළ බෞද්ධ අධ්‍යයන පීඨය" පිහිටුවිය යුතු ය.

භික්ෂූන් වහන්සේලාට, සිල්මාතාවරුන්ට සහ ගිහි බෞද්ධයන්ට දෙමළ බස ඉගෙන ගැනීමට ද, භික්ෂූන් වහන්සේලාට සහ සිල්මාතාවරුන්ට දෙමළ බසින් බුදු දහම දේශනා කිරීමට ද අවශ්‍ය පුහුණුව ලබා දිය යුතු ය. එසේ ම භික්ෂූන් වහන්සේලාට සහ සිල්මාතාවරුන්ට දෙමළ බසින් නිස්සයමුත්තක සහ පරිසුපට්ඨාපක, ත්‍රිපිටකාචාර්‍ය පාඨමාලා හැදෑරීමට සහ ත්‍රිපිටක විශාරද පර්යේෂණ වැඩසටහන් කර ගෙන යාමට අවස්ථාව සලසා දෙමින් ඒ සඳහා සුදුසු විෂය නිර්දේශ සකස් කළ යුතු ය. එම පාඨමාලා "දමිළ බෞද්ධ අධ්‍යයන පීඨය" යටතේ පැවැත්විය යුතු ය.

තව ද දෙමළ බසින් ධර්ම ග්‍රන්ථ රචනා කිරීමට භික්ෂූන් වහන්සේලා, සිල්මාතාවරුන් සහ ධර්මය උගත් ගිහි බෞද්ධයන් උනන්දු කරවිය

	යුතු අතර, එවැනි ග්‍රන්ථ රචනා සහ පරිවර්තන කටයුතු සඳහා අවශ්‍ය අනුග්‍රහය සහ පහසුකම් ද දමිළ බෞද්ධ අධ්‍යාපන පීඨය විසින් සැලසිය යුතු ය.
ජාත්‍යන්තර ධර්මදූත කටයුතු	ථේරවාද බුදු දහම ශ්‍රී ලංකාවෙන් පිටත ව්‍යාප්ත කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමටත්, ධර්මදූත කටයුතු සංවිධානාත්මක සහ විධිමත් ආකාරයෙන් සිදු කිරීමටත්, ධර්මදූත හා ජාත්‍යන්තර ශාසන සම්බන්ධතා මණ්ඩලය විසින් "ජාත්‍යන්තර ධර්මදූත ආයතනය" පිහිටුවිය යුතු ය. විදේශ රටවල ධර්මදූත කටයුතුවල නිරත වීමට අපේක්ෂා කරන භික්ෂූන් වහන්සේලාට සහ සිල්මාතාවරුන්ට තමන් සේවය කිරීමට බලාපොරොත්තු වන රටවල භාෂාව, ඉතිහාසය, සංස්කෘතිය සහ නීති පද්ධතිය පිළිබඳ දැනුම ලබා දෙන සහතික පත්‍ර පාඨමාලා පැවැත්විය යුතු ය. තව ද විදේශ රටවල තානාපති කාර්යාල සහ ඒ හා සමාන බලය ලත් ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් "ජාත්‍යන්තර ධර්මදූත ආයතනය" විසින් පවත්වනු ලබන පාඨමාලා එම රටවල ධර්මදූත කටයුතු සඳහා ප්‍රවේශ වීමට සුදුසුකමක් ලෙස පිළිගැනීමට කටයුතු කළ යුතු ය.
ජාත්‍යන්තර ශාසන සම්බන්ධතා ආයතනය	ථේරවාදී බුදු දහම පවතින රටවල් සමඟ අතීතයේ සිට ම ශ්‍රී ලංකාව ඉතා සමීප ශාසනික සම්බන්ධතා පවත්වාගෙන පැමිණි බවට ඉතිහාසය සාක්ෂි දරයි. එසේ පවත්වාගෙන ගිය යහපත් ශාසනික සම්බන්ධතා හේතුවෙන් ම ශ්‍රී ලංකාව තුළ භික්ෂු ශාසනය අතුරුදහන් වූ අවස්ථාවල සියමයෙන් සහ බුරුමයෙන් උපසම්පදාව ගෙනවිත් නැවත මෙරට උපසම්පදාව ස්ථාපිත කිරීමට හැකි විය. එබැවින් ථේරවාදී බෞද්ධ රටවල භික්ෂු ආයතන සහ ශාසනික සංවිධාන සමඟ සමීප සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා ධර්මදූත හා ජාත්‍යන්තර ශාසන සම්බන්ධතා මණ්ඩලය විසින් "ජාත්‍යන්තර ශාසන සම්බන්ධතා ආයතනය" පිහිටුවිය යුතු ය. එම ආයතනය මඟින් බුරුමය, තායිලන්තය, ලාඕසය, කාම්බෝජය, ඉන්දියාව සහ නේපාලය වැනි ථේරවාදී බෞද්ධ රටවල බෞද්ධ ආයතන සමඟ සමීප සම්බන්ධතා පවත්වා ගනිමින් ධර්ම අධ්‍යයන ක්‍රම, ශාසන පරිපාලන ක්‍රම, ශාසන ඉතිහාසය, පැරණි ධර්ම ග්‍රන්ථ සහ අනෙකුත් ශාසනික සම්පත් හුවමාරු කර ගනිමින් ශාසන චිරස්ථිතිය උදෙසා කටයුතු සම්පාදනය කළ යුතු ය.
විනය විමර්ශන කමිටුව	භික්ෂූන් වහන්සේලා සහ සිල්මාතාවරු තථාගතයන් වහන්සේ විසින් පණවා වදාළ විනය ආරක්ෂා කිරීම බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා අතිශය වැදගත් වේ. "**විනයො නාම සාසනස්ස ආයු**" යනුවෙන් සංගීතිකාරක මහා රහතන් වහන්සේලා ප්‍රකාශ කර ඇත්තේ එබැවිනි. යම් යම් හේතූන් නිසා භික්ෂූන් වහන්සේලා හෝ සිල්මාතාවරුන් අතින් විනය කඩවීම් සිදු වන අවස්ථාවල දී,

	අනෙකුත් සබ්‍රහ්මචාරීන් වහන්සේලා විසින් ඔවුන්ට එම වරද නිවැරදි කර ගැනීමට උපකාර කළ යුතුය. කේසී නම් අශ්වදමකයාට තථාගතයන් වහන්සේ දේශනා කළේ, හික්මීමට කැමති නොවන භික්ෂු ශ්‍රාවකයන් තමන් වහන්සේ රළු ක්‍රමවලින් ද හික්මවනු ලබන බවයි. එවැනි අවස්ථාවල දී තථාගත විනයට අනුකූල ශාසනික දඬුවම් ක්‍රම අනුගමනය කළ යුතුය. එම ශාසනානුලෝමික දඬුවම් සංඝාධිකරණය විසින් නියම කළ යුතු අතර, විනය කාරක කමිටුව විසින් විනය කර්ම සහ අනෙකුත් සුදුසු ක්‍රියාමාර්ග මඟින් ඒවා ක්‍රියාත්මක කළ යුතුය. අදාළ විනය පරීක්ෂණ සහ සංඝාධිකරණ විභාග සඳහා සංඝයා නියෝජනය කරමින්, අපක්ෂපාතී ලෙස කරුණු විමර්ශනය කොට සංඝාධිකරණයට වාර්තා කිරීම සඳහා උත්තරීතර සංඝ සභාව විසින් “විනය විමර්ශන කමිටුව” පිහිටුවිය යුතුය.
කාර්යභාරය හා වගකීම්	විනය විමර්ශන කමිටුව විසින් භික්ෂූන් වහන්සේලා සහ සිල්මාතාවරුන් සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි භාර ගැනීම, මූලික විමර්ශන පැවැත්වීම, සාක්ෂි සහ අනෙකුත් අදාළ තොරතුරු රැස් කිරීම, සහ අවශ්‍ය අවස්ථාවල දී පැමිණිලි සංඝාධිකරණය වෙත යොමු කිරීම යන කාර්යයන් ඉටු කළ යුතුය. එසේ ම, සංඝාධිකරණය විසින් ඉල්ලා සිටින අවස්ථාවල දී අතිරේක විමර්ශන සිදු කිරීම, සාක්ෂිකරුවන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීම සහ අවශ්‍ය ලේඛන හා තොරතුරු ඉදිරිපත් කිරීම ද මෙම කමිටුවේ වගකීම වේ.
අපක්ෂපාතීත්වය හා ස්වාධීනත්වය	විනය විමර්ශන කමිටුවේ සාමාජිකයන් නිකාය, පාර්ශ්වය, ජාතිය, හෝ වෙනත් කිසිදු කරුණක් මත අගතිගාමී නොවී, අපක්ෂපාතීව සහ සාධාරණව කටයුතු කළ යුතුය. විනය විමර්ශන කටයුතු සිදු කිරීමේ දී සත්‍යය සහ ධර්ම විනය පමණක් ම පදනම් කර ගත යුතුය. විනය විමර්ශන කමිටුවේ සාමාජිකයන් විසින් තමන්ට පෞද්ගලික සම්බන්ධතාවයක් ඇති භික්ෂූන් සහ සිල්මාතාවරුන් සම්බන්ධ විමර්ශන කටයුතුවලට සහභාගී නොවිය යුතුය.
සාමාජිකත්වය හා සුදුසුකම්	විනය විමර්ශන කමිටුවේ සියලු සාමාජිකයෝ බෞද්ධ නීති විද්‍යාලයේ මූලික උපාධිය ලබා ඇති භික්ෂූන් වහන්සේලා විය යුතුය. එසේ ම, ඔවුන් ධර්මය හා විනය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති අගතිගාමී නොවීම, විචාරශීලීත්වය සහ සාධාරණත්වය ප්‍රකට කළ භික්ෂූන් වහන්සේලා විය යුතුය.
විනය කාරක කමිටුව	සංඝාධිකරණයන් විසින් දෙනු ලබන තීන්දු තීරණ හා දඬුවම් නිසි පරිදි ක්‍රියාත්මක වීම තථාගතයන් වහන්සේ විසින් පනවා වදාළ විනයේ චිරස්ථිතිය සඳහා අතිශය වැදගත් වේ. අස්සජි සහ පුනබ්බසුක භික්ෂූන් ප්‍රධාන ඡබ්බග්ගිය භික්ෂූහු කීටාගිරියේ සාසනයට අනුලෝම නොවූ ජිගුප්සාජනක ක්‍රියාවල නිරත වූ

	අවස්ථාවේ, තථාගතයන් වහන්සේ ශාරිපුත්‍ර හා මහා මෞද්ගල්‍යාන මහරහතන් වහන්සේලා ප්‍රධාන විශාල භික්ෂු පිරිසක් කීටාගිරියට යවා, විනය විනිශ්චය කොට පබ්බාජනීය කර්මය ඇතුළු සුදුසු විනය කර්ම සිදු කරන ලෙස උපදෙස් වදාළහ. එම විනයානුකූල පූර්වාදර්ශය අනුව, සංඝාධිකරණයන් විසින් දෙනු ලබන තීන්දු තීරණ හා දඬුවම් ධර්ම විනයානුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා උත්තරීතර සංඝ සභාව විසින් "විනය කාරක කමිටුව" පිහිටුවිය යුතුය.
සාමාජිකත්වය හා සුදුසුකම්	විනය කාරක කමිටුවේ සියලු සාමාජිකයෝ බෞද්ධ නීති විද්‍යාලයේ මූලික උපාධිය ලබා ඇති භික්ෂූන් වහන්සේලා විය යුතුය.
කාර්යභාරය හා වගකීම්	විනය කාරක කමිටුවේ ප්‍රධාන වගකීම වන්නේ උත්තරීතර සංඝාධිකරණය, කාරක සංඝාධිකරණය සහ මූලක සංඝාධිකරණයන් විසින් දෙනු ලබන තීන්දු තීරණ හා දඬුවම් ධර්ම විනයානුකූලව ක්‍රියාත්මක කිරීමයි. මෙම කාර්යය ඉටු කිරීමේ දී කමිටුව තථාගත බුද්ධාවවාදයට අනුකූලව කරුණාව සහ මෛත්‍රිය පෙරදැරි කරගෙන කටයුතු කළ යුතු අතර, දඬුවමට වඩා ශික්ෂණය සහ සංවරය ප්‍රමුඛ කර ගත යුතුය.
විනය කර්ම ක්‍රියාත්මක කිරීමේ දී සහාය ලබා ගැනීම	අස්සජි සහ පුනබ්බසුක භික්ෂූන් ප්‍රධාන ඡබ්බග්ගිය භික්ෂූහු චණ්ඩ හා පරුෂ ස්වභාවයෙන් යුක්ත බැවින් ඔවුන්ට විනය කර්ම කිරීම දුෂ්කර බව ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ප්‍රකාශ කළ කල්හි, තථාගතයන් වහන්සේ විශාල භික්ෂු පිරිසක් සමඟ ගොස් සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් වදාළහ. එසේ ම, විනය කාරක කමිටුවේ භික්ෂූන් වහන්සේලාට තම කාර්යයන් ඉටු කිරීමේ දී බාධා ඇති වුවහොත්, සංඝාධිකරණයේ අනුමැතිය ඇතිව ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේලාගේ සහාය ලබාගෙන ධර්ම විනයානුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත හැකිය.
සංඝාධිකරණ තීන්දු ක්‍රියාත්මක කිරීමේ වගකීම	විනය කාරක කමිටුව උත්තරීතර සංඝාධිකරණයේ, කාරක සංඝාධිකරණයේ සහ මූලික සංඝාධිකරණයන්ගේ තීන්දු තීරණ සහ නියෝග ක්‍රියාත්මක කිරීමට බැඳී සිටියි.
බල සීමා සහ තහනම් ක්‍රියාමාර්ග	විනය කාරක කමිටුව කිසි විටෙකත් ශාසනානුලෝමික නොවන සහ විනයෙන් වාරණය කර ඇති දඬුවම් ක්‍රම අනුගමනය නොකළ යුතුය. එසේ ම, ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ අපරාධ ලෙස සැලකෙන හෝ සාමාන්‍ය නීතියට පටහැනි ක්‍රියාමාර්ග කිසිවිටෙකත් භාවිත නොකළ යුතුය. විනය කාරක කමිටුව විසින් අනුගමනය කළ යුත්තේ තථාගතයන් වහන්සේ විසින් අනුදැන වදාළ විනය කර්ම සහ අනෙකුත් ධර්ම විනයානුකූල ශාසනික ක්‍රියාමාර්ග පමණි.

විනය උපකාරක සමූහය	තථාගතයන් වහන්සේ විසින් විනයෙහි අනුදැන වදාළ පරිදි, අධිකරණයක චෝදකයෙකු හෝ චූදිතයෙකු ලෙස ඉදිරිපත් වන භික්ෂුවකට තමන් ව්‍යක්ත හෝ ප්‍රතිබල නොවන අවස්ථාවක විනයධර භික්ෂුවකගේ උපකාර ලැබිය හැක. එබැවින්, භික්ෂූන් වහන්සේලාට අධිකරණ කටයුතු සම්බන්ධයෙන් සිදුවිය හැකි අසාධාරණකම් වළක්වා, ඔවුන්ට ධර්මානුකූල සහ විනයානුකූල සහාය සැපයීම සඳහා උත්තරීතර සංඝ සභාව විසින් “විනය උපකාරක සමූහය” පිහිටුවිය යුතුය.
කාර්යභාරය හා වගකීම්	විනය උපකාරක සමූහය විසින් සංඝාධිකරණ කටයුතුවලට සම්බන්ධ වන භික්ෂූන් වහන්සේලා සහ සිල්මාතාවරුන්ට ධර්ම විනයානුකූල උපදෙස් ලබා දීම, අදාළ විනය නීති පැහැදිලි කර දීම, අවශ්‍ය ලේඛන සහ පිළිතුරු සකස් කිරීමට සහාය වීම සහ සංඝාධිකරණය ඉදිරියේ තම කරුණු ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා දීම සිදු කළ යුතුය. අවශ්‍ය නම් ඔවුන් වෙනුවෙන් සංඝධිකරණය ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීම ද කළ හැක. මෙම උපකාරක කටයුතු සිදු කිරීමේ දී සමූහයේ සාමාජිකයන් චෝදකයාට හෝ චූදිතයාට පක්ෂපාතී නොවී, ධර්මයට සහ විනයට ගරු කරමින් සත්‍ය ඉස්මතු වන ආකාරයට සහ ශාසන ශුද්ධිය අපේක්ෂා කරමින් කටයුතු කළ යුතුය.
සාමාජිකත්වය හා සුදුසුකම්	විනය උපකාරක සමූහයේ සාමාජිකයන් බෞද්ධ නීති විද්‍යාලයේ මූලික උපාධිය ලබා ඇති භික්ෂූන් වහන්සේලා විය යුතුය. එසේ ම, ඔවුන් ධර්ම විනය පිළිබඳ මනා දැනුමක් ඇති, විචාරශීලී, අපක්ෂපාතී සහ තමන් සහාය වන භික්ෂුවගේ චරිතයට හානි වන කරුණුවල රහස්‍ය භාවය විනයානුකූලව ආරක්ෂා කරමින් කටයුතු කළ හැකි භික්ෂූන් වහන්සේලා විය යුතුය.
නොමිලේ සේවය හා පාරිතෝෂික තහනම	විනය උපකාරක සමූහය මඟින් සපයනු ලබන උපකාර සඳහා කිසිදු භික්ෂුවකගෙන් සන්තෝසමක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් කිසිදු ප්‍රතිලාභයක් ලබා නොගත යුතුය. එම සේවය කරුණාධ්‍යාශයෙන්, ධර්ම විනයට ගරු කරමින් සහ සබ්‍රහ්මචාරීන්ට උපකාර කරන චේතනාවෙන් නොමිලේ ඉටු කළ යුතුය. සන්තෝසමක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ලබාගෙන එම සේවය සැපයීම උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුව වරදක් ලෙස සැලකිය යුතුය.
ශාසන සන්නිවේදන මණ්ඩලය	සම්බුද්ධ ශාසනය තුළ නිවැරදි, විශ්වාසනීය සහ කාර්යක්ෂම තොරතුරු සන්නිවේදනය අතිශයින් ම වැදගත් කරුණකි. තථාගතයන් වහන්සේ ජීවමාන කාලයේ දී තමන් වහන්සේ විසින් වස් කාලය තුළ සිදු කළ ශික්ෂාපද පැනවීම්, ධර්ම දේශනා, භික්ෂූන් වහන්සේලාට පිරිනමන ලද ධ්‍යානාන්තර, භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් සිදු කරන ලද නිග්‍රහ කර්ම සහ අනෙකුත් ශාසනික

	කටයුතු පිළිබඳ තොරතුරු වස් අවසානයේ විහාරස්ථාන වෙත පැමිණි භික්ෂූන් වහන්සේලා විසින් නේවාසික භික්ෂූන් වහන්සේලාගෙන් දැන ගත් බවත්, විහාරස්ථානවලින් නික්මුණු භික්ෂූන් වහන්සේලා තමන්ට හමු වූ අනෙකුත් භික්ෂූන් වහන්සේලාට එම තොරතුරු පැවසූ බවත් හද්දාලි සූත්‍ර අටුවාවේ සඳහන් වේ. අසත්‍ය තොරතුරු සන්නිවේදනය වීමෙන් හෝ අවශ්‍ය තොරතුරු නිසි වේලාවට සන්නිවේදනය නොවීමෙන් භික්ෂු සංඝයා අතර විවිධ ගැටලු සහ අර්බුද ඇති විය හැකි අතර, එය සංඝ සාමග්‍රියට සහ ශාසන චිරස්ථිතියට අහිතකර ලෙස බලපෑ හැකිය. විනයානුකූලව දඬුවම් පමුණුවන ලද භික්ෂූන් වහන්සේලා, සිල්මාතාවරුන් සහ ගිහි බෞද්ධයන් සම්බන්ධයෙන් ධර්ම විනයානුකූලව කටයුතු කළ යුතු ආකාරය භික්ෂූන් වහන්සේලා, සිල්මාතාවරුන් සහ ගිහි බෞද්ධයන් දැන ගන්නේ විධිමත් සහ විශ්වසනීය සන්නිවේදන පද්ධතියක් පවතින විට පමණි. එබැවින් ශ්‍රී ලංකාවේ භික්ෂු ශාසනයට අදාළ තොරතුරු භික්ෂූන් වහන්සේලා අතරත්, අවශ්‍ය අවස්ථාවල දී සිල්මාතාවරුන් සහ ගිහි බෞද්ධයන් අතරත් විනයානුකූලව සහ වගකීමෙන් යුතුව සන්නිවේදනය කිරීම සඳහා උත්තරීතර සංඝ සභාව විසින් "ශාසන සන්නිවේදන මණ්ඩලය" පිහිටුවිය යුතුය.
කාර්යභාරය හා වගකීම්	ශාසන සන්නිවේදන මණ්ඩලය විසින් උත්තරීතර සංඝ සභාව විසින් ගනු ලබන තීන්දු තීරණ, නියෝග, පැණවීම් සහ අනෙකුත් වැදගත් ශාසනික තොරතුරු භික්ෂු සංඝයා සහ සිල්මාතාවන් වෙත විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ නිසි පරිදි දැනුම් දිය යුතුය. සංඝාධිකරණයන් විසින් උක්ඛේපනීය කර්මය, පබ්බාජනීය කර්මය සහ අනෙකුත් නිග්‍රහ විනය කර්මවලට පමුණුවන ලද භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු අදාළ විහාරස්ථාන සහ ශාසනික ආයතන වෙත සන්නිවේදනය කළ යුතුය. පාරාජිකාවට පත් වීම හේතුවෙන් ශාසනයෙන් නෙරපන ලද පුද්ගලයෙකු තවදුරටත් භික්ෂුවක් ලෙස පෙනී සිටින්නේ නම්, ඒ සම්බන්ධයෙන් ගිහි බෞද්ධ ජනතාව නොමඟ යාම වැළැක්වීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට පමණක් අදාළ තොරතුරු රජයේ පුවත්පත්වල සහ නිල ශාසනික මාධ්‍ය ඔස්සේ ප්‍රකාශයට පත් කළ යුතුය. සංඝාධිකරණය විසින් පත්තනික්කුජ්ජන කර්මය සිදු කරන ලද ගිහි බෞද්ධයන් සම්බන්ධයෙන් සහ ඔවුන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව අදාළ විහාරස්ථාන සහ ශාසනික ආයතන දැනුවත් කළ යුතුය. තව ද ශ්‍රී ලාංකේය ශාසනය තුළ සිදු වන වැදගත් ශාසනික කටයුතු පිළිබඳව ශාසනානුලෝමික අයුරින් වාර්තා කරමින්, පාඨකයන්ගේ

	ධර්ම විනය දැනුම සහ ගුණධර්ම වර්ධනය වන ආකාරයෙන් මාසික පුවත්පතක් හෝ සඟරාවක් පළ කිරීමට කටයුතු කළ යුතුය.
තොරතුරු වාර්තා කිරීමේ ක්‍රමවේදය	සංඝාධිකරණ කටයුතු සම්බන්ධ තොරතුරු වාර්තා කිරීමේ දී ශාසන සන්නිවේදන මණ්ඩලය විසින් අග්‍ර සංග්‍රාමාවචර මහා ස්ථවිරයන් වහන්සේ විසින් හෝ උන් වහන්සේ විසින් පත් කරනු ලබන උත්තරීතර සංඝාධිකරණ විනිශ්වයකාර මහා ස්ථවිරයන් වහන්සේ නමක් හෝ පිරිසක් විසින් අනුමත කරන ලද තොරතුරු පමණක් ප්‍රකාශයට පත් කළ යුතුය.
අධීක්ෂණය	ශාසන සන්නිවේදන මණ්ඩලයේ කටයුතු ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලය විසින් සමීපව අධීක්ෂණය කළ යුතුය.
විනයානුකූල තොරතුරු ප්‍රකාශනය	භික්ෂූන් වහන්සේලාගේ ගරුක සහ ලහුක ආපත්ති අනුපසම්පන්නයන්ට ආරෝචනය කිරීම තහනම් කරමින් තථාගතයන් වහන්සේ විසින් ශික්ෂාපදයක් පනවා වදාළ බැවින්, විශේෂ සංඝ සම්මුතියක් නොමැති අවස්ථාවල දී භික්ෂූන් වහන්සේලාගේ වරදවල් සහ විනය කටයුතු ඔවුන්ගේ චරිතයට සහ ගෞරවයට අනවශ්‍ය හානියක් නොවන අයුරින් පමණක් සන්නිවේදනය කළ යුතුය. ශාසන සන්නිවේදන මණ්ඩලය විසින් කටයුතු කළ යුත්තේ කුතුහලය සපුරාලීම හෝ පුද්ගලයන් අපකීර්තියට පත් කිරීම සඳහා නොව, ධර්ම විනය ආරක්ෂා කිරීම, සංඝ සාමග්‍රිය පවත්වා ගැනීම සහ බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සහ ව්‍යාප්තිය තහවුරු කිරීම සඳහා පමණි.
සාමණේර සුභසාධන සහ ආරක්ෂණ මණ්ඩලය	සාමණේර සුභසාධන සහ ආරක්ෂණ මණ්ඩලය ඉදිරියේ "සාමණේරවරු" යන පරිච්ඡේදය යටතේ විස්තර වන්නේ ය.
සීලමාතා සුභසාධන සහ ආරක්ෂණ මණ්ඩලය	සීලමාතා සුභසාධන සහ ආරක්ෂණ මණ්ඩලය ඉදිරියේ "සීලමාතාවරු" යන පරිච්ඡේදය යටතේ විස්තර වන්නේ ය.

එකළොස්වෙනි පරිච්ඡේදය:
සංඝාධිකරණ සහ සංඝාධිකරණ බලය

සංඝාධිකරණ

සංඝයා අතර ඇති වන විවාදාධිකරණ, අනුවාදාධිකරණ, ආපත්තාධිකරණ සහ කිච්චාධිකරණ සමථයකට පත් කොට සංඝයාගේ සමඟිය, ශික්ෂානුකූලභාවය සහ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා තථාගතයන් වහන්සේ විනයෙහි අධිකරණ සමථ ක්‍රම දේශනා කළ වදාළහ. එසේ ම ශාසන ඉතිහාසය පුරා ව්‍යක්ත, විශාරද, ධර්මවිනයධර මහා ස්ථවිරයන් වහන්සේලා සංඝයා අතර හටගත් අධිකරණ සමථයකට පත් කිරීම සඳහා විනිශ්චයකාර ස්ථවිරවරු වශයෙන් කටයුතු කළහ.

විශේෂයෙන් ආභිධම්මික ගෝධත්ත තෙරුන් වහන්සේ විසින් ලබා දෙන ලද විනය විනිශ්චයන් කෙරෙහි පැහැදුණු භාතිකාභය රජතුමා, උන්වහන්සේගේ විනය විනිශ්චයන්ට සියලු දෙනා ගරු කළ යුතු බවට රාජාඥාවක් ද නිකුත් කළේය.

එබැවින් ශ්‍රී ලංකාවේ සංඝයා වහන්සේලා අතර ඇති වන අධිකරණ විනිශ්චය කිරීම සහ අධිකරණ සමථයකට පත් කිරීම සඳහා අනෙකුත් ශාසනික ආයතනවලින් ස්වාධීන වූ සංඝාධිකරණයක් පිහිටුවිය යුතුය. එමඟින් සංඝයාගේ සමඟිය, විනයානුකූලභාවය සහ යහපැවැත්ම තහවුරු කළ හැකි වනු ඇත.

සංඝාධිකරණ ව්‍යුහය

සංඝාධිකරණය ස්ථර හතරකින් සමන්විත ය.

(1). උත්තරීතර සංඝාධිකරණය

(2). කාරක සංඝාධිකරණය

(3). මූලික සංඝාධිකරණය

(4). නිකාය සහ පාර්ශ්ව සංඝාධිකරණ

නිර්වචනය

සංඝාධිකරණ යනු ධර්මයට, විනයට සහ ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට යටත්ව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීති සමඟ නොගැටෙන පරිදි ක්‍රියා කරමින්, ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලාගේ විනයානුකූල අයිතිවාසිකම් ආරක්ෂා කරමින්, තහවුරු කරමින් සහ බලාත්මක කරමින්, ධර්මවිනයානුකූලව යුක්තිය පසිඳලන ආයතන වේ.

සංඝාධිකරණ පිහිටුවීම

උත්තරීතර සංඝාධිකරණය, කාරක සංඝාධිකරණය සහ මූලික සංඝාධිකරණය යන සංඝාධිකරණ ස්ථර, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105(4) වගන්තිය ප්‍රකාරව, භික්ෂූන් වහන්සේලා අතර ඇති වන ආරවුල් සහ විහාරස්ථාන හෝ විහාරස්ථානවලට අදාළ සේවාවන් සම්බන්ධයෙන් ඇති වන ආරවුල් විනිශ්චය කොට සමථයකට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් නීතියෙන් පිහිටුවිය යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105(4)(අ) වගන්තිය ප්‍රකාරව පිහිටුවනු ලබන උත්තරීතර සංඝාධිකරණය, කාරක සංඝාධිකරණ සහ මූලික සංඝාධිකරණවල සාමාජිකයන් පත් කිරීම, මාරු කිරීම, ඉවත් කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධ සියලු බලතල උත්තරීතර සංඝ සභාව වෙත පැවරිය යුතුය.

උත්තරීතර සංඝ සභාව විසින්, ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති එක් එක් ශාසනාරක්ෂක බලමණ්ඩලය සඳහා හෝ ශාසනාරක්ෂක බලමණ්ඩල සමූහයක් සඳහා අවශ්‍ය පරිදි මූලික සංඝාධිකරණ පිහිටුවීම සඳහා නිර්දේශ කළ යුතු අතර, එම සංඝාධිකරණ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105(4) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් නීතියෙන් පිහිටුවිය යුතුය.

උත්තරීතර සංඝාධිකරණයේ, කාරක සංඝාධිකරණයේ සහ මූලික සංඝාධිකරණවල ක්‍රියාපටිපාටි, විනිශ්චය ක්‍රමවේද සහ විනය ක්‍රියාමාර්ග සම්බන්ධ විධිවිධාන උත්තරීතර සංඝ සභාව විසින් කතිකා මඟින් පැනවිය යුතුය.

නිකාය සහ පාර්ශ්ව සංඝාධිකරණ පිහිටුවීම, ඒවායේ ක්‍රියාපටිපාටි, විනිශ්චය ක්‍රමවේද සහ විනය ක්‍රියාමාර්ග සම්බන්ධ විධිවිධාන ඒ ඒ නිකාය සහ පාර්ශ්ව විසින් ධර්ම විනයානුකූලව පැනවිය යුතුය.

සංඝාධිකරණය න්ගේ බලපරාසය

සංඝාධිකරණවල අධිකරණ බලයට අයත් වන්නේ භික්ෂූන් වහන්සේලා අතර පැන නඟින ආරවුල්, විහාරස්ථාන අතර හෝ විහාරස්ථානවල පරිපාලනයට අදාළ ආරවුල්, විහාරස්ථානවලට අදාළ සේවා ඉටු කිරීම සම්බන්ධ ආරවුල් සහ ධර්මවිනය හෝ උත්තරීතර සංඝ ව්‍යවස්ථාව යටතේ පැන නඟින අනෙකුත් ගැටලු ය. එවැනි සියලු ම කරුණු සම්බන්ධයෙන් සංඝාධිකරණය විසින් ලබා දෙනු ලබන විනිශ්චය ධර්මවිනයට සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුකූල විය යුතුය.

ධර්ම විනය සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාව යටතේ හෝ ඉන් බාහිරව ශ්‍රී ලංකාවේ සිවිල් හෝ අපරාධ නීතිය යටතේ විභාග විය යුතු සොරකම්, අපචාර සහ වෙනත් වරදවල් සම්බන්ධයෙන් ද සංඝාධිකරණවලට, එම ක්‍රියාවන්හි ශාසනික සහ විනයානුකූල බව සම්බන්ධයෙන් විභාග පවත්වා තීන්දු තීරණ ලබා දිය හැකි ය. නමුත් එවැනි වරදවල් සම්බන්ධයෙන් රාජ්‍ය අධිකරණ හමුවේ සිදු වන අපරාධ හෝ සිවිල් නඩු කටයුතුවලට සංඝාධිකරණවලින් කිසිදු ආකාරයකින් බලපෑම් හෝ බාධා නොකළ යුතු ය.

සියලු ම සංඝාධිකරණවලින් තීන්දු තීරණ ලබා දිය යුත්තේ ධර්මවිනයානුකූලව සහ ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුකූලව ය. භික්ෂූන් වහන්සේලාට කායික දඬුවම් පැමිණවීම හෝ ධර්මයට, විනයට හෝ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට පටහැනි වෙනත් දඬුවම් පැනවීමේ බලයක් සංඝාධිකරණවලට නැත.

ධර්මය සහ විනය නිර්වචනය කිරීම, එනම් අටළොස් භේදකර වස්තූන් සම්බන්ධ විවාදාධිකරණ විනිශ්චයන්, සංඝාධිකරණවලින්

තීරණය කළ හැකි අතර අවශ්‍ය අවස්ථාවල දී යෙභුය්‍යසිකා මූලධර්මය අනුගමනය කරමින් උත්තරීතර සංඝ සභාව විසින් ද තීරණය කළ හැකි ය. ඒ කරුණු සම්බන්ධ උත්තරීතර සංඝ සභාවේ තීරණය අවසානාත්මක වේ.

ධර්මය සහ විනය නිර්වචනය කිරීමේ බලය උත්තරීතර සංඝ සභාවට අයත් වන අතර සංඝාධිකරණ ඒ නිර්වචන මත පදනම්ව විනිශ්චය කළ යුතුය.

ධර්මය සහ විනය නිර්වචනය කිරීම හා අටලොස් භේදකර වස්තූන් සම්බන්ධ නොවන විවාදාධිකරණ, අනුවාදාධිකරණ, ආපත්තාධිකරණ සහ කිච්චාධිකරණ සම්බන්ධයෙන් උත්තරීතර සංඝාධිකරණය විසින් ලබා දෙනු ලබන තීන්දුව අවසානාත්මක වේ.

උත්තරීතර සංඝාධිකරණය

උත්තරීතර සංඝාධිකරණයට පහත සඳහන් බලයන් සහ වගකීම් ඇත.

(1). සඞ්ඝයාගේ විනය කටයුතු සම්බන්ධ අවසානාත්මක අධිකරණ බලය

උත්තරීතර සංඝාධිකරණය ශ්‍රී ලංකාවේ සිවිල් හෝ අපරාධ නීතිය යටතට නොවැටෙන භික්ෂූන් වහන්සේලා අතර ඇති වන ආරවුල්, විහාරස්ථානවල පරිපාලනය හා සම්බන්ධ ආරවුල්, විහාරස්ථානවලට අදාළ සේවාවන් ඉටු කිරීම හා සම්බන්ධ ආරවුල් සහ ධර්ම විනය හා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව යටතේ පැන නඟින අනෙකුත් ගැටළු ධර්මවිනයානුකූලව විනිශ්චය කිරීමේ අවසානාත්මක බලය ඇති අධිකරණය වේ.

(2). සඞ්ඝයාගේ විනය කටයුතු සම්බන්ධ අභියාචනා බලය

කාරක සංඝාධිකරණයෙන්, මූලික සංඝාධිකරණයකින් හෝ නිකාය හෝ පාර්ශ්ව අධිකරණයකින් ලබා දෙනු ලබන තීන්දුවක් පිළිබඳ සෑහීමකට පත් නොවන භික්ෂුවකට උත්තරීතර සංඝාධිකරණය වෙත අභියාචනා කළ හැකි ය. එවැනි අභියාචනාවක් සලකා බැලීමෙන් අනතුරුව උත්තරීතර සංඝාධිකරණය විසින් ලබා දෙනු ලබන තීන්දුව අවසානාත්මක වේ.

(3). ශාසන සාමාජිකයන්ගේ මූලික විනය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

ශ්‍රී ලංකා උත්තරීතර සංඝාධිකරණය ශ්‍රී ලංකාව තුළ සියලු භික්ෂූන් වහන්සේලාගේ, සාමණේරවරුන්ගේ සහ සිල්මාතාවරුන්ගේ මූලික විනය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට බැඳී සිටියි. ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව මඟින් පිළිගනු ලබන සහ විනයෙන් ආරක්ෂා කරනු ලබන ශාසන සාමාජිකයන්ගේ මූලික විනය අයිතිවාසිකමක් ශාසන අධිකාරී ආයතනයක් විසින් උල්ලංඝනය කර ඇතැයි

සලකනු ලබන අවස්ථාවක, අදාළ පෙත්සම් කෙලින් ම උත්තරීතර සංඝාධිකරණය වෙත යොමු කළ හැකි ය.

(4). සංඝහාර දැරීම වාරණය කිරීමේ බලය

සංඝයාගේ කුදු මහත් කටයුතු ඉටු කිරීම සඳහා සංඝයා විසින් සම්මුතීන් ලබා දිය යුත්තේ සතර අගතීන්ට නොයන, සංඝයා වහන්සේලාගේ ගෞරවාදාරයට ප්‍රාප්ත වූ සහ අනාගතයේ ද ධර්ම විනයානුකූලව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කළ හැකි භික්ෂූන් වහන්සේලාට ය. භික්ෂුණියක් සමඟ කායසංසර්ගාදි ගරුකාපත්තියකට පත් වූ භික්ෂුවකට භික්ඛුනොවාද සම්මුතිය ලබා නොදීමට තථාගතයන් වහන්සේ වදාළේ ද එම මූලධර්මය මත ය.

එබැවින් ධර්ම විනයානුකූලව සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුකූලව බලවත් වරදවල් කර ඇති භික්ෂූන් වහන්සේලා සංඝයාගේ ප්‍රධාන වගකීම් නොදැරීම, සංඝයා තුළ ධර්මය සහ විනය මනා කොට ස්ථාපිත වීමටත් සංඝයාගේ පරිපාලන ආයතන කෙරෙහි භික්ෂූන් වහන්සේලා, සාමණේර හිමිවරුන්, සිල්මාතාවන් සහ ගිහියන් තුළ විශ්වාසය ගොඩනැගීමටත් අතිශයින් ම වැදගත් වේ.

ඒ අනුව, "විනය දඬුවම් සහ විනයකර්ම පොත" අනුව සංඝහාර දැරීමට නුසුදුසු මට්ටමේ වරදවල් කර ඇති භික්ෂූන් වහන්සේලාට, යම් කාල සීමාවකට යටත්ව හෝ නොයටත්ව, සංඝහාර නිත්ථාරක මණ්ඩලය, මූලික සංඝාධිකරණ සහ කාරක සංඝාධිකරණ තුළ තනතුරු දැරීම වළක්වාලමින් ද උත්තරීතර සංඝාධිකරණය තුළ අනාගතයෙහි තනතුරු දැරීම වළක්වාලමින් තීන්දු ලබා දීමේ බලය උත්තරීතර සංඝාධිකරණයට ඇත. එවැනි තීන්දු ලබා දිය යුත්තේ "විනය දඬුවම් සහ විනය කර්ම පොතට" අනුකූලව ම ය.

උත්තරීතර සංඝාධිකරණයේ තීන්දුවක් නැවත සලකා බැලීම	මූලික විනය අයිතිවාසිකම් සම්බන්ධයෙන් හෝ සංඝහාර දැරීම වාරණය කරමින් උත්තරීතර සංඝාධිකරණය විසින් ලබා දෙනු ලබන තීන්දුවකට එරෙහිව, එක් වරක් පමණක් එම තීන්දුව නැවත සලකා බලන ලෙස උත්තරීතර සංඝාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. එවැනි ඉල්ලීමක් සලකා බැලීම සඳහා, පළමු තීන්දුව ලබා දුන් විනිශ්චයකාර ස්ථවිරවරුන්ගෙන් අන්‍ය වූ විනිශ්චයකාර ස්ථවිරවරුන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් විසින් නම් කළ යුතුය.
සංඝාධිකරණයවල ට පැමිණිලි ඉදිරිපත් කිරීම සහ යොමු කිරීම	භික්ෂූන් වහන්සේලා විසින් විනය විරෝධී හෝ උත්තරීතර සංඝ ව්‍යවස්ථා විරෝධී කටයුතු සිදු කළ බවට පැමිණිලි විනය කමිටුව වෙත ඉදිරිපත් වූ විට, විනය කමිටුව විසින් එම පැමිණිලි අදාළ සංඝාධිකරණය වෙත යොමු කළ යුතුය.

නිකාය සහ පාර්ශ්ව සංඝාධිකරණවල අධිකරණ බලය

යම් කිසි නිකායකට හෝ පාර්ශ්වයකට අයත් භික්ෂුවක් සම්බන්ධ චෝදනා සහ එක ම නිකායකට හෝ පාර්ශ්වයකට අයත් භික්ෂූන් වහන්සේලා අතර ඇති වන ආරවුල්, විහාරස්ථානවල හෝ විහාරස්ථානවලට අදාළ සේවාවන් ඉටු කිරීම හා සම්බන්ධ ආරවුල් විනිශ්චය කළ යුත්තේ නිකාය සහ පාර්ශ්ව සංඝාධිකරණවල ය.

මූලික සංඝාධිකරණයේ අධිකරණ බලය

නිකාය දෙකකට හෝ පාර්ශ්ව දෙකකට අයත් භික්ෂූන් වහන්සේලා අතර ඇති වන ආරවුල් හෝ නිකාය දෙකකට හෝ පාර්ශ්ව දෙකකට අයත් විහාරස්ථානවල හෝ විහාරස්ථානවලට අදාළ සේවාවන් ඉටු කිරීම හා සම්බන්ධ ආරවුල් විනිශ්චය කළ යුත්තේ මූලික සංඝාධිකරණය ඉදිරියේ ය.

නිකාය හෝ පාර්ශ්ව සංඝාධිකරණයක විනිශ්චය කළ හැකි අධිකරණ කටයුත්තක් වුව ද, අදාළ නිකාය හෝ පාර්ශ්ව සංඝාධිකරණය අවශ්‍ය යැයි සලකන්නේ නම් එම අධිකරණ කටයුත්ත අදාළ මූලික සංඝාධිකරණය වෙත යොමු කළ හැක.

කාරක සංඝාධිකරණයට යොමු කළ යුතු විනය කර්ම

භික්ෂුවක් විනයෙහි සඳහන් තජ්ජනීය කර්මය, පබ්බාජනීය කර්මය, නියස්ස කර්මය, උක්ඛේපනීය කර්මය හෝ බ්‍රහ්මදණ්ඩනය වැනි විනය කර්මවලින් යම් දඬුවමක් ලැබීමට වරදකරු බවට මූලික සංඝාධිකරණයකට හෝ නිකාය සහ පාර්ශ්ව සංඝාධිකරණයකට පෙනී යන්නේ නම්, තම තීරණය සහ ඊට හේතු දක්වන වාර්තාවක් කාරක සංඝාධිකරණය වෙත යොමු කළ යුතුය.

භික්ෂුවක් සූවිසි පාරාජිකාවන්ගෙන් එකකට පත් වී ඇති බවට සකාරණව පෙනී යන්නේ නම් හෝ භික්ෂුව පාරාජිකා වූ බව ඔප්පු වී ඒ භික්ෂුව විසින් ඒ බව ප්‍රතිඥා කළ විට දී මූලික සංඝාධිකරණ විසින් හෝ නිකාය සහ පාර්ශ්ව අධිකරණ විසින් ඒ පිළිබඳ වාර්තාවක් කාරක සංඝාධිකරණය වෙත යොමු කළ යුතුය.

කාරක සංඝාධිකරණයේ විශේෂ අධිකරණ බලය

කාරක සංඝාධිකරණය විසින් එම නඩුව නැවත විභාග කොට සුදුසු පරිදි දඬුවම් පැනවීම හෝ නොපැනවීම තීරණය කළ යුතුය.

නොහික්මුණු භික්ෂූන් හික්මවීම සඳහා විනයෙහි සඳහන් තජ්ජනීය කර්මය, පබ්බාජනීය කර්මය, නියස්ස කර්මය, උක්ඛේපනීය කර්මය සහ බ්‍රහ්මදණ්ඩනය වැනි විනය ක්‍රියාමාර්ග සංඝයා විසින් පනවනු ලබන විට, එම දඬුවම් ලැබූ භික්ෂූන් වහන්සේලා සමඟ අනෙකුත් ප්‍රකෘති භික්ෂූන් වහන්සේලා කටයුතු කළ යුතු ආකාරය ද විනයෙහි පැහැදිලිව දක්වා ඇත.

සංඝයා විසින් පනවනු ලබන විනයානුකූල දඬුවම් අපේක්ෂිත ප්‍රතිඵල ලබා දීම, සංඝ සාමග්‍රිය ආරක්ෂා වීම, සංඝයාගේ ශීල පාරිශුද්ධත්වය පවත්වා ගැනීම සහ දඬුවම් ලැබූ භික්ෂූන් වහන්සේලා තම වරද නිවැරදි කර ගැනීමට පෙළඹීම සිදු වන්නේ ප්‍රකෘති භික්ෂූන් වහන්සේලා එම විනය ක්‍රියාමාර්ග නිසි පරිදි අනුගමනය කරන විට ය.

එහෙත් බහුතර ප්‍රකෘති භික්ෂූන් වහන්සේලා යම් යම් හේතූන් මත එම දඬුවම් නොසලකා හැර දඬුවම් ලැබූ භික්ෂූන් වහන්සේලා සමඟ පෙර

	පරිදි කටයුතු කරන්නේ නම්, සංඝාධිකරණයේ තීන්දු තීරණ ප්‍රායෝගික වශයෙන් අකාර්යක්ෂම වන්නේ ය. එබැවින් සමස්ත සංඝයාගේ පිළිගැනීම, සහයෝගය සහ සම්බන්ධීකරණය අවශ්‍ය වන තජ්ජනීය කර්මය, පබ්බාජනීය කර්මය, නියස්ස කර්මය, උක්ඛේපනීය කර්මය සහ බ්‍රහ්මදණ්ඩනය වැනි විනය ක්‍රියාමාර්ග පැනවීමේ බලය කාරක සංඝාධිකරණය වෙත පැවරිය යුතුය. කාරක සංඝාධිකරණය විසින් යම් කිසි භික්ෂුවකට උක්ඛේපනීය කර්මය, පබ්බාජනීය කර්මය, තජ්ජනීය කර්මය, පකාසනීය කර්මය වැනි නිග්‍රහ කර්මයක් සිදු කිරීමට තීරණය කළ හොත් අදාළ නිග්‍රහ කර්මය සිදු කිරීමට විනය කාරක මණ්ඩලයට නියෝග කළ යුතුය. විනය කාරක මණ්ඩලය විසින් අදාළ විනය කර්මය සිදු කළ පසු ඒ බව විහාර සංවර්ධන අංශයේ ලියාපදිංචි වී ඇති සියලු භික්ෂු විහාරස්ථානවලට දැනුම් දිය යුතුය. එසේ දැනුම් දෙන විට දී විහාරස්ථානවල සංඝයා විසින් නිග්‍රහ කර්මයට ලක් වූ භික්ෂුව සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය ද විනය කාරක මණ්ඩලය විසින් සියලු භික්ෂු විහාරස්ථානවලට දැනුම් දිය යුතුය. භික්ෂුවක් සුවිසි පාරාජිකාවන්ගෙන් එකකට පත් වී ඇති බවට සකාරණව පෙනී යන්නේ නම් හෝ භික්ෂුව පාරාජිකා වූ බව ඔප්පු වී ඒ භික්ෂුව විසින් ඒ බව ප්‍රතිඥා කළ විට දී නිකාය සහ පාර්ශ්ව අධිකරණ විසින් හෝ මූලික සංඝාධිකරණ විසින් තම තීරණය සහ ඊට හේතු දක්වන වාර්තාවක් කාරක සංඝාධිකරණය වෙත යොමු කළ යුතුය. කාරක සංඝාධිකරණය විසින් ඒ පිළිබඳ විමර්ශනය කොට පාරාජිකාපත්තිය පිළිබඳව නිසැක වුව හොත් සහ චූදිත භික්ෂුව ප්‍රතිඥා දෙන්නේ නම් එම භික්ෂුව සිවුරු හරවා යැවීමට විනය කාරක මණ්ඩලයට නියෝග කළ යුතුය. එම භික්ෂුව ශාසනයෙන් විනයානුකූලව නෙරපා හැරීමෙන් අනතුරුව එම භික්ෂුවගේ නෙරපීම පිළිබඳව විහාර සංවර්ධන අංශයේ ලේඛනයේ ඇතුලත් සියලු භික්ෂු විහාරස්ථානවලට දැනුම් දිය යුතුය. මෙසේ පාරාජිකාපත්තියකට පත් වී මහණකම නැති කර ගත් භික්ෂුවක් තව දුරටත් භික්ෂු වේශයෙන් පෙනී සිටින්නේ නම් ඔහු තව දුරටත් ශාසනයේ භික්ෂුවක් නොවන බවත් ඔහුගේ ක්‍රියාකලාප පිළිබඳ ශ්‍රී ලංකාවේ සමස්ථ සංඝයා වග නොකියන බවත් පවසමින් සාසන සන්නිවේදන මණ්ඩලයට රජය පිළිගත් සිංහල, ඉංග්‍රීස සහ දමිළ පුවත්පත්වල දැනවීම් පළ කළ යුතු බවට විනය කාරක මණ්ඩලය විසින් කාරක සංඝාධිකරණයෙන් අවසර ලබා ගෙන නියෝග කළ යුතුය. තව ද සාසන සන්නිවේදන මණ්ඩලයේ සමාජ මාධ්‍ය ගිනුමේ ද එම පණිවුඩය ප්‍රකාශයට පත් කළ යුතුය.
අභියාචනා බලය	නිකාය සහ පාර්ශ්ව සංඝාධිකරණයක, මූලික සංඝාධිකරණයක හෝ කාරක සංඝාධිකරණයක විනිශ්චයකින් අතෘප්තියට පත් වන භික්ෂුවකට උත්තරීතර සංඝාධිකරණය වෙත අභියාචනා කළ හැක.

	එම අභියාචනය උත්තරීතර සංඝාධිකරණයේ ගරු විනිශ්චයකාර ස්වාමීන් වහන්සේලා තුන් නමක් විසින් විමසා බලා විභාගයට ගැනීම හෝ නොගැනීම තීරණය කළ හැකිය. විභාගයට ගැනීමට තීරණය කරන ලද අභියාචනයක් විභාග කිරීම සඳහා විනිශ්චය මණ්ඩලයක් අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් විසින් පත් කළ යුතු අතර, එම විනිශ්චය මණ්ඩලය විසින් ලබා දෙන උත්තරීතර සංඝාධිකරණ විනිශ්චය අවසානාත්මක වේ.
තීන්දු තීරණ සහ දඬුවම් ක්‍රියාත්මක කිරීම	උත්තරීතර සංඝාධිකරණය, කාරක සංඝාධිකරණය සහ මූලික සංඝාධිකරණය විසින් ලබා දෙන තීන්දු තීරණ සහ දඬුවම් විනය කාරක මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතුය. නිකාය සහ පාර්ශ්ව සංඝාධිකරණ විසින් ලබා දෙන තීන්දු තීරණ සහ දඬුවම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද ඒ ඒ නිකාය සහ පාර්ශ්ව විසින් ධර්මවිනයානුකූලව සකස් කර ගත යුතුය.
අධිකරණ තීන්දු තීරණවල අවසානාත්මකභාව ය	**"යො පන භික්ඛු ජානං යථාධම්මං නිහතාධිකරණං පුනකම්මාය උක්කොටෙයා, පාචිත්තියං"** යන ශික්ෂාපදයට අනුව, සංඝාධිකරණයක් විසින් සාධාරණව විනිශ්චය කරන ලද අධිකරණයක් සාධාරණව විනිශ්චය කරන ලද්දේ ය යන සංඥාව ඇතිව විවේචනය කිරීම හෝ සාධාරණ හේතුවකින් තොරව නැවත විනිශ්චය සඳහා ගැනීමට උත්සාහ කිරීම නොකළ යුතුය. එය බරපතළ වරදකි.
අධිකරණ තීරණවල බැඳී සිටීම	සංඝාධිකරණය විසින් දෙනු ලබන තීරණ, මෙම ව්‍යවස්ථාවේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්, සියලුම ශාසන අධිකාරි ආයතන සහ ශාසන සාමාජිකයනයෝ ගරු කිරීමට බැඳී සිටිති.
අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම	මූලික සංඝාධිකරණ, කාරක සංඝාධිකරණය සහ උත්තරීතර සංඝාධිකරණය විසින් දෙනු ලබන තීන්දු, නියෝග සහ දඬුවම් මෙම ව්‍යවස්ථාවට අනුව සියලුම ශාසන අධිකාරි ආයතන විසින් ගරු කොට ක්‍රියාත්මක කළ යුතුය. විශේෂයෙන්, එම තීන්දු, නියෝග සහ දඬුවම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විනය කර්ම සහ අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම විනය කාරක කමිටුවේ විශේෂ වගකීම වන්නේ ය.
අධිකරණ තීන්දුවල හේතු දැක්වීම	මූලික සංඝාධිකරණය, කාරක සංඝාධිකරණය සහ උත්තරීතර සංඝාධිකරණය විසින් දෙනු ලබන සියලුම තීන්දු, නියෝග සහ දඬුවම් සඳහා ඒවාට පදනම් වූ ධර්මවිනයානුකූල, උත්තරීතර සංඝ ව්‍යවස්ථානුකූල සහ නෛතික හේතු පැහැදිලිව ලිඛිතව සඳහන් කළ යුතුය. එම තීන්දු සහ හේතු දැක්වීම්වල සහතික කළ පිටපත්, නඩුවට අදාළ පාර්ශ්වයන්ට සහ විනය සහ නීතිය පිළිබඳ උනන්දුවක් ඇති ශාසන සාමාජිකයන්ට අදාළ කාර්යාලවලින් ලිඛිත ඉල්ලීමක් මත ලබා ගත හැක.

අධිකරණ වාර්තා සහ ලේඛන	මූලික සංඝාධිකරණ, කාරක සංඝාධිකරණය සහ උත්තරීතර සංඝාධිකරණය විසින් පවත්වාගෙන යනු ලබන සියලුම නඩුවලට අදාළ වාර්තා සහ ලේඛන අදාළ සංඝාධිකරණ කාර්යාලවල හෝ උත්තරීතර සංඝ සභාව විසින් නියම කරනු ලබන ස්ථානයක සුරක්ෂිතව සංරක්ෂණය කළ යුතුය. එම ලේඛන පවත්වාගෙන යාම, සංරක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ සහතික කළ පිටපත් නිකුත් කිරීම පිළිබඳ ක්‍රියාපටිපාටිය උත්තරීතර සංඝ සභාව විසින් සම්මත කරනු ලබන කතිකා මඟින් නියම කළ හැක.
අධිකරණ පරිපාලනය	සංඝාධිකරණවල පරිපාලන කටයුතු කාර්යක්ෂමව, අපක්ෂපාතීව සහ විනිවිදභාවයෙන් පවත්වාගෙන යා යුතුය. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාපටිපාටි උත්තරීතර සංඝ සභාව විසින් කතිකා මඟින් නියම කළ හැක.

දොළොස්වෙනි පරිච්ඡේදය:
සංඝාධිකරණයේ ස්වාධීනත්වය

සංඝාධිකරණයේ ස්වාධීනත්වය	සංඝාධිකරණය ධර්මවිනය, උත්තරීතර සංඝ සභාව විසින් සම්මත කරනු ලබන ධර්මවිනයානුකූල අර්ථකථන, උත්තරීතර සංඝ ව්‍යවස්ථාව සහ උත්තරීතර සංඝ සභාව විසින් සම්මත කරනු ලබන කතිකා අනුව පමණක් සිය අධිකරණ බලය ස්වාධීනව ක්‍රියාත්මක කළ යුතුය. සංඝාධිකරණය සිය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී වෙනත් කිසිදු ශාසන අධිකාරි ආයතනයක, නිකායක, පාර්ශ්වයක හෝ පුද්ගලයෙකුගේ නියෝගයට හෝ පාලනයට යටත් නොවිය යුතුය.
අධිකරණයට බලපෑම් කිරීම වැළැක්වීම	කිසිදු ශාසන අධිකාරි ආයතනයක්, නිලධාරියෙක් හෝ ශාසන සාමාජිකයෙක් විභාග වෙමින් පවතින හෝ විභාග කිරීමට නියමිත නඩුවක් සම්බන්ධයෙන් සංඝාධිකරණයට හෝ එහි විනිසුරුවරයෙකුට ඍජුව හෝ වක්‍රව බලපෑම් කිරීම, උපදෙස් දීම, තර්ජනය කිරීම, පොළඹවා ගැනීම හෝ තීන්දුවට බලපෑ හැකි ආකාරයෙන් කටයුතු කිරීම නොකළ යුතුය. එවැනි ක්‍රියාවක් උත්තරීතර සංඝ ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වන්නේ ය.
විනිසුරුවරුන්ගේ ස්වාධීනත්වය	සංඝාධිකරණ විනිසුරුවරුන් තම කාර්යයන් ඉටු කිරීමේ දී ධර්මවිනයට, උත්තරීතර සංඝ සභාව විසින් සම්මත කරනු ලබන ධර්මවිනයානුකූල අර්ථකථනවලට, උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට සහ උත්තරීතර සංඝ සභාව විසින් සම්මත කරනු ලබන කතිකාවත්වලට පමණක් යටත්ව, කිසිදු අගතියකින් තොරව, අයුතු බලපෑම් නොසලකා ස්වාධීනව සහ අපක්ෂපාතීව විනිශ්චය කළ යුතුය.
විනිශ්චයකාර ස්ථවිරවරුන්ගේ ආචාරධර්ම	සංඝාධිකරණ විනිශ්චය ස්ථවිරවරුන්ගේ ආචාර ධර්ම පහත පරිදි වේ. (1). සංඝාධිකරණ විනිශ්චයකාර ස්ථවිරයන් වහන්සේලා තම ධුරයේ ගරුත්වය, ස්වාධීනත්වය, අපක්ෂපාතීභාවය සහ අවංකභාවය සෑම අවස්ථාවක ම ආරක්ෂා කළ යුතුය. (2). නඩු විභාගවල සාධාරණත්වයට හෝ සංඝාධිකරණය කෙරෙහි ශාසන සාමාජිකයන්ගේ සහ ගිහියන්ගේ විශ්වාසයට හානි විය හැකි ආකාරයෙන් කිසිදු ක්‍රියාවක් නොකළ යුතුය. (3). දෙවෙනි ධර්ම සංගායනාවේ මුලසුන හෙබවූ සබ්බකාමී මහ රහතන් වහන්සේගේ ආදර්ශය අනුගමනය කරමින් නිකායකට හෝ පාර්ශ්වයකට

අයුතු වාසියක් හෝ අවාසියක් ඇති කළ හැකි ත්‍යාග හෝ ප්‍රතිලාභ පිළි නොගත යුතුය.

(4). තමන්ට අපක්ෂපාතීව විනිශ්චය කළ නොහැකි යැයි සාධාරණ ලෙස පෙනී යන නඩුවකින් ස්වකීය කැමැත්තෙන් ඉවත් විය යුතුය.

පරිවාරපාළි ආදි ග්‍රන්ථවල සඳහන් විනිශ්චයකාර ස්ථවිරයන්ගේ ආචාරධර්ම පිළිබඳ සවිස්තරාත්මක විධිවිධාන උත්තරීතර සංඝ සභාව විසින් සම්මත කරනු ලබන "සංඝාධිකරණ විනිශ්චයකාර ආචාරධර්ම සංග්‍රහය" මඟින් නියම කළ හැකි ය.

සංඝාධිකරණයේ විනිශ්චය ස්ථවිරවරු වීමට සුදුසුකම්

උත්තරීතර සංඝාධිකරණය, කාරක සංඝාධිකරණය සහ මූලික සංඝාධිකරණය යන සංඝාධිකරණවල විනිශ්චයකාර තනතුරුවලට පත් වීමට භික්ෂුවක් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(1). උත්තරීතර සංඝාධිකරණයේ විනිශ්චයකාර තනතුරක් හෙබවිය හැක්කේ වස් තිහක් හෝ ඊට වැඩි භික්ෂුවකට පමණි.

(2). කාරක සංඝාධිකරණයේ විනිශ්චයකාර තනතුරක් හෙබවිය හැක්කේ වස් විස්සක් හෝ ඊට වැඩි භික්ෂුවකට පමණි.

(3). මූලික සංඝාධිකරණයේ විනිශ්චයකාර තනතුරක් හෙබවිය හැක්කේ වස් පහළොවක් හෝ ඊට වැඩි භික්ෂුවකට පමණි.

(4). බෞද්ධ නීති විද්‍යාලයේ උපාධිය සමත් වී, විශේෂයෙන් භික්ෂු විනය සහ නීතියේ මූලධර්ම පිළිබඳ හොඳ පරිචයක් සහ දැනුමක් ඇති භික්ෂුවක් විය යුතුය.

(5). විනය උපකාරක මණ්ඩලයේ අවම වශයෙන් වසර පහක කාලයක් සේවය කළ භික්ෂූන් වහන්සේලාට විනිශ්චයකාර තනතුරු සඳහා පත් කිරීමේ දී ප්‍රමුඛතාව ලබා දිය යුතුය. එසේ වුව ද, ධර්මවිනය පිළිබඳ ප්‍රමාණවත් දැනුම සහ සංඝයාගේ විශ්වාසය දිනාගත් වෙනත් සුදුසු භික්ෂූන් වහන්සේලා ද විනිශ්චයකාර තනතුරු සඳහා පත් කළ හැකි ය.

(6). තව ද නිකාය හෝ පාර්ශ්ව සංඝාධිකරණයක විනිශ්චයකාරවරයෙකු ලෙස වසර දහයකට නොඅඩු කාලයක් සේවය කළ ස්ථවිරවරයෙකු උත්තරීතර සංඝාධිකරණයේ, කාරක සංඝාධිකරණයේ හෝ මූලික සංඝාධිකරණයක විනිශ්චයකාර තනතුරකට පත් කිරීමට සුදුසුකම් ලබයි.

(7). ධර්ම විනයට හෝ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් උත්තරීතර සංඝාධිකරණය විසින් විනිශ්චයකාර තනතුරක් දැරීමට නුසුදුසු යැයි තීරණය කර නොමැති භික්ෂුවක් විය යුතුය.

උත්තරීතර සංඝාධිකරණයට විනිශ්චයකාර ස්ථවිරවරුන් පත් කිරීම

උත්තරීතර සංඝාධිකරණයේ විනිශ්චයකාර තනතුරක් පුරප්පාඩු වූ අවස්ථාවක දී, උත්තරීතර මහානායක මණ්ඩලය විසින් තමන්ට සුදුසු යැයි හැඟෙන, ඒ වන විට කාරක සංඝාධිකරණයේ සේවය කරන හෝ මූලික සංඝාධිකරණයක සේවය කරන විනිශ්චයකාර මහා ස්ථවිරයන් වහන්සේ නමක් හෝ නිකාය හෝ පාර්ශ්ව සංඝාධිකරණයක විනිශ්චයකාරවරයෙකු ලෙස වසර දහයකට නොඅඩු කාලයක් සේවය කර ඇති ව්‍යවස්ථාවෙන් නියම කර ඇති සුදුසුකම් සපුරන ලද මහා ස්ථවිරවරයෙකු එම තනතුරු සඳහා තෝරා පත් කළ යුතුය.

අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිර පත් කිරීම

අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිර තනතුර පුරප්පාඩු වන අවස්ථාවක දී, උත්තරීතර මහානායක මණ්ඩලය විසින් ඒ වන විට උත්තරීතර සංඝාධිකරණයේ හෝ කාරක සංඝාධිකරණයේ සේවය කරන විනිශ්චයකාර මහා ස්ථවිරයන් වහන්සේලා අතරින් සුදුසු යැයි සලකනු ලබන ස්ථවිරයන් වහන්සේ නමක් එම තනතුරට පත් කළ යුතු ය.

අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් වහන්සේගේ බලතල සහ කාර්යභාරය

(1). උත්තරීතර සංඝාධිකරණයේ ප්‍රධානියා වීම

අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් වහන්සේ උත්තරීතර සංඝාධිකරණයේ ප්‍රධානියා වන අතර, ඔහුට කාරක සංඝාධිකරණය සහ මූලික සංඝාධිකරණවල අධිකරණ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා දිය හැකි ය.

(2). විනිශ්චය මණ්ඩල පත් කිරීම

උත්තරීතර සංඝාධිකරණයේ නඩු විභාග සඳහා විනිශ්චය මණ්ඩල පත් කරනු ලබන්නේ අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් වහන්සේ විසිනි.

(3). විනය දඬුවම් සහ විනය කර්ම පොත සංශෝධනය යෝජනා කිරීම

"විනය දඬුවම් සහ විනය කර්ම පොත" සංශෝධනය කිරීම හෝ එයට නව විධිවිධාන ඇතුළත් කළ යුතු යැයි අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් වහන්සේ හෝ උත්තරීතර සංඝාධිකරණය සලකන්නේ නම්, ඒ පිළිබඳ ලිඛිත යෝජනා උත්තරීතර සංඝ සභාව වෙත ඉදිරිපත් කළ හැකි ය.

(4). ව්‍යවස්ථාදායක කටයුතු පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම

උත්තරීතර සංඝ සභාව විසින් සිදු කරනු ලබන ධර්මවිනය නිර්වචන, උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට සිදු කරනු ලබන සංශෝධන සහ සම්මත කරනු ලබන කතිකා සම්බන්ධයෙන් අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් වහන්සේට, තම පෞද්ගලික අදහස් හෝ උත්තරීතර සංඝාධිකරණයේ අදහස් ලිඛිතව උත්තරීතර සංඝ සභාව වෙත ඉදිරිපත් කළ හැකි ය.

අවශ්‍ය අවස්ථාවල දී අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් වහන්සේට උත්තරීතර සංඝ සභාව ඉදිරියේ පෙනී සිට තම අදහස් වාචිකව ඉදිරිපත් කළ හැකි ය. එසේ ම, උත්තරීතර සංඝාධිකරණයේ වෙනත් විනිශ්චයකාර මහා ස්ථවිරයන් වහන්සේ නමක් මඟින් ද එම අදහස් ඉදිරිපත් කරවිය හැකි ය.

අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් වහන්සේ හෝ උත්තරීතර සංඝාධිකරණය විසින් ඉදිරිපත් කරනු ලබන අදහස් උත්තරීතර සංඝ සභාව විසින් විශේෂයෙන් සලකා බැලිය යුතු ය. එසේ වුව ද, ඒ සම්බන්ධයෙන් උත්තරීතර සංඝ සභාව විසින් ගනු ලබන තීරණය අවසානාත්මක වන්නේ ය.

කාරක සංඝාධිකරණයේ සභාපති මහා ස්ථවිර පත් කිරීම

කාරක සංඝාධිකරණයේ සභාපති තනතුර පුරප්පාඩු වන අවස්ථාවක දී, උත්තරීතර මහානායක මණ්ඩලය විසින් ඒ වන විට කාරක සංඝාධිකරණයේ සේවය කරන විනිශ්චයකාර මහා ස්ථවිරයන් වහන්සේලා අතරින් සුදුසු යැයි සලකනු ලබන ස්ථවිරයන් වහන්සේ නමක් එම තනතුරට පත් කළ යුතු ය.

කාරක සංඝාධිකරණයේ සභාපති ස්ථවිරයන් වහන්සේගේ බලතල සහ කාර්යභාරය

(1). කාරක සංඝාධිකරණයේ ප්‍රධානියා වීම

කාරක සංඝාධිකරණයේ සභාපති ස්ථවිරයන් වහන්සේ කාරක සංඝාධිකරණයේ ප්‍රධානියා වේ.

(2). විනිශ්චය මණ්ඩල පත් කිරීම

කාරක සංඝාධිකරණයේ නඩු විභාග සඳහා විනිශ්චය මණ්ඩල පත් කරනු ලබන්නේ සභාපති ස්ථවිරයන් වහන්සේ විසිනි.

(3). විනය දඬුවම් සහ විනය කර්‍ම පොත සංශෝධනය යෝජනා කිරීම

"විනය දඬුවම් සහ විනය කර්‍ම පොත" සංශෝධනය කිරීම හෝ එයට නව විධිවිධාන ඇතුළත් කළ යුතු යැයි කාරක සංඝාධිකරණයේ සභාපති ස්ථවියන් වහන්සේ හෝ කාරක සංඝාධිකරණය සලකන්නේ නම්, ඒ පිළිබඳ ලිඛිත යෝජනා උත්තරීතර සංඝ සභාව වෙත ඉදිරිපත් කළ හැකි ය.

	(4). ව්‍යවස්ථාදායක කටයුතු පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම උත්තරීතර සංඝ සභාව විසින් සිදු කරනු ලබන ධර්මවිනය නිර්වචන, උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට සිදු කරනු ලබන සංශෝධන සහ සම්මත කරනු ලබන කතිකා සම්බන්ධයෙන් කාරක සංඝාධිකරණයේ සභාපති මහා ස්ථවිරයන් වහන්සේට, තම පෞද්ගලික අදහස් හෝ කාරක සංඝාධිකරණයේ අදහස් ලිඛිතව උත්තරීතර සංඝ සභාව වෙත ඉදිරිපත් කළ හැකි ය. අවශ්‍ය අවස්ථාවල දී කාරක සංඝාධිකරණයේ සභාපති මහා ස්ථවිරයන් වහන්සේට උත්තරීතර සංඝ සභාව ඉදිරියේ පෙනී සිට තම අදහස් වාචිකව ඉදිරිපත් කළ හැකි ය. එසේ ම, කාරක සංඝාධිකරණයේ වෙනත් විනිශ්චයකාර මහා ස්ථවිරයන් වහන්සේ නමක් මඟින් ද එම අදහස් ඉදිරිපත් කරවිය හැකි ය. කාරක සංඝාධිකරණයේ සභාපති මහා ස්ථවිරයන් වහන්සේ හෝ කාරක සංඝාධිකරණය විසින් ඉදිරිපත් කරනු ලබන අදහස් උත්තරීතර සංඝ සභාව විසින් විශේෂයෙන් සලකා බැලිය යුතු ය. එසේ වුව ද, ඒ සම්බන්ධයෙන් උත්තරීතර සංඝ සභාව විසින් ගනු ලබන තීරණය අවසානාත්මක වන්නේ ය.
කාරක සංඝාධිකරණයට විනිශ්චය ස්ථවිරවරුන් පත් කිරීම	කාරක සංඝාධිකරණයේ විනිශ්චයකාර තනතුරක් පුරප්පාඩු වන අවස්ථාවක දී, උත්තරීතර මහානායක මණ්ඩලය විසින් තමන්ට සුදුසු යැයි හැඟෙන, ඒ වන විට මූලික සංඝාධිකරණයක සේවය කරන හෝ නිකාය සහ පාර්ශ්ව සංඝාධිකරණයක වසර දහයකට නොඅඩු කාලයක් විනිශ්චයකාර ස්ථවිරවරයෙකු වශයෙන් කටයුතු කර ඇති, ව්‍යවස්ථාවෙන් නියම කර ඇති සුදුසුකම් සපුරන ලද මහා ස්ථවිරවරයෙකු කාරක සංඝාධිකරණයේ විනිශ්චයකාර තනතුර සඳහා පත් කළ යුතුය.
මූලික සංඝාධිකරණයට විනිශ්චයකාර ස්ථවිරවරුන් පත් කිරීම	මූලික සංඝාධිකරණයක විනිශ්චයකාර තනතුරු පුරප්පාඩු වන අවස්ථාවල දී, උත්තරීතර සංඝ සභාවේ තේරීම් කාරක සභාවේ නිර්දේශ මත, උත්තරීතර මහානායක මණ්ඩලය විසින් ව්‍යවස්ථාවෙන් නියම කර ඇති සුදුසුකම් සපුරන ලද භික්ෂූන් එම තනතුරු සඳහා පත් කළ යුතුය. එහි දී නිකාය සහ පාර්ශ්ව සංඝාධිකරණවල සේවය කර ඇති භික්ෂූන්ට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.
විනිශ්චයකාර ස්ථවිරවරුන්ගේ වයස් සීමා	උත්තරීතස සංඝාධිකරණයේ, කාරක සංඝාධිකරණයේ සහ මූලික සංඝාධිකරණවල විනිශ්චයකාර තනතුරුට පත් වූ අයෙකුට උපරිම වයස අවුරුදු හැත්තෑවකට යටත්ව එහි තනතුර හෙබවිය හැක.

සංඝාධිකරණවල විනිශ්චයකාර ස්ථවිරවරුන්ගේ ධුර කාලය

උත්තරීතර සංඝාධිකරණයේ, කාරක සංඝාධිකරණයේ සහ මූලික සංඝාධිකරණවල විනිශ්චයකාර ස්ථවිරවරුන්ට උත්තරීතර සංඝ ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ධුරයෙන් ඉවත් නොකරන ලද අවස්ථාවක දී, වයස අවුරුදු හැත්තෑව සම්පූර්ණ වන තෙක් හෝ තම අභිමතය පරිදි විශ්‍රාම යන තෙක් ධුරයෙහි රැඳී සිටිය හැකි ය.

උත්තරීතර සංඝාධිකරණ සහ කාරක සංඝාධිකරණ විනිශ්චකාරවරුන් ධුරයෙන් ඉවත් කිරීම

උත්තරීතර සංඝාධිකරණයේ අග්‍ර සඞ්ගාමාවචර මහා ස්ථවිරයන් ඇතුලු විනිශ්චයකාර ස්ථවිරයෙක් හෝ කාරක සංඝාධිකරණයේ සභාපති ස්ථවිරයන් අතුලු විනිශ්චයකාර ස්ථවිරයෙක් විනය විරෝධී ලෙස හෝ ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට පටහැනි ලෙස කටයුතු කරන්නේ යැයි පැමිණිල්ලක් ලැබුණු විට, ඔහු උත්තරීතර සංඝ සභාවේ අධීක්ෂණ කාරක සභාව ඉදිරියට කැඳවා විභාග කිරීමට උත්තරීතර සංඝ සභාවට බලය ඇත.

අපක්ෂපාතී විභාගයකින් අනතුරුව අදාළ විනිශ්චයකාර ස්ථවිරවරයා එම ධුරයෙන් ඉවත් කළ යුතු තරම් බරපතළ වරදක් සිදු කර ඇති බවට අධීක්ෂණ කාරක සභාව සෑහීමකට පත් වන්නේ නම්, ඒ පිළිබඳ හේතු දක්වමින් නිර්දේශයක් උත්තරීතර සංඝ සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

අනතුරුව චූදිත විනිශ්චයකාර ස්ථවිරයන්ට තමන් ඉවත් කිරීම සම්බන්ධ චෝදනාවන්ට උත්තරීතර සංඝ සභාවට තමන් හෝ පැමිණ තම නියෝජිතයෙකු හෝ යවා කරුණු ඉදිරිපත් කළ හැක. අධීක්ෂණ කාරක සභාවට ද අදාළ විනිශ්චයකාර ස්ථවිරයන් ඉවත් කිරීම පිළිබඳ තීරණය සවිස්තරව උත්තරීතර සංඝ සභාවට ඉදිරිපත් කළ හැක.

දෙපාර්ශ්වයේ ම කරුණු විමසා බැලීමෙන් අනතුරුව මහා සංඝ සභාවේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට (2/3) නොඅඩු බහුතරයකින් ද, ස්ථවිර සභාවේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට (2/3) නොඅඩු බහුතරයකින් ද, සියම්, අමරපුර සහ රාමඤ්ඤ යන එක් එක් නිකාය නියෝජනය කරන සාමාජිකයන්ගේ වෙන වෙන ම සරළ බහුතරයකින් ද සම්මත වුව හොත්, එම විනිශ්චයකාර ස්ථවිරවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබේ.

ධුරය තාවකාලිකව අත්හිටුවීම

උත්තරීතර සංඝාධිකරණයේ හෝ කාරක සංඝාධිකරණයේ විනිශ්චයකාර ස්ථවිරවරයෙකුට එරෙහිව ඉදිරිපත් වූ පැමිණිල්ලක් මුල් බැල්මට බරපතළ සහ විශ්වසනීය බවට උත්තරීතර සංඝ සභාවේ අධීක්ෂණ කාරක සභාව සෑහීමකට පත් වන්නේ නම්, විභාගය අවසන් වන තෙක් එම විනිශ්චයකාර ස්ථවිරවරයා ධුරයෙන් තාවකාලිකව අත්හිටුවීමට උත්තරීතර මහා නායක මණ්ඩලය වෙත හේතු දක්වමින් නිර්දේශ කළ හැකි ය. එම නිර්දේශය උත්තරීතර මහා නායක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබුවහොත්,

	විභාගය අවසන් වන තෙක් එම විනිශ්චයකාර ස්ථවිරවරයාගේ ධුරය තාවකාලිකව අත්හිටුවනු ලැබේ. එවැනි අත්හිටුවීමක් වරදකාරීභාවය පිළිබඳ තීරණයක් ලෙස නොසැලකිය යුතුය.
අධිකරණ විභාග පැවැත් වීම	සංඝාධිකරණයක අධිකරණ විභාග ධර්ම විනයට සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුකූලව පැවැත්විය යුතු අතර, ථේරවාද සංඝ සංස්ථාව නියෝජනය කරන ඕනෑම භික්ෂුවකට එම නඩු විභාගයට සහභාගී වීමට අවසර තිබිය යුතුය. විනිශ්චය ශාලාවේ ඉඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී හෝ අධිකරණ කටයුතු නිසි පරිදි හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමට බාධා ඇති වන අවස්ථාවක දී, සංඝාධිකරණයේ මූලාසනය හොබවන විනිශ්චයකාර ස්ථවිරයන්ට අධිකරණ කටයුතු පහසුවෙන් සිදු කර ගැනීම සඳහා ශාලාවේ රැඳී සිටින භික්ෂූන් වහන්සේලාගෙන් අවශ්‍ය පිරිසකට ශාලාවෙන් ඉවත්ව යාමට උපදෙස් දිය හැකි ය. අධිකරණ කටයුත්තක දී ගිහියන් චෝදකයන්, චූදිතයන්, පැමිණිල්ලේ සාක්ෂිකරුවන් හෝ විත්තියේ සාක්ෂිකරුවන් ලෙස ඉදිරිපත් වන අවස්ථාවල දී, ඔවුන්ට සහ ඔවුන් සමඟ පැමිණි ආසන්න පවුලේ සාමාජිකයන්ට හෝ ළඟ ම හිතවතුන්ට අධිකරණ ශාලාව තුළ රැඳී සිටීමට අවසර ලබා දිය යුතු ය. කෙසේ වෙතත්, විභාගයට ලක් වන කරුණු හේතුවෙන් භික්ෂුවකගේ ප්‍රතිරූපයට අනවශ්‍ය හානියක් සිදු විය හැකි යැයි හෝ අධිකරණ කටයුත්තේ සාධාරණත්වයට හෝ විනයානුකූලභාවයට බලපෑමක් ඇති විය හැකි යැයි සංඝාධිකරණයේ මූලාසනය විසින් සලකනු ලබන අවස්ථාවක දී, චෝදකයන්, චූදිතයන් සහ සාක්ෂිකරුවන් ලෙස නඩු විභාගයට සහභාගී වන ගිහියන් හැර අනෙකුත් ගිහියන්ට අධිකරණ ශාලාවෙන් ඉවත්ව යාමට මූලාසනය විසින් නියෝග කළ හැකි ය.

දහතුන්වෙනි පරිච්ඡේදය:
සාමණේරවරු

සාමණේරවරු	“**සමණස්ස පුත්තො සාමණේරො**” යන නිර්වචනයට අනුව, ගිහි ගෙය අතහැර භික්ෂුවක් විසින් පැවිද්ද ලබා දෙන ලද, උපසම්පදා ශීල සංඛ්‍යාත අධිශීලයට පත් නොවූ, දශ ශීලය, සේඛියා වත් හැත්තෑපහ සහ මහා වත් දාහතර රකින හා පිළිපදින පුරුෂ පැවිද්දා “සාමණේරයා” නම් වේ.
සාමණේරවරු සංඝ සංස්ථාවට අයත් බව	සාමණේරවරු උපසම්පදා ශීලයට පත් වී නොසිටින බැවින් ථේරවාද නිර්වචනයට අනුව සංඝ රත්නයට අයත් නොවුව ද, මෙම ව්‍යවස්ථාව අනුව ඔවුන් ද සංඝ සංස්ථාවට අයත් පිරිසක් ලෙස සැලකිය යුතුය.
සාමණේරවරු පිළිබඳ භික්ෂූන්ගේ වගකීම්	සාමණේරයා භික්ෂුවක් යටතේ හික්මිය යුතුය. තම උපාධ්‍යායන් වහන්සේ, ආචාර්ය භික්ෂූන් වහන්සේලා සහ අනෙකුත් භික්ෂූන් වහන්සේලා කෙරෙහි සාමණේරවරුන් විසින් ගෞරවය හා වත් පිළිවෙත් දැක්විය යුතුය. සාමණේරයෙකුගේ උපාධ්‍යායන් වහන්සේ සහ ආචාර්යයන් වහන්සේලා විසින් තම ශිෂ්‍ය සාමණේරයා දරුවෙකු මෙන් රැක බලා ගත යුතුය. විශේෂයෙන් ම කුඩා සාමණේරවරුන්ගේ ආරක්ෂාව, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ යහපැවැත්ම සම්බන්ධයෙන් උපාධ්‍යායන් වහන්සේට සහ ආචාර්යයන් වහන්සේලාට විශේෂ වගකීමක් ඇත. සියලු භික්ෂූන් වහන්සේලා විසින් ද සාමණේරවරුන්ට කරුණාවෙන් සැලකිය යුතු අතර, ඔවුන්ට අනාගතයේ දී උපසම්පදා ශීලයට පත් වීමට අවශ්‍ය උපකාර හා අනුග්‍රහය දැක්විය යුතුය.
සාමණේරවරුන්ගේ අධ්‍යාපනය	සියලු සාමණේරයන්ට ශාසනික වශයෙන් සුදුසු අධ්‍යාපනයක් ලැබීමට විනයානුකූල මූලික අයිතියක් ඇති බව මෙම ව්‍යවස්ථාවෙන් පිළිගනු ලැබේ. සාමණේරයෙකුගේ උපාධ්‍යායන් වහන්සේ සහ ආචාර්යයන් වහන්සේලා විසින් තම ශිෂ්‍ය සාමණේරයාට මූලික පිරිවෙන් අධ්‍යාපනය සහ අවශ්‍ය වුවහොත් උසස් පිරිවෙන් අධ්‍යාපනය ලබා දීමට බැඳී සිටිති.
සාමණේරවරුන්ගේ ආරක්ෂාව	කුඩා සාමණේරවරුන් ලිංගික අපයෝජනයට ලක් කිරීම, මත්ද්‍රව්‍ය භාවිතයට හුරු කරවීම හෝ වෙනත් අපරාධමය හා පිළිකුල්සහගත ක්‍රියාවලට යොමු කරවීම රටේ දණ්ඩ නීතිය යටතේ මෙන්ම තථාගත විනයට අනුව ද බලවත් වරදක් වේ. එවැනි ක්‍රියාවල නිරත වූ බවට තහවුරු වන භික්ෂූන් සම්බන්ධයෙන් සංඝයා විසින් විනයානුකූල ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
සාමණේර සුභසාධන සහ	සාමණේරවරුන්ගේ සෞඛ්‍යය, අධ්‍යාපනය සහ යහපැවැත්ම නඟා සිටුවීම සහ අලජ්ජී භික්ෂූන්ගෙන් හෝ අශ්‍රද්ධාවන්ත ගිහියන්ගෙන්

ආරක්ෂණ මණ්ඩලය	සිදුවිය හැකි ලිංගික අපයෝජන, මත්ද්‍රව්‍යවලට යොමු කිරීම්, අමානුෂික දඬුවම් සහ අනෙකුත් අකටයුතුකම්වලින් ඔවුන් ආරක්ෂා කිරීම සඳහා උත්තරීතර සංඝ සභාව විසින් "සාමණේර සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලය" පිහිටුවිය යුතුය.
සාමණේර සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලයේ වගකීම	සාමණේර සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ සංඝ සංස්ථාවට අයත් සියලු සාමණේරවරුන්ගේ මූලික විනයානුකූල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, විශේෂයෙන් ඔවුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සුහසාධනය නඟා සිටුවීමටත් කැපවී ක්‍රියා කළ යුතුය.
සාමණේර ආරක්ෂණ ක්‍රියාපටිපාටිය	සාමණේර සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලය විසින් සාමණේරවරු වාසය කරන පිරිවෙන්, විහාරස්ථාන සහ අනෙකුත් ශාසනික ආයතන සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්, සාමණේරවරුන්ගේ ශාසනික ජීවිතය ආරක්ෂිත, සෞඛ්‍යසම්පන්න සහ විනයානුකූල පරිසරයක් තුළ දියුණු වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය. යම් පිරිවෙනක, විහාරස්ථානයක හෝ වෙනත් ස්ථානයක සාමණේරයෙකුට ලිංගික අපයෝජන, මත්ද්‍රව්‍යවලට යොමු කිරීම්, අමානුෂික දඬුවම් හෝ වෙනත් අකටයුතුකම් සිදු වන විට, අදාළ සාමණේරයා විසින් හෝ ඒ පිළිබඳව දැනගන්නා වෙනත් යම් පුද්ගලයෙකු විසින් ද ඒ බව දැනගත් විගස සාමණේර සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැක. එවැනි පැමිණිල්ලක් ලැබුණු විගස සාමණේර සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලය විසින් කිසිදු අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව මූලික පරීක්ෂණ සිදු කර තම වාර්තාව විනය විමර්ශන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. සාමණේරයාගේ ආරක්ෂාව හෝ විමර්ශනයේ සාධාරණභාවය සඳහා අවශ්‍ය යැයි සලකන්නේ නම්, විමර්ශනය අවසන් වන තෙක් සාමණේරයාව එම ස්ථානයෙන් තාවකාලිකව ඉවත් කිරීමට සාමණේර සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලයට බලය ඇත. විනය විමර්ශන මණ්ඩලය විසින් සාමණේර සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලයේ වාර්තාව සලකා බලා, විනයමය හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රමාණවත් තොරතුරු ඇති බවට සෑහීමකට පත් වන්නේ නම්, වගකිව යුතු භික්ෂූන් අදාළ සංඝාධිකරණය වෙත කඩිනමින් ඉදිරිපත් කළ යුතුය. සාමණේර සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලය සහ විනය විමර්ශන මණ්ඩලය විසින් සියලු අවස්ථාවල දී සාමණේරයාගේ ආරක්ෂාව, පෞද්ගලිකත්වය සහ ආත්ම ගෞරවය උපරිම ලෙස ආරක්ෂා වන අයුරින් කටයුතු කළ යුතුය. සාමණේරවරුන්ට සිදු වන අකටයුතුකම් පිළිබඳ පැමිණිලි ලැබුණු පසු පැමිණිලි බාර නොගැනීම සහ සාධාරණ හේතුවකින් තොරව කටයුතු

ප්‍රමාද කිරීම, මෙම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් ලෙස සැලකිය යුතුය.

වරද කරන සාමණේරයෙකු හික්මවීම

නොහික්මුණු සාමණේරවරුන් කරුණාවෙන් හික්මවා ආයති සංවරයෙහි පිහිටුවීම උපාධ්‍යායන් වහන්සේගේ සහ ආචාර්යයින් වහන්සේගේ යුතුකමකි. ඒ සඳහා අවශ්‍ය අවස්ථාවල දී විනයානුකූල හික්මවීම් සහ දඬුවම් ලබා දීමට විනයෙන් අවසර ඇත.

කෙසේ වුව ද, එවැනි දඬුවම් කිසිවිටෙකත් අමානුෂික නොවිය යුතු අතර, විනයෙන් හෝ ශ්‍රී ලංකාවේ නීතියෙන් වාරණය කර ඇති දඬුවම් කිසිවිටෙකත් ලබා නොදිය යුතුය.

විශේෂයෙන් ම, ශාරීරික හිංසනය, ලිංගික අපයෝජන, අමානුෂික හෝ අවමන්සහගත සැලකීම් සහ සාමණේරයාගේ සෞඛ්‍යයට හෝ ආත්ම ගෞරවයට හානි වන ආකාරයේ දඬුවම් සම්පූර්ණයෙන් ම තහනම් ය.

තව ද "**න, භික්ඛවෙ, සබ්බො සඞ්ඝාරාමො ආවරණං කාතබ්බො. යො කරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස**" යන ශික්ෂාපදයට අනුව පාරාජිකාවකට පත් නොවූ සාමණේරයෙකුට දඬුවමක් වශයෙන් විහාරස්ථානයේ වාසය කිරීම සම්පූර්ණයෙන් ම වාරණය කිරීම නොකළ යුතුය.

වරද කරන සාමණේරයෙකු නෙරපීම

සාමණේරයෙකු දශ නාසනාවන් අතුරින් එකකට පත් වූ විට, ඔහු සංවරයෙහි පිහිටා සිටීමට අකමැති නම් හෝ නැවත නැවතත් විනය විරෝධී හැසිරීම් ප්‍රදර්ශනය කිරීම හේතුවෙන් සංවරයෙහි පිහිටා සිටීමට නොහැකි අයෙකු බවට පෙනී යන්නේ නම්, උපාධ්‍යායන් වහන්සේට හෝ විහාරාධිපති ස්ථවිරයන්ට සුදුසු පරිදි ඔහු සිවුරු හරවා යැවිය හැක.

නෙරපනු ලබන සාමණේරයා බාලවයස්කරුවෙකු නම්, ඔහු දෙමාපියන්ට හෝ සුදුසු භාරකරුවෙකුට භාර දිය යුතුය. බාලවයස්කාර සාමණේරයෙකු දෙමාපියන්ට හෝ සුදුසු භාරකරුවෙකුට භාර නොදී විහාරස්ථානයෙන් පිටමං නොකළ යුතුය.

පාරාජිකා වූ භික්ෂූන්ගේ සාමණේර භූමිය

සූවිසි පාරාජිකා අතුරින් භික්ෂූන් සම්බන්ධ ඇතැම් පාරාජිකාවකට පත් වූ අයෙකුට නැවත සාමණේර භූමියෙහි පිහිටා ගුණධර්ම පූරණය කළ හැකි බවත්, උත්සාහයෙන් ප්‍රතිපත්ති පූරණය කළහොත් මාර්ග ඵල අධිගමනය කළ හැකි බවත් අග්ගික්ඛන්ධෝපම සූත්‍ර අටුවාවේ සඳහන් වේ.

එසේ වුව ද, පාරාජිකාවකට පත් වූ අයෙකු සම්බන්ධයෙන් නැවත එවැනි වැරදි සිදුවීමේ අවදානම සම්පූර්ණයෙන් බැහැර කළ නොහැකි බැවින්, එවැනි පුද්ගලයෙකු නැවත සාමණේර පැවිද්ද සඳහා භාර ගැනීමේ දී විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය.

එබැවින් "**සොධෙත්වා පබ්බාජෙතබ්බො**" යන විනය අටුවා පාඨයට අනුව, භික්ෂුවක් ලෙස පාරාජිකා වී නැවත සාමණේර භූමියෙහි පිහිටා සිටීමට අපේක්ෂා කරමින් විහාරස්ථානයකට පැමිණෙන

පුද්ගලයෙකු හොඳින් විමර්ශනය කිරීමෙන් අනතුරුව පමණක් ඔහුට පැවිද්ද ලබා දිය යුතු ද නැද්ද යන්න විහාරාධිපති ස්ථවිරයන් සහ විහාරස්ථානවාසී භික්ෂූන් විසින් තීරණය කළ යුතුය.

දාහතරවෙනි පරිච්ඡේදය:
සිල්මාතාවරු

සිල්මාතාවරු	ගිහි ගෙය අතහැර නෙක්ඛම්ම දශ ශීලය හෝ අෂ්ටාඞ්ග ශීලය සමාදන් වී කසාවත් දරන කාන්තා පැවිද්දෝ “සිල්මාතාවරු” ලෙස හැඳින්වෙති.
සිල්මාතාවරු පිළිබඳ භික්ෂූන්ගේ වගකීම	භික්ෂූන් විසින් විනයානුකූලව සිල්මාතාවරු සාමණේරී භූමියට හෝ භික්ෂුණීත්වයට පත් වීමට අපේක්ෂාවෙන් සිටින කාන්තා ආරම්කයන් ලෙස සැලකිය යුතුය. භික්ෂුණීන් රැක බලා ගැනීම පිණිස තථාගතයන් වහන්සේ සංවිධාන ශික්ෂාපදාදියෙහි භික්ෂූන්ට පවරා වදාළ වගකීම්වල මූලධර්ම අනුව යමින්, මියන්මාර් ආදි බෞද්ධ රටවල සිදු කරන්නාක් මෙන් සිල්මාතාවරුන්ට නිසි ආරක්ෂාව, රැකවරණය සහ සිව්පසයෙන් අනුග්‍රහය ලබා දීම භික්ෂූන් වහන්සේලාගේ වගකීමකි. භික්ෂුණීන් වහන්සේලාගේ ධර්ම ඥානය සහ ශීල, සමාධි සහ ප්‍රඥා ගුණ දියුණු කර ගැනීමට භික්ෂූන් වහන්සේලා නිතර උපකාර කළ යුතු බව විනයෙහි සඳහන් වේ. ඒ අනුව යමින්, සිල්මාතාවරුන්ගේ පර්‍යාප්ති සහ ප්‍රතිපත්ති ශාසනය දියුණු කිරීම සඳහා ද භික්ෂූන් වහන්සේලා විසින් අවශ්‍ය අනුග්‍රහය සහ මඟපෙන්වීම ලබා දිය යුතුය.
සිල්මාතාවරුන්ගේ අධ්‍යාපනය	සියලු සීලමාතාවරුන්ට ශාසනික වශයෙන් සුදුසු අධ්‍යාපනයක් ලැබීමට විනයානුකූල මූලික අයිතියක් ඇති බව මෙම ව්‍යවස්ථාවෙන් පිළිගනු ලැබේ. සීලමාතාවකගේ භික්ෂු ආචාර්‍යයන් වහන්සේලා සහ සිල්මාතා ආචාර්‍යයන් වහන්සේලා විසින් තම ශිෂ්‍ය සිල්මාතාවරුන්ට මූලික පිරිවෙන් අධ්‍යාපනය සහ අවශ්‍ය වුවහොත් උසස් පිරිවෙන් අධ්‍යාපනය ලබා දීමට බැඳී සිටියි.
සිල්මාතාවරුන්ගේ ආරක්ෂාව	සිල්මාතාවරුන් ලිංගික අපයෝජනයට ලක් කිරීම හා වෙනත් පිළිකුල් සහගත ක්‍රියාවලට යොමු කරවීම රටේ දණ්ඩ නීතිය යටතේ මෙන්ම තථාගත විනයට අනුව ද බලවත් වරදක් වේ. එවැනි ක්‍රියාවල නිරත වූ බවට තහවුරු වන භික්ෂූන් සහ සිල්මාතාවරුන් සම්බන්ධයෙන් සංඝයා විසින් විනයානුකූල ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
සීලමාතා සුභසාධන සහ ආරක්ෂණ මණ්ඩලය	සිල්මාතාවරුන්ගේ සෞඛ්‍යය, අධ්‍යාපනය සහ යහපැවැත්ම නඟා සිටුවීමත්, අලජ්ජී භික්ෂූන්ගෙන් සහ සිල්මාතාවරුන්ගෙන් හෝ අශ්‍රද්ධාවන්ත ගිහියන්ගෙන් සිදුවිය හැකි ලිංගික අපයෝජන, අමානුෂික දඬුවම් සහ අනෙකුත් අකටයුතුකම්වලින් ඔවුන් ආරක්ෂා කිරීමත් සඳහා උත්තරීතර සංඝ සභාව විසින් “සීලමාතා සුභසාධන සහ ආරක්ෂණ මණ්ඩලය” පිහිටුවිය යුතුය.

සීලමාතා සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධානියා	උත්තරීතර සංඝ සභාවේ තේරීම් කාරක සභාව විසින් ජ්‍යෝෂ්ඨ සංඝභාර නිත්ථාරක මහා ස්ථවිරයන්ගේ ද අදහස් ගෙන පැවිදි වී වස් විස්සක් සම්පූර්ණ කළ සිල්මාතාවන් අතර ගෞරවයට ප්‍රාප්ත වූ කායෘිශූර සිල්මාතාවක් සීලමාතා සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධානියා ලෙස තෝරා පත් කළ යුතුය.
සීලමාතා සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලයේ සාමාජිකාවෝ	සීලමාතා සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලයේ සියලු සාමාජිකාවෝ සිල්මාතාවරු විය යුතු ය. එහෙත් අවශ්‍ය අවස්ථාවල දී හෝ තම කාර්යභාරය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකන්නේ නම්, සීලමාතා සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලයට විනය විමර්ශන මණ්ඩලයේ සහාය ලබා ගත හැකි ය. එබඳු අවස්ථාවල දී අවශ්‍ය සහාය ලබා දීමට විනය විමර්ශන මණ්ඩලය මෙම උත්තරීතර සංඝ ව්‍යවස්ථාවෙන් බැඳී සිටින්නේ ය.
සීලමාතා සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලයේ වගකීම්	සීලමාතා සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ සියලු සිල්මාතාවරුන්ගේ මූලික විනයානුකූල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, විශේෂයෙන් ඔවුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සුහසාධනය නඟා සිටුවීමටත් කැපවී ක්‍රියා කළ යුතුය.
සීලමාතා ආරක්ෂණ ක්‍රියාපටිපාටිය	සීලමාතා සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලය විසින් සිල්මාතාවරු වාසය කරන පිරිවෙන්, විහාරස්ථාන සහ අනෙකුත් ශාසනික ආයතන සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්, සිල්මාතාවරුන්ගේ ශාසනික ජීවිතය ආරක්ෂිත, සෞඛ්‍යසම්පන්න සහ විනයානුකූල පරිසරයක් තුළ දියුණු වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය. යම් පිරිවෙනක, විහාරස්ථානයක හෝ වෙනත් ස්ථානයක සිල්මාතාවකට ලිංගික අපයෝජන, අමානුෂික දඬුවම් හෝ වෙනත් අකටයුතුකම් සිදු වන විට, අදාළ සිල්මාතාව විසින් හෝ ඒ පිළිබඳව දැනගන්නා වෙනත් යම් පුද්ගලයෙකු විසින් ද ඒ බව දැනගත් විගස සීලමාතා සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැක. එවැනි පැමිණිල්ලක් ලැබුණු විගස සීලමාතා සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලය විසින් කිසිදු අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව මූලික පරීක්ෂණ සිදු කර තම වාර්තාව විනය විමර්ශන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. සිල්මාතාවගේ ආරක්ෂාව හෝ විමර්ශනයේ සාධාරණභාවය සඳහා අවශ්‍ය යැයි සලකන්නේ නම්, විමර්ශනය අවසන් වන තෙක් සිල්මාතාව එම ස්ථානයෙන් තාවකාලිකව ඉවත් කිරීමට සීලමාතා සුහසාධන සහ ආරක්ෂණ මණ්ඩලයට බලය ඇත.

එසේ කිරීමට බාධා කෙරේ නම් ඒ සඳහා සීලමාතා සුභසාධන සහ ආරක්ෂණ මණ්ඩලය විසින් විනය විමර්ශන කමිටුවේ උපකාර ලබා ගත යුතුය.

විනය විමර්ශන මණ්ඩලය විසින් සීලමාතා සුභසාධන සහ ආරක්ෂණ මණ්ඩලයේ වාර්තාව සලකා බලා විනයමය හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රමාණවත් තොරතුරු ඇති බවට සෑහීමකට පත් වන්නේ නම්, වගකිව යුතු භික්ෂූන් සහ සිල්මාතාවරුන් අදාළ සංඝාධිකරණය වෙත කඩිනමින් ඉදිරිපත් කළ යුතුය.

සීලමාතා සුභසාධන සහ ආරක්ෂණ මණ්ඩලය සහ විනය විමර්ශන මණ්ඩලය විසින් සියලු අවස්ථාවල දී සිල්මාතාවන්ගේ ආරක්ෂාව, පෞද්ගලිකත්වය සහ ආත්ම ගෞරවය උපරිම ලෙස ආරක්ෂා වන අයුරින් කටයුතු කළ යුතුය.

සිල්මාතාවරුන්ට සිදු වන අකටයුතුකම් පිළිබඳ පැමිණිලි ලැබුණු පසු පමිණිලි බාර නොගැනීම සහ සාධාරණ හේතුවකින් තොරව කටයුතු ප්‍රමාද කිරීම, මෙම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් ලෙස සැලකිය යුතුය.

වරද කරන සිල්මාතාවක් හික්මවීම

නොහික්මුණු සිල්මාතාවන් කරුණාවෙන් හික්මවා ආයති සංවරයෙහි පිහිටුවීම උන්වහන්සේගේ ආචාර්යයන් වහන්සේලාගේ යුතුකමකි. ඒ සඳහා අවශ්‍ය අවස්ථාවල දී විනයානුකූල හික්මවීම් සහ දඬුවම් ලබා දීමට විනයෙන් අවසර ඇත.

කෙසේ වුව ද, එවැනි දඬුවම් කිසිවිටෙකත් අමානුෂික නොවිය යුතු අතර, විනයෙන් හෝ ශ්‍රී ලංකාවේ නීතියෙන් වාරණය කර ඇති දඬුවම් කිසිවිටෙකත් ලබා නොදිය යුතුය.

විශේෂයෙන් ම, ශාරීරික හිංසනය, ලිංගික අපයෝජන, අමානුෂික හෝ අවමන්සහගත සැලකීම් සහ සිල්මාතාවගේ සෞඛ්‍යයට හෝ ආත්ම ගෞරවයට හානි වන ආකාරයේ දඬුවම් සම්පූර්ණයෙන් ම තහනම් ය.

තව ද ශික්ෂාපද කඩන සහ නොහික්මුනු සිල්මාතාවක් දඬුවමක් වශයෙන් විහාරස්ථානයේ වාසය කිරීම සම්පූර්ණයෙන් ම වාරණය කිරීම නොකළ යුතුය.

වරද කරන හික්මීමට අකමැති සිල්මාතාවක් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය

සිල්මාතාවක් තමන් සමාදන් වී රකින ශික්ෂාපද නැවත නැවත කඩන විට, ඇය සංවරයෙහි පිහිටා සිටීමට අකමැති නම් හෝ නැවත නැවතත් විනය විරෝධී හැසිරීම් ප්‍රදර්ශනය කිරීම හේතුවෙන් සංවරයෙහි පිහිටා සිටීමට නොහැකි අයෙකු බවට පෙනී යන්නේ නම්, සිල්මාතාවගේ ආචාර්යයන් වහන්සේලා විසින් හෝ වෙනත් සිල්මාතාවරුන් විසින් හෝ භික්ෂුවක් විසින් හෝ ඒ පිළිබඳව විනය විමර්ශන කමිටුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැක.

විනය විමර්ශන කමිටුව විසින් ඒ පිළිබඳ මූලික විමර්ශනයක් සිදු කර, වැඩිදුර විභාගයක් අවශ්‍ය බවට සෑහීමකට පත් වන්නේ නම්, අදාළ

සිල්මාතාව වාසය කරන ප්‍රදේශයට අදාළ මූලික සංඝාධිකරණය වෙත ඇය ඉදිරිපත් කළ යුතුය.

අනතුරුව, අදාළ සිල්මාතාවට තම විත්තිය ඉදිරිපත් කිරීමට සාධාරණ අවස්ථාවක් ලබා දෙමින් අපක්ෂපාතී විභාගයක් පැවැත්විය යුතු අතර, විනය දඬුවම් පොතෙහි සඳහන් විධිවිධාන අනුව මූලික සංඝාධිකරණය විසින් සුදුසු තීරණයක් ගත යුතුය.

පසළොස්වෙනි පරිච්ඡේදය:
සාංඝික දේපළ සහ විහාරස්ථාන

සාංඝික දේපළ සහ විහාරස්ථාන සම්බන්ධ විධිවිධාන

සාංඝික දේපළ, විහාරස්ථාන සහ ඒවායේ පරිපාලනය සම්බන්ධ විධිවිධාන, නිකාය සහ පාර්ශ්වවල කාරක සභාවන් විසින් නම් කරනු ලබන නියෝජිතයන්ගෙන් සමන්විත මණ්ඩලයක් විසින්, බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා සමඟ සම්බන්ධීකරණයෙන් සම්පාදනය කර, උත්තරීතර සංඝ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

දහසයවෙනි පරිච්ඡේදය:
රජය සමඟ සම්බන්ධීකරණය

රජයේ නීතියට අනුගත වීම

ශ්‍රී ලංකාව තුළ සංඝ සංස්ථාව තථාගතයන් වහන්සේගේ ධර්මයට, විනයට සහ උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට අනුව පාලනය වුව ද, “**අනුජානාමි, භික්ඛවෙ, රාජූනං අනුවත්තිතුං**” යන බුද්ධ වචනයට අනුව රජවරුන් හෝ රජයන් විසින් පනවන ලද ධාර්මික නීතිවලට භික්ෂූන් විසින් අනුවර්තනය විය යුතුය.

ඒ අනුව, ශ්‍රී ලංකාව සියලු ශාසන සාමාජිකයන් විසින් තමන් අනුගමනය කරන ධර්මවිනයට අමතරව ශ්‍රී ලංකාවේ බලපවත්වන ධාර්මික නීතිවලට ද අනුගත විය යුතු අතර, ඔවුහු එම නීතිවලට ගරු කිරීමට සහ ඒවා රැකීමට ද බැඳී සිටිති.

රජය සමඟ සම්බන්ධීකරණය

මෙතෙක් කල් නිකාය සහ පාර්ශ්ව විසින් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව සමඟ පවත්වාගෙන පැමිණි සම්බන්ධීකරණ කටයුතු එලෙස ම ඉදිරියට ද පවත්වාගෙන යා යුතුය.

උත්තරීතර සංඝ ව්‍යවස්ථාව ස්ථාපිත කිරීමෙන් අනතුරුව පිහිටුවනු ලබන සියලු ශාසන අධිකාරී ආයතන විසින්, බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා ප්‍රධාන බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව සමඟ සමීප සහ ඵලදායී සම්බන්ධීකරණයක් පවත්වාගෙන යා යුතුය.

දාහත්වෙනි පරිච්ඡේදය:
ගිහි බෞද්ධයා, බෞද්ධකම සහ ගිහි බෞද්ධයාගේ යුතුකම්

ගිහි බෞද්ධයා

බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය පිළිගන්නා, බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ ධර්මයේ ස්වාක්ඛාත බව පිළිගන්නා, බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයාගේ සුප්‍රතිපන්න බව පිළිගනිමින් සහ සාංසාරික දුකින් මිදීම පිණිස බුද්ධ රත්නය, ධර්ම රත්නය සහ සංඝ රත්නය සරණ ගිය නමුත් ගෘහ බන්ධනය නොසිඳ, විවාහකව හෝ අවිවාහකව, කවර ජාතියකට, වර්ගයකට, භාෂාවකට අයත් වුව ද ගෘහ ජීවිතයක් ගත කරන ස්ත්‍රීහු සහ පුරුෂයෝ "ගිහි බෞද්ධයෝ" වෙති.

තථාගතයන් වහන්සේගේ සිව්වනක් පිරිස අතර පුරුෂ ගිහි බෞද්ධයෝ "උපාසකයෝ" ලෙස ද, කාන්තා ගිහි බෞද්ධයෝ "උපාසිකාවෝ" ලෙස ද හඳුන්වනු ලැබෙති.

බෞද්ධකම

බෞද්ධකම රඳා පවතින මූලික සහ එකම සාධකය ත්‍රිවිධ රත්නය සරණ යාමයි.

බෝධිරාජ කුමාර සූත්‍ර අටුවාව අනුව, බෞද්ධ දෙමාපියන්ට දාව උපත ලැබූ පමණින් පුද්ගලයෙකු බෞද්ධයෙකු නොවේ. බෞද්ධ දෙමාපියන්ට දාව උපන් නිසා හෝ වෙන යම් කරුණක් නිසා "මම බුද්ධ, ධර්ම සහ සංඝ යන ත්‍රිවිධ රත්නය සරණ ගිය අයෙක් වෙමි" යන අදහස හෝ ත්‍රිවිධ රත්නය සරණ යාමේ කැමැත්තෙන් "මම බුද්ධ, ධර්ම සහ සංඝ යන ත්‍රිවිධ රත්නය සරණ යමි" යන අදහස සිතෙහි උපදවා ගන්නා මොහොතේ සිට ඔහුට හෝ ඇයට සරණ පිහිටන අතර බෞද්ධයෙකු බවට පත් වේ.

බෞද්ධකම නැති වීම

බෞද්ධකම නැති වන්නේ සරණ නැති වීමෙනි. එය පහත සඳහන් ආකාර දෙකෙන් එකක් මඟින් සිදු වේ.

(1). දුකින් මිදීම පිණිස බුද්ධ, ධර්ම සහ සංඝ යන ත්‍රිවිධ රත්නය හැර වෙනත් දෙවියෙක්, බ්‍රහ්මයෙක්, මිනිසෙක් හෝ වෙනත් කවර හෝ සජීවී හෝ අජීවී වස්තුවක් සරණ යාම.

(2). පෘථග්ජන තත්ත්වයෙන් කාලක්‍රියා කිරීම.

ඉහත සඳහන් කරුණු දෙක හැර වෙනත් කිසිදු කරුණක් හේතුවෙන් බෞද්ධයෙකුගේ බෞද්ධකම නැති නොවේ.

පඤ්ච ශීලය කඩ කිරීමෙන්, රෝග හෝ විපත්තිවලින් ආරක්ෂාව පතා හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා ආශිර්වාද අපේක්ෂා කරමින් දෙවියන්ට පූජා කිරීමෙන් පමණක් බෞද්ධයෙකුගේ බෞද්ධකම නැති නොවේ.

බෞද්ධයාගේ යුතුකම්

ශ්‍රී ලංකාවේ ගිහි බෞද්ධයාගේ මූලික යුතුකම් පහත පරිදි වේ.

(i). බුද්ධ, ධර්ම සහ සංඝ යන ත්‍රිවිධ රත්නය තම උතුම් ම සරණ ලෙස පිළිගෙන, ඒ පිළිබඳ අත්‍යන්ත ගෞරවයෙන් යුතුව ජීවිතය ගත කිරීම.

(ii). තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය හැකි පමණ ඉගෙන ගෙන, ධර්මයට අනුව ගිහි ප්‍රතිපදාව අනුගමනය කිරීමට උත්සාහ කිරීම.

(iii). පඤ්ච ශීලය රක්ෂා කරමින් ආදර්ශවත් ජීවිතයක් ගත කිරීමට උත්සාහ කිරීම.

(iv). හැකි අවස්ථාවලදී පොහෝ දිනවල අෂ්ටාංග ශීලය සමාදන් වීම.

(v). මිච්ඡාජීවයෙන් වැළකී ධාර්මික දිවිපෙවෙතක් ගත කරමින් රට, සමාජය සහ බුද්ධ ශාසනය කෙරෙහි තම යුතුකම් ඉටු කිරීම.

(vi). තමන් තෝරාගත් ධාර්මික වෘත්තිය හෝ රැකියාව අවංකභාවයෙන් සහ හෘද සාක්ෂියට එකඟව ඉටු කිරීම.

(vii). බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය සඳහා තම ශක්ති ප්‍රමාණයෙන් දායක වීම.

(viii). භික්ෂූන් වහන්සේලා, සාමණේරවරුන් සහ සිල්මාතාවන් කෙරෙහි ගෞරවයෙන් කටයුතු කරමින් ඔවුන්ගේ ශාසනික කටයුතු සඳහා උපකාර කිරීම.

(ix). මතු පරපුරට බුද්ධ ශාසනය නම් උතුම් දායාදය ලබා දීම සඳහා බෞද්ධ විහාරස්ථාන, උරුමයන් සහ සංස්කෘතිය ආරක්ෂා කිරීම.

(x). ශාසනාභිවෘද්ධිය සඳහා කටයුතු කරන සෑම අවස්ථාවකදීම අනෙකුත් ආගම් සහ ජාතීන් සමඟ සංහිඳියාව සහ සහජීවනය ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීම.

පත්තනික්කුජ්ජන කර්මය

තථාගතයන් වහන්සේ විසින් පහත අඞ්ගයන් අතුරින් එකකින් හෝ යුක්ත ගිහි බෞද්ධයෙකුට "පත්තනික්කුජ්ජන කර්මය" කිරීමට භික්ෂූන්ට අනුදැන වදාළහ:

(1). භික්ෂූන්ට අලාභය පිණිස කටයුතු කිරීම,

(2). භික්ෂූන්ට අනර්ථය පිණිස කටයුතු කිරීම,

(3). භික්ෂූන්ට විහාරස්ථානවල වාසය කිරීමට බාධා වන පරිදි ක්‍රියා කිරීම,

(4). භික්ෂූන්ට ආක්‍රෝශ කිරීම, පරිභව කිරීම,

(5). භික්ෂූන් අතර භේදය ඇති කිරීම,

(6). බුදුන්ගේ නුගුණ කීම,

(7). ධර්මයේ නුගුණ කීම,

(8). සංඝයාගේ නුගුණ කීම.

යම් ගිහි බෞද්ධයෙකු ඉහත අඞ්ගයන්ගෙන් එකකින් හෝ යුක්ත බවට පැමිණිල්ලක් ලැබූ විට, විනය විමර්ශන කමිටුව විසින් ඒ පිළිබඳව විනයානුකූල හා අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කළ යුතුය. එම පරීක්ෂණයෙන් අදාළ පුද්ගලයා කියන ලද එක් අඞ්ගයකින් හෝ සමන්විත යැයි පෙනී යන විට, කමිටුව විසින් තම නිගමනය සහ මතය කාරක සංඝාධිකරණයට හේතු සහිතව ඉදිරිපත් කළ යුතුය.

අනතුරුව, කාරක සංඝාධිකරණයේ විනිශ්වයකාර ස්ථවිරවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විත මඩුල්ලක් විසින් අපක්ෂපාතී විමර්ශනයක් සිදු කර, එම පුද්ගලයාගේ ක්‍රියාවන් "පත්තනික්කුජ්ජන කර්‍මය" ට සුදුසු බවට තීරණය කරන්නේ නම්, විනය කාරක කමිටුවට එම කර්‍මය සිදු කරන ලෙස නියෝග කළ යුතුය. ඒ අනුව, විනය කාරක කමිටුව විසින් පත්තනික්කුජ්ජන කර්‍මය සිදු කළ යුතුය.

පත්තනික්කුජ්ජන කර්‍මය සිදු කළ පසු, එම ගිහි බෞද්ධයා සමඟ කිසිදු භික්ෂුවක් සම්භෝගය නොකළ යුතු අතර, ඔහුගෙන් දානය පිළිගැනීම ද නොකළ යුතුය.

මෙම කර්‍මය සිදු කළ බව සහ එයට අදාළව භික්ෂූන් වහන්සේලා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, කාරක සංඝාධිකරණය විසින් සියලු නිකාය හා පාර්ශ්වයන්ට අයත් විහාරස්ථාන වෙත නිල වශයෙන් දැනුම් දිය යුතුය.

කාරක සංඝාධිකරණයේ තීරණයට පටහැනිව ක්‍රියා කරමින්, එම ගිහි බෞද්ධයා සමඟ සම්භෝග කරන භික්ෂූන් වහන්සේලා, කාරක සංඝාධිකරණයට අගෞරව කිරීමක් සිදු කරන්නේ ය.

පත්තුක්කුජ්ජන කර්‍මය

පත්තනික්කුජ්ජන කර්‍මයට ලක් වූ ගිහි බෞද්ධයෙකු තම වරද නිවැරදි කරගෙන, සංඝයා වහන්සේ වෙත පැමිණ වන්දනා කර සමාව ඉල්ලා, එම කර්‍මය ඉවත් කර "පත්තුක්කුජ්ජන කර්‍මය" කරන ලෙස ආයාචනා කළ හොත්, සංඝයා විසින් එය කිරීමට තථාගතයන් වහන්සේ අනුදැන වදාළහ.

එවැනි අවස්ථාවක, අදාළ පුද්ගලයා යම් භික්ෂුවක් වෙත පැමිණ තම වරද නිවැරදි කරගෙන ඇති බවත්, තමන් පත්තුක්කුජ්ජන කර්‍මය බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කළහොත්, එම භික්ෂුව විසින් ඔහු විනය විමර්ශන කමිටුව ඉදිරියට ඉදිරිපත් කළ හැක.

අනතුරුව, විනය විමර්ශන කමිටුවේ ප්‍රධාන ස්ථවිරයන් ඇතුළු සාමාජිකයන් පහකට නොඅඩු මඩුල්ලක් ඉදිරියේ ද ඔහු විසින් සමාව ඉල්ලා, පත්තුක්කුජ්ජන කර්‍මය සඳහා ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය. කමිටුව විසින් ඒ බව කාරක සංඝාධිකරණයට දන්වා, අදාළ පුද්ගලයාගේ හැසිරීම පිළිබඳව පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

පසුව, විනිශ්චයකාර ස්ථවිරවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විත මඩුල්ලක් විසින් ඒ පිළිබඳව විමර්ශනය කර, පත්තනික්කුජ්ජන කර්මය ඉවත් කර පත්තුක්කුජ්ජන කර්මය කිරීමට සුදුසු බවට තීරණය කරන්නේ නම්, ඒ සඳහා විනය කාරක කමිටුවට නියෝග කළ යුතුය. ඒ අනුව, විනය කාරක කමිටුව විසින් පත්තුක්කුජ්ජන කර්මය සිදු කළ යුතුය.

මෙම කර්මය සිදු කළ බව සියලු නිකාය හා පාර්ශ්වයන්ට අයත් විහාරස්ථාන වෙත කාරක සංඝාධිකරණය විසින් දැනුම් දිය යුතුය.

පත්තුක්කුජ්ජන කර්මය සිදු කිරීමෙන් පසු, භික්ෂූන් වහන්සේලාට පෙර පරිදි එම ගිහි බෞද්ධයා සමඟ සම්භෝගයට හා ඔහුගෙන් දානය පිළිගැනීමට අවසර ලැබේ.

දහඅටවෙනි පරිච්ඡේදය:
ශාසන සංරක්ෂණ දායක සභාව සහ ශාසන සංවර්ධන අරමුදල

ශාසන සංරක්ෂණ දායක සභාව

“**සාගාරා අනගාරා ච – උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා**” යන බුද්ධ වචනයට අනුව ගිහි බෞද්ධයෝ සහ භික්ෂූහු ඔවුනොවුන්ට උපකාර කර ගනිමින් සහ ඔවුනොවුන් නිශ්‍රය කර ගනිමින් ශාසන ප්‍රතිපදාවෙහි නියලෙති.

ගිහි දායකයෝ ස්වර්ග, මෝක්ෂාභිලාෂයෙන් මෙන් ම ශාසන චිරස්ථිතිය පිණිස භික්ෂූන් වහන්සේලාට සිව්පසයෙන් අනුග්‍රහ කරති. භික්ෂූන් වහන්සේලා ද තමන්ට සිව්පසයෙන් අනුග්‍රහ කරන දායකයන්ට අනුකම්පාවෙන් ධර්මයෙන් අනුග්‍රහ කරති.

ඒ අනුව, උත්තරීතර සංඝ ව්‍යවස්ථාව මඟින් නිකාය සහ පාර්ශ්ව එක්සත් කරමින් පිහිටුවනු ලබන ශාසන අධිකාරි ආයතනවල කාර්යක්ෂම සහ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහාත්, ශ්‍රී ලංකාවේ ශාසන සාමාජිකයන්ට සිව්පසයෙන් අනුග්‍රහ කිරීම සඳහාත්, රටේ සම්භාවනීය ගිහි බෞද්ධයන්ගෙන් සමන්විත “ශාසන සංරක්ෂණ දායක සභාව” පිහිටුවනු ලැබේ.

ශාසන සංරක්ෂණ දායක සභාවේ සභාපති

ශ්‍රී ලංකා ශාසන සංරක්ෂණ දායක සභාවේ සභාපති ධුරය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් හෙබවිය හැක. එසේ නොමැති නම් අග්‍රාමාත්‍යවරයා විසින් එම ධුරය හෙබවිය හැක.

ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා එම ධුරය හෙබවීමට අපේක්ෂා නොකරන්නේ නම්, සියම්, අමරපුර සහ රාමඤ්ඤ මහා නිකායන්හි බොහෝ භික්ෂූන් වහන්සේලාගේ සම්භාවනාවට ප්‍රාප්ත වූ සම්භාවනීය ගිහි බෞද්ධයෙකු උත්තරීතර මහා නායක මණ්ඩලය විසින් එම ධුරයට පත් කළ යුතුය.

ශාසන සංරක්ෂණ දායක සභාවේ සභාපතිවරයාගේ ධුර කාලය වර්ෂ හතරක් විය යුතු අතර, එම ධුරය දැරූ අයෙකු තවත් එක් වරක් එම ධුරයට පත් වීමට සුදුසුකම් ලබයි.

සභාපති ධුරය දෙවරක් දරා තිබූ පුද්ගලයෙකු වුව ද, ශ්‍රී ලංකාවේ ජනාධිපති ධුරය හෝ අග්‍රාමාත්‍ය ධුරය දරන කාලය තුළ පමණක් ශාසන සංරක්ෂණ දායක සභාවේ සභාපති ධුරය දැරීමට සුදුසුකම් ලබයි. එහෙත්, ඒ හේතුව මත දැනට ධුරය දරන සභාපතිවරයෙකු ධුරයෙන් ඉවත් නොකළ යුතු ය. සභාපති ධුරය පුරප්පාඩු වන අවස්ථාවක දී, එම ධුරය භාර ගැනීමට කැමැත්ත පළ කරන්නේ නම්, පළමු ප්‍රමුඛතාව ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාටත්, ඉන් අනතුරුව අග්‍රාමාත්‍යවරයාටත් හිමි වන්නේ ය.

ශාසන සංරක්ෂණ දායක සභාවේ ක්‍රියාපටිපාටිය

ශාසන සංරක්ෂණ දායක සභාවේ සංයුතිය, සෙසු නිල, ක්‍රියාපටිපාටීන් සහ බලතල සම්බන්ධ විධිවිධාන බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

	විසින් ත්‍රෛනිකායික ලේඛකාධිකාරී මණ්ඩලය සමඟ සමීප සම්බන්ධීකරණයකින් සකස් කළ යුතුය. අනතුරුව එම විධිවිධාන ශ්‍රී ලංකා රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, අවශ්‍ය නම් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ද ඉදිරිපත් කළ හැක.
ශාසන සංවර්ධන අරමුදල	ශාසන සංරක්ෂණ දායක සභාව යටතේ "ශාසන සංවර්ධන අරමුදල" නමින් අරමුදලක් වන්නේ ය. ශාසන සංවර්ධන අරමුදල පවත්වාගෙන යාමේ අරමුණ වන්නේ ශාසන අධිකාරි ආයතන කාර්යක්ෂමව සහ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍යමය සහාය සැපයීමත්, ශාසන අරමුදල් මණ්ඩලය හරහා ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලාට, සාමණේරවරුන්ට සහ සිල්මාතාවරුන්ට සිව්පසයෙන් අනුග්‍රහ කිරීමත් ය.
විගණනය	ශාසන සංවර්ධන අරමුදලේ ගිණුම් වාර්ෂිකව ශ්‍රී ලංකා රජයේ විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් විය යුතුය.

දහනවවෙනි පරිච්ඡේදය: ව්‍යවස්ථා සංශෝධන

උත්තරීතර සංඝ ව්‍යවස්ථාව සංශෝධනය

උත්තරීතර සංඝ ව්‍යවස්ථා මූලධර්ම පරිච්ඡේදයේ සියලු වගන්ති සහ බුද්ධානුබුද්ධක ශික්ෂාපද සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමූහනය කිරීම සම්බන්ධ වගන්තිය හැර, උත්තරීතර සංඝ ව්‍යවස්ථාවේ අනෙකුත් වගන්ති සංශෝධනය කිරීමට, ඉවත් කිරීමට හෝ නව වගන්ති ඇතුළත් කිරීමට පහත සඳහන් අනුමැතීන් ලැබිය යුතුය:

(1). මහා සංඝ සභාවේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට (2/3) නොඅඩු බහුතරයක අනුමැතිය,

(2). ස්ථවිර සභාවේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට (2/3) නොඅඩු බහුතරයක අනුමැතිය,

(3). සියම්, අමරපුර සහ රාමඤ්ඤ යන එක් එක් නිකාය නියෝජනය කරන සාමාජිකයන්ගේ වෙන වෙන ම සරළ බහුතර අනුමැතිය.

උත්තරීතර සංඝ ව්‍යවස්ථා මූලධර්ම පරිච්ඡේදයේ සියලු වගන්ති, බුද්ධානුබුද්ධක ශික්ෂාපද සමූහනය පිළිබඳ වගන්තිය සංශෝධනය කිරීම සහ නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම

උත්තරීතර සංඝ ව්‍යවස්ථා මූලධර්ම පරිච්ඡේදයේ කවර හෝ වගන්තියක්, බුද්ධානුබුද්ධක ශික්ෂාපද සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමූහනය කිරීම සම්බන්ධ වගන්තිය සංශෝධනය කිරීම හෝ උත්තරීතර සංඝ ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම සඳහා, පහත සඳහන් අනුමැතීන් ලැබිය යුතුය:

(1). මහා සංඝ සභාවේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට (2/3) නොඅඩු බහුතරයක අනුමැතිය,

(2). ස්ථවිර සභාවේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට (2/3) නොඅඩු බහුතරයක අනුමැතිය,

(3). සියම්, අමරපුර සහ රාමඤ්ඤ යන එක් එක් නිකාය නියෝජනය කරන සාමාජිකයන්ගේ වෙන වෙන ම සරළ බහුතර අනුමැතිය,

(4). සියලු පාර්ශ්වයන්ගේ කාරක සභාවන් අතුරින් හතරෙන් තුනකට (2/3) නොඅඩු බහුතර අනුමැතිය,

(5). සංසමත විචාරණයේ සරළ බහුතර අනුමැතිය: උත්තරීතර සංඝ ව්‍යවස්ථාව යටතේ එක්සත් වී ඇති සියලු නිකාය සහ පාර්ශ්වයන්ට අයත්, නිස්සයමුත්තක උපාධිය සමත් වූ භික්ෂූන් වහන්සේලාගෙන් ඡන්දය ප්‍රකාශ කරන භික්ෂූන් වහන්සේලාගේ සරළ බහුතර අනුමැතිය.

විසිවෙනි පරිච්ඡේදය:
විවිධ විධිවිධාන

සංක්‍රාන්ති විධිවිධාන	මෙම ව්‍යවස්ථාවේ භික්ෂූන් වහන්සේලාගේ සහ සිල්මාතාවන්ගේ අධ්‍යාපනික හා ශාසනික සුදුසුකම් සම්බන්ධයෙන් දක්වා ඇති විධිවිධාන, මෙම ව්‍යවස්ථාව බලාත්මක වූ දිනයෙන් පසු උපසම්පදාව ලබන භික්ෂූන් වහන්සේලාට සහ පැවිදි වන සිල්මාතාවන්ට පමණක් අදාළ වන අතර, ඊට පෙර උපසම්පදාව ලැබූ භික්ෂූන් වහන්සේලාට සහ පැවිදි වූ සිල්මාතාවන්ට එම විධිවිධාන අදාළ නොවන්නේ ය.
සංසමත විචාරණය	මහා නායක මණ්ඩලයේ සියම්, අමරපුර සහ රාමඤ්ඤ යන එක් එක් නිකාය නියෝජනය කරන මහා නායක ස්ථවිරයන් වහන්සේලාගේ වෙන වෙන ම සරළ බහුතරයකට, ශ්‍රී ලංකාව තුළ එක්සත් සංඝ සංස්ථාවට අයත් සියලු උපසම්පන්න භික්ෂූන් වහන්සේලාගේ මතය විමසා බලා යම් ශාසනික කටයුත්තක් තීරණය කිරීම අවශ්‍ය යැයි හැඟී යන්නේ නම්, ඔවුන්ගේ අත්සනින් යුතු ප්‍රකාශනයක් මඟින් සංසමත විචාරණයක් කැඳවිය හැක්කේ ය. සංසමත විචාරණයක් පැවැත්වීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් ශ්‍රී ලංකා රජයේ පරිපාලන සහාය ලබා ගත යුත්තේ ය.
සංසමත විචාරණයක දී ඡන්ද බලය	සංසමත විචාරණයක දී ඡන්ද බලය හිමි වන්නේ වස් පහක් සම්පූර්ණ වූ උපසම්පන්න භික්ෂූන්ට පමණි. මෙම ව්‍යවස්ථාව බලාත්මක වූ දිනයෙන් පසුව උපසම්පදා වන භික්ෂූන්ට නම් නිස්සයමුත්තක උපාධිය සමත් වූ වස් පහ සම්පූර්ණ වූ භික්ෂූන් වහන්සේලාට පමණි.
පූර්ව පත්වීම්වල වලංගුභාවය	මෙම ව්‍යවස්ථාව බලාත්මක වීමට පෙර ධර්මවිනයට පටහැනි නොවන අයුරින් සිදු කරන ලද පත්වීම්, තීරණ, විනය කර්ම, කතිකා, සම්මුති සහ වෙනත් ශාසනික කටයුතු, මෙම ව්‍යවස්ථාවෙන් වෙනත් ආකාරයකට විධිවිධාන සලසා නොමැති නම්, වලංගු ලෙස සලකනු ලැබේ.
ව්‍යවස්ථාවේ අර්ථකථන සම්බන්ධ විධිවිධාන	මෙම ව්‍යවස්ථාවේ යම් විධිවිධානයක් සම්බන්ධයෙන් අර්ථකථන ගැටලුවක් මතු වන්නේ නම්, ඒ පිළිබඳ අවසානාත්මක අර්ථකථනය ලබා දීමේ බලය උත්තරීතර සංඝ සභාව සතු වන්නේ ය.
ව්‍යවස්ථාවේ හිඩැස් පිරවීමේ බලය	මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීම අවශ්‍ය වන්නේ නම්, ධර්මවිනයට හා මෙම ව්‍යවස්ථාවේ මූලධර්මවලට පටහැනි නොවන අයුරින්, උත්තරීතර සංඝ සභාවට ඒ පිළිබඳ අවශ්‍ය කතිකා හෝ තීරණ සම්මත කිරීමට බලය ඇත.

විසිඑක්වෙනි පරිච්ඡේදය:
ව්‍යවස්ථාව බලාත්මක වීම

ව්‍යවස්ථාව බලාත්මක වන දිනය	ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව පිළිගනිමින් එක්සත් සංඝ සංස්ථාවක් ස්ථාපනය කිරීමට එකඟතාව පළ කළ නිකාය සහ පාර්ශ්වවල වස් පහ සම්පූර්ණ වූ උපසම්පන්න භික්ෂූන් වහන්සේලා අතුරින් ඡන්දය ප්‍රකාශ කරන භික්ෂූන් වහන්සේලාගේ සරළ බහුතර අනුමැතිය සංසමත විචාරණයක දී මෙම ව්‍යවස්ථාවට ලැබීමෙන් අනතුරුව, එම නිකාය සහ පාර්ශ්වවල මහානායක ස්ථවිරයන් වහන්සේලා එක් ස්ථානයක රැස් වී ඒකාබද්ධ ප්‍රකාශනයක් මඟින් නියම කරනු ලබන දිනයේ, එනම් අදාළ වර්ෂයේ බක්පුර පසළොස්වක පොහෝ දින සිට ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් බලාත්මක වන්නේ ය.
සංසමත විචාරණය පැවැත්වීම	ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාව පිළිබඳ සංසමත විචාරණය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තියෙන් රජයට පවරා ඇති "බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීමේ" වගකීමට අනුකූලව, ශ්‍රී ලංකා රජය විසින් අපක්ෂපාතීව, සාධාරණව සහ විනිවිදභාවයෙන් පැවැත්වීමට අවශ්‍ය විධිවිධාන සැලසිය යුතු ය.

පළමු උපලේඛනය

ප්‍රතිඥාව

.... ලෙස මෙම ධුරයට පත්වන .... වන මම, ත්‍රිවිධ රත්නය සරණ කොට, තථාගතයන් වහන්සේ විසින් දේශනා කොට පණවා වදාළ ධර්මවිනයට ද, ශ්‍රී ලංකාවේ එක්සත් මහා සංඝයා වහන්සේ විසින් සම්මත කරන ලද ශ්‍රී ලංකා උත්තරීතර සංඝ ව්‍යවස්ථාවට ද ගරු කරමින්, ඒවාට පටහැනි නොවන අයුරින් මා වෙත පැවරී ඇති බලතල නිසි අයුරින් ක්‍රියාත්මක කර, කාර්යභාරයන් විශ්වාසවන්තව ඉටු කරන බවට ද, කිසිදු නිකායක්, පාර්ශ්වයක් හෝ පුද්ගලයෙකු සම්බන්ධයෙන් අගතිගාමී නොවී, අපක්ෂපාතීව, සාධාරණව සහ විනිවිදභාවයෙන් කටයුතු කරන බවට ද, බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ස්ථාවරත්වය, දියුණුව සහ ව්‍යාප්තිය පිණිස ද, සංඝ සාමග්‍රිය, විනයානුකූලභාවය සහ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම පිණිස ද, කටයුතු කරන බවට ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි.

දෙවෙනි උපලේඛනය

බෞද්ධ කොඩිය

තුන්වෙනි උපලේඛනය

ධර්මචක්‍රය